වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு

**Ministry of Plantation and Community Infrastructure**



# කාර්යසාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

# 2025







# කාර්යසාධන වාර්තාව 2025

## වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

11 වන මහල, සෙත්සිරිපාය, දෙවන අදියර, බත්තරමුල්ල
දුරකථනය : 011-2186160
ෆැක්ස් : 011-2186076
වෙබ් අඩවිය - http://www.plantationindustries.gov.lk

සැලසුම් අංශය
දුරකථනය : 011- 2187070 (අධ්‍යක්ෂ ජනරාල්)
ෆැක්ස් : 011 - 2187075
විද්‍යුත් තැපැල් ලිපිනය : mpiplanningdiv@gmail.com



ගරු සමන්ත විද්‍යාරත්න මැතිතුමා
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය



ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මැතිතුමා
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍ය



ගුණදාස සමරසිංහ මහතා
ලේකම්
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# අන්තර්ගතය


01 පරිච්ඡේදය — ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

02 පරිච්ඡේදය — ප්‍රගතිය හා ඉදිරි දැක්ම

03 පරිච්ඡේදය — 2025 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

04 පරිච්ඡේදය — කාර්යසාධන දර්ශක

05 පරිච්ඡේදය — තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

06 පරිච්ඡේදය — මානව සම්පත් පැතිකඩ

07 පරිච්ඡේදය — අනුකූලතා වාර්තාව

# 01. පරිච්ඡේදය

## 1. ආයතනික පැතිකඩ

### 1.1 හැඳින්වීම

"පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" යන ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තියට අනුකූල වෙමින් ක්ෂේත්‍රයේ සමස්ත ඵලදායීතාවය ඉහළ නැංවීම, වැවිලි නිෂ්පාදන පාදක කරගත් අපනයන ආදායම ඉහළ නැංවීම හා වැවිලි ප්‍රජාව ඇතුළු අගයදාමයේ සියලු පාර්ශ්වකරුවන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම යන මූලික අරමුණු ඉටුකිරීමට 2025 වර්ෂයේන් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් කරන ලදී.

2024 නොවැම්බර් 25 දිනැති හා අංක 2412/08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අමාත්‍යාංශ විෂය පථයන් හා කාර්යභාරයන් ප්‍රකාශයට පත් කෙරිනි. එමඟින් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය ලෙස මෙම අමාත්‍යාංශයේ විෂයයන් හා කාර්යභාරය හඳුනාගෙන ඒකාබද්ධ කර කාර්යයන් පවරා ඇත. එමගින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මෙම අමාත්‍යාංශයේ විෂය පථයෙන් ඉවත් වූ අතර, රාජ්‍ය වැවිලි සමාගම් අමාත්‍යාංශය වෙත පැවරිනි. නැවතත් 2025 ඔක්තෝම්බර් 18 දිනැති හා අංක 2458/65 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම අමාත්‍යාංශය යටතේ පැවති කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පැවරිනි. මෙම සියළු සංශෝධනයන් ද සැලකිල්ලට ගනිමින් අමාත්‍යාංශයේ  කාර්යභාරයන් පෙර වර්ෂවල මෙන්ම 2025 වර්ෂයේදී ත් ඉටුකිරීමට කටයුතු කරන ලදී.

තිරසර වැවිලි ආර්ථිකයක් - පොහොසත් රටක් යන අමාත්‍යාංශයේ දැක්මට අනුගතවීමට පවතින අභියෝග ජයගනිමින් අපනයන ඉලක්ක ළඟා කර ගැනීම වෙනුවෙන් වැවිලි භෝග ප්‍රවර්ධනය කිරීම හා අගය එකතු කළ නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගනිමින් අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන මඟින් තේ, පොල්, රබර්, තල්, කිතුල් සහ කජු යන භෝගවල කාර්යයසාධනය ඉහළ නැංවීම සඳහා මෙන්ම වැවිලි ප්‍රජාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් ද අවශ්‍ය අවස්ථාවල ප්‍රතිපත්තිමය තීරණයන් ලබාදෙමින් විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

විශේෂයෙන්ම සමස්ත වැවිලි ප්‍රජාව මුහුණ දෙන සමාජ විෂමතාවන් ක්‍රමයෙන් අඩු කරමින් පහසුකම් භුක්ති විඳින සෞභාග්‍යමත් වැවිලි ප්‍රජාවක් බිහි කිරීමේ අරමුණ පෙරදැරිව ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟාසිටුවමින් වාසස්ථාන පිළිබඳ ගැටලු, මූලික යටිතල පහසුකම් පිළිබඳ ගැටලු, අඩු අදායම් තත්ත්ව සහ සෞඛ්‍ය හා පෝෂණ ගැටලු අවම කිරීම සඳහා සක්‍රීය ලෙස දායක වෙමින් ඔවුන්ගේ පූර්ව ළමා සංවර්ධනය හා සම්බන්ධ කටයුතු, සමාජ, ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම සිදුකරන ලදී.

තවද පර්යේෂණ කටයුතු තවදුරටත් පුළුල් කරමින් වැවිලි භෝගවල ඵලදාව වැඩිකර ගැනීමේ ක්‍රමවේද හඳුන්වාදීම, සම්ප්‍රදායික ප්‍රදේශ වලින් බැහැරව වැවිලි බෝග ව්‍යාප්ත කිරීම, සත්ත්ව හානි  හා රෝග මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, විද්‍යාගාර පහසුකම් වැඩි කිරීම, නව තාක්ෂණික මෙවලම් භාවිතය හා ප්‍රශස්ථ භූමි උපයෝජනය හරහා නිෂ්පාදනය වැඩි කිරීමට පියවර ගන්නා ලදී. එයට අමතරව අගය එකතුකිරීම හා විවිධාංගීකරණය තුළින් දේශීය හා විදේශීය වෙළඳපොළ ආකර්ෂණය කරගැනීම, වැවිලි ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම සඳහා එම ප්‍රදේශවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා වැවිලි ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනයට අවශ්‍ය වන ප්‍රතිපත්ති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වශයෙන් සිදුකරන ලදී.

ඒ අනුව, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් අනුබද්ධ ආයතන සඳහා නිසි මඟ පෙන්වීම් ලබා දෙමින් වැවිලි ක්ෂේත්‍රයේ සියළුම පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කරමින් 2025 වර්ෂයේ ද අත්කරගත් කාර්යසාධනය මෙම වාර්තාව මඟින් ඉදිරිපත්කර ඇත.

## 1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

" තිරසර වැවිලි ආර්ථිකයක් - පොහොසත් රටක් "

### මෙහෙවර

" වැවිලි කර්මාන්තයේ තිරසරභාවය, ප්‍රවර්ධනය හා නව්‍යකරණය තුළින් අපනයන ආර්ථිකය ඉහළ නැංවීම හා වැවිලි ප්‍රජාවගේ සමාජයීය හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම "

### විෂය පථය

පර්යේෂණාත්මක විධි ක්‍රමයන්, නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ත භූමි උපයෝජනය හරහා ගුණාත්මක නිෂ්පාදන, අගය එකතු කිරීම හා විවිධාංගීකරණය තුළින් දේශීය හා විදේශීය වෙළඳපොළ ආකර්ෂණය කරගැනීම, වැවිලි ප්‍රජාවගේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා ඔවුන්ගේ සමාජ - ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම ඉලක්ක කරගනිමින් සමස්ත වැවිලි ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනය උදෙසා අදාළ සියලු පාර්ශ්වකරුවන් සමඟ එක්ව ක්‍රියාකරමින් ඊට අවශ්‍ය වන ප්‍රතිපත්ති හඳුනාගැනීම, ක්‍රියාත්මක කරවීම, මෙහෙයවීම සහ පසු විපරම් කිරීම.

### අරමුණු

- වැවිලි ක්ෂේත්‍රයේ සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීම
- වැවිලි නිෂ්පාදන පාදක කරගත් අපනයන ආදායම ඉහළ නැංවීම
- වැවිලි ප්‍රජාව ඇතුළු අගයදාමයේ සියලු පාර්ශ්වකරුවන්ගේ සමාජ - ආර්ථික තත්වය ඉහළ නැංවීම

## 1.3 ප්‍රධාන කාර්යයන්

**වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 25 දිනැති අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව කාර්යයන්**


- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් විෂයයට සහ එම ගැසට් පත්‍රය මගින් දක්වා ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂයය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායීතාව සඳහා තරඟකාරීත්වය ඉහළ නැංවීම.
- ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කරගත් වැවිලි භෝග මත පදනම් වූ අගය එකතු කළ නිෂ්පාදන සම්බන්ධ කර්මාන්ත නඟා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- තේ හා රබර් කර්මාන්ත සංවර්ධන, ප්‍රවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු.
- තේ, රබර් හා පොල් වතු කැබැලි කර ජනවාස ඉදිකිරීම උපරිම වශයෙන් සීමා කිරීම.
- වැවිලි භෝග කර්මාන්ත සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම වැඩි කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණ රබර් වතු හිමියන් දිරිගැන්වීම තුළින් රබර් නිෂ්පාදන කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සුලබ කිරීම.
- තේ හා රබර් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම.
- ග්‍රාමීය තේ වගාව ප්‍රවර්ධනය හා කුඩා තේ වතු හිමියන් දිරිගැන්වීම.
- තේ අපනයනය සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම සහයෝගීත්වයෙන් ශ්‍රී ලංකා තේ (Ceylon Tea) සඳහා ජාත්‍යන්තර තේ වෙළඳපොළ පුළුල් කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික වැවිලි සමාගම් සතු ඉඩම් ද ඇතුළත් ආශ්‍රිත භෝග වගා කටයුතු වර්ධනය කිරීම.
- දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගත් රබර් ආශ්‍රිත නිෂ්පාදන දිරිගැන්වීම.
- වතු අංශයේ ඉඩම් ක්‍රමවත් උපයෝජනය සඳහා සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.
- තේ, රබර් හා පොල් වතු කැබලි කිරීම සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය කිරීම.
- කුඩා වැවිලි භෝග වගාකරුවන් දිරිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- පර්යේෂණ ආයතනයන් හා ඒකාබද්ධ වැඩි අස්වනු සහිත ප්‍රභේද ගොවියන් වෙත හඳුන්වා දීමට ක්‍රියා කිරීම.
- නවීන තාක්ෂණය භාවිතා කරමින් දේශීය නිෂ්පාදනවල අගය එකතු කිරීම තුළින්, ඉහළ වටිනාකමකින් යුත් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා අපනයන වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම.
- සුළු වැවිලි භෝග කර්මාන්ත සුරක්ෂිතභාවය ඇති කරමින් කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයින් ගෝලීය ආර්ථික වෙත යොමු කිරීම සඳහා පියවර ගැනීම.

- කුඩා වැවිලි බෝග වගා කටයුතු සඳහා ගුණාත්මකභාවෙන් යුත් බීජ හා පැළ ලබාදීම සහ අවශ්‍ය සානුබල සහ අනෙකුත් පහසුකම් සැලසීම.
- අගය එකතු කළ නිෂ්පාදනය ද ඇතුලුව තිරසර සම්පත් භාවිතය සහ ජෛව ආරක්ෂණය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- කුඩා වැවිලි භෝග සඳහා අපනයන ගම්මාන පිහිටුවීම.
- පොල්, කිතුල් හා තල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ ඊට අදාළ පර්යේෂණයන්ට අදාළ කටයුතු.
- දේශිය පොල් ඉල්ලුම සපුරාලීමටත් පොල්, තැඹිලි හා කුරුම්බා ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන අපනයනය සඳහාත් ක්‍රමෝපායන් සැකසීම.
- බහුබෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමඟින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම.
- භූගෝලීය සාධක ද සැලකිල්ලට ගෙන අධි ඵලදාවක් සහිත පැළ ප්‍රභේද හඳුන්වාදීම.
- දේශිය හා විදේශිය වෙළඳපොළ ඉලක්ක කරගනිමින්, නව තාක්ෂණය ද මුසු වූ අගය එකතු කළ පොල්, තල්, කිතුල් ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධන කිරීම.
- වැවිලි ක්ෂේත්‍රය/ මලයාලම් සඳහා නිවාස, ජලය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම පිණිස මූල්‍ය සහාය සහ යටිතල පහසුකම් සැපයීම.
- වැවිලි ප්‍රජාවට ස්ථිර නිවාස ඉදි කිරීම සඳහා ඉඩම් ලබාදීම.
- වතු ආශ්‍රිත ප්‍රදේශයන් හි දැරිය හැකි ආකාරයේ නිවාස යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම.
- වතු අංශයේ ප්‍රජාව ආර්ථික, සමාජයීය හා සංස්කෘතිකමය වශයෙන් සවිබලගැන්වීම සඳහා මූලික පහසුකම්, ජිවනෝපාය උත්පාදන සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ඇතුළු අනෙකුත් අවශ්‍යතා සැපයීමට අවශ්‍ය පියවර ගැනීම.
- ග්‍රාමීය වතු අංශයන්හි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- වතු ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන "ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන" පිහිටුවීම.
- වතු ප්‍රජාවගේ දරුවන් සඳහා ප්‍රාථමික අධ්‍යාපන හා සෞඛ්‍යය පහසුකම් තහවුරු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

## 1.4 සංවිධාන සටහන


**<u>වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය</u>**

**<u>වැවිලි අංශය</u>**




➢ අනුමත කාර්ය මණ්ඩලය සඳහා දෙපාර්තමේන්තුගත MN 1, කළමනාකරණ සහකාර තනතුරු 04ක් පවතින අතර එම නිලධාරීන් පාලන, ගිණුම් සහ පොල් හා ආශ්‍රිත බෝග යන අංශවලට අනුයුක්තව සේවය කරයි.

## 1.4.1 සංවිධාන සටහන (ප්‍රජා යටිතල පහසුකම් අංශය)



## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ

### 1.5.1 වැවිලි අංශය

- අමාත්‍ය කාර්යාලය
- ලේකම් කාර්යාලය
- පාලන අංශය
- සැළසුම් අංශය
- ගිණුම් අංශය
- සංවර්ධන අංශය
  - I. තේ සහ ප්‍රතිපත්ති අංශය
  - II. පොල් හා ආශ්‍රිත භෝග සංවර්ධන අංශය
  - III. රබර් සංවර්ධන අංශය
- රාජ්‍ය වැවිලි ව්‍යවසාය හා නවීකරණ අංශය
- අභ්‍යන්තර විගණන අංශය

### 1.5.2 ප්‍රජා යටිතල පහසුකම් අංශය

- පාලන අංශය
- සංවර්ධන අංශය
- සැළසුම් අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ඉංජිනේරු අංශය

## 1.6 අමාත්‍යාංශයට පැවරුණු රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

වර්ෂ 2024 නොවැම්බර් මස 25 දිනැති අංක 2412/08 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අමාත්‍යාංශයට පැවරුණු රාජ්‍ය දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

1. ශ්‍රී ලංකා තේ මණ්ඩලය
2. තේ පර්යේෂණ ආයතනය
3. තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය
4. ජනතා වතු සංවර්ධන මණ්ඩලය
5. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
6. තේ ශක්ති අරමුදල
7. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
8. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
9. සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව
10. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම
11. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
12. රබර් පර්යේෂණ ආයතනය
13. ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව
14. තුරුසවිය අරමුදල
15. ශ්‍රී ලංකා කජු සංස්ථාව
16. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය
17. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
18. සීමාසහිත හලාවත වැවිලි සමාගම
19. පොල් වගාකිරීමේ මණ්ඩලය
20. පොල් සංවර්ධන අධිකාරිය
21. පොල් පර්යේෂණ ආයතනය
22. තල් සංවර්ධන මණ්ඩලය
23. කිතුල් සංවර්ධන මණ්ඩලය
24. කප්රුක අරමුදල
25. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව *
26. සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම
27. වැවිලි මානව සංවර්ධන භාරය
28. වැවිලි කලාප සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය
29. වතු අංශයේ ස්වං රැකියා වක්‍රීය අරමුදල

* 2025 ඔක්තෝබර් මස 18 දිනැති අංක 2458/65 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පවරා ඇත.

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති තොරතුරු

### 1.7.1 ඉන්දියානු ආධාර යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතිය

අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ පළමු අදියර හා දෙවන අදියර යටතේ නිවාස ඒකක 4,000 ක් ඉදිකිරීමට 2016.01.08 දිනැති කැබිනට් අනුමැතිය මත ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමඟ 2016.04.01 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර, මෙම ව්‍යාපෘතියේ පළමු අදියර හා දෙවන අදියර ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලයේ සෘජු අධීක්ෂණය යටතේ ඔවුන් විසින් තෝරාගත් ආයතන හතරක් මඟින් සිදු කරනු ලබයි. මෙහි තෙවන අදියර යටතේ නිවාස ඒකක 10,000 ක් ක්‍රියාත්මක කරනු ලබයි.

එක් නිවසක වටිනාකම රුපියල් මිලියනයක් ලෙසට ඇස්තමේන්තු ගත කර ඇති මෙම ව්‍යාපෘතියෙහි අදියර I සහ අදියර II සඳහා, නිවසක් වෙනුවෙන් ඉන්දියානු රජය විසින් රු: 2,800,000/= ක්ද, අදාල වැවිලි සමාගම විසින් රු: 75,000/= ක් හා ප්‍රතිලාභියා විසින් රු: 20,000/= ක ශ්‍රම දායකත්වයක් සපයනු ලබයි. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පානීය ජල පහසුකම්, විදුලිය, ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ප්‍රථම අදියරේ දී එක් නිවාස ඒකකයකට රු: 120,000/= ක් හා එහි දෙවන අදියරේ දී නිවසකට රු: 400,000/= ක් වන ලෙසට ශ්‍රී ලංකා රජය මඟින් ප්‍රතිපාදන සපයනු ලැබේ.

III වන අදියර යටතේ ඉන්දීය රජය විසින් නව නිවාස 10,000 ක් වැවිලි ප්‍රජාව වෙත ලබා දීමට එකඟ වී ඇත. එයට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය 2018.08.16 දින ලැබී ඇති අතර, ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමඟ 2018.08.12 දින ඊට අදාල එකඟතා ගිවිසුම අත්සන් ලදී. ඒ අනුව, බදුල්ල, හැටන්, නුවරඑළිය, නුවර, කෑගල්ල, රත්නපුර සහ ගාල්ල යන වතු කලාප හතේම වතු ප්‍රජාව සඳහා අදියර තුනකින් යුක්තව නිවාස ඒකක 10,000 ක් ප්‍රතිලාභීන්ගේ මුලිකත්වයෙන් හා වතු සේවක සමුපකාර සමිති හරහා ඉදිකිරීමට සැළසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා යටිතල පහසුකම් සැපයීම ශ්‍රී ලංකා රජයේ ආධාර මඟින් සිදු කරනු ලබයි.

**2025.12.31 දිනට ව්‍යාපෘතියෙහි ප්‍රගතිය**

**(අ) පළමු හා දෙවන අදියර - නිවාස 4000**

- නිවාස ඉදිකිරීම

**2025.12.31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය**

| | |
|---|---|
| මුළු නිවාස | 4,000 |
| 2025.12.31 දින වන විට ප්‍රතිලාභීන් වෙත ලබාදුන් නිවාස | 3,855 |
| වැඩ අවසන් කර ඇති භාර දීමට නියමිත නිවාස | 75 |
| 2025.12.31 දින වන විට ක්‍රියාත්මක වෙමින් පවතින නිවාස හා තත්ත්වය (වලහන්දූව-5, බෙන්තොට-9) | 14 |
| *වලහන්දූව නිවාස ව්‍යාපෘතියේ නිවාස ගණන 61කි. එයින් නිවාස 56ක වැඩ නිම කර ඇති අතර, යටිතල පහසුකම් ද සපයා ඇත. මෙම ඉතිරි නිවාස 5 හි මේ වන විට වහලය ගසා නිම කර ඇත. බෙන්තොට වත්තේ නිවාස ගණන 9ක් වන අතර ඉන් නිවාස 4ක අත්තිවාරම දමා ඇත. යටිතල පහසුකම් ලබා දී නොමැත. | |
| ඒ අනුව 4,000 ව්‍යාපෘතිය යටතේ 2025.12.31 දින වන විට නිවාස හා යටිතල පහසුකම් යන දෙකම නිම කර ඇති මුළු නිවාස | 3,986 |

**(ආ) තෙවන අදියර - නිවාස 10,000**

- නිවාස ඉදිකිරීම

| | |
|---|---|
| මුළු නිවාස | 1,300 |
| 2025.12.31 දින වන විට ප්‍රතිලාභීන් වෙත ලබා දුන් නිවාස | _ |
| වැඩ අවසන් කර ඇති භාර දිය හැකි නිවාස | 44 |
| 2025.12.31 දින වන විට වැඩ අවසන් කරන ලද නිවාස | 289 |
| 2025.12.31 දින වන විට ජල සැපයුම ලබා දී ඇති නිවාස | 124 |
| 2025.12.31 දින වන විට විදුලිය සැපයුම ලබා දී ඇති නිවාස | 716 |

- නිවාස සඳහා යටිතල පහසුකම් සැපයීම

**2025.01.01 සිට 2025.12.31 දක්වා යටිතල පහසුකම් සැපයීමේ මූල්‍ය ප්‍රගතිය**

| යටිතල පහසුකම් | පළමු හා දෙවන අදියර වියදම (රු.මි.) | තෙවන අදියර වියදම (රු.මි.) |
|---|---|---|
| ජල ව්‍යාපෘති | 75.83 | 7.86 |
| විදුලිය ව්‍යාපෘති | 75.47 | 3.96 |
| මාර්ග ව්‍යාපෘති | - | - |
| අනෙකුත් (NBRO, ඔප්පු වැඩසටහන්, සේවක වැටුප්, දැන්වීම්පල කිරීම යනාදිය) | 16.26 | - |
| මුළු වියදම | 167.56 | 11.82 |

# 02. පරිච්ඡේදය

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

නව තාක්ෂණය මුසු වූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක් ඇති කිරීම සඳහා අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති හා අණපනත්වලට අනුකූලව වැවිලි කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය හා ජාතික අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛ කොටගෙන 2026-2029 වර්ෂයන්හිදී පහත සඳහන් ඉලක්ක ලඟාකර ගැනීමට අපේක්ෂිතය.

පර්යේෂණාත්මක විධික්‍රමයන්, නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ත භූමි උපයෝජනය හරහා ගුණාත්මක නිෂ්පාදන, අගය එකතු කිරීම හා විවිධාංගීකරණය තුළින් දේශීය හා විදේශීය වෙළෙඳපොළ ආකර්ෂණය කරගැනීම, වැවිලි ප්‍රජාවගේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා ඔවුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම ඉලක්ක කරගනිමින් සමස්ත වැවිලි ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනය උදෙසා අදාළ සියලු පාර්ශ්වකරුවන් සමඟ එක්ව ක්‍රියාකරමින් ඊට අවශ්‍ය වන ප්‍රතිපත්ති හඳුනාගැනීම, ක්‍රියාත්මක කරවීම, මෙහෙයවීම සහ පසුවිපරම් කිරීම.

## 2.1 වැවිලි ක්ෂේත්‍රයේ අපනයන ආදායම් ඉලක්ක (ඇ.ඩො.මිලි.

2026 3,795 → 2027 4,082 → 2028 4,392 → 2029 4,723



## භෝග අනුව අපනයන ආදායම් ඉපයීම් හා ඉලක්ක

| වැවිලි භෝගය | 2025 | | | | 2026 | | 2027 | | 2028 | | 2029 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්ක | | සත්‍ය | | ඉලක්ක | | ඉලක්ක | | ඉලක්ක | | ඉලක්ක | |
| | රු.මි. | ඇ.ඩො.මි. | රු.මි. | ඇ.ඩො.මි | රු.මි. | ඇ.ඩො.මි | රු.මි. | ඇ.ඩො.මි | රු.මි. | ඇ.ඩො.මි | රු.මි. | ඇ.ඩො.මි |
| තේ | 439,000.0 | 1,480.0 | 453,280.0 | 1,510.0 | 503,490.0 | 1,670.0 | 557,060.0 | 1,850.0 | 616,950.0 | 2050.0 | 682,850.0 | 2,270.0 |
| රබර් | 306,000.0 | 1,007.0 | 260,825.0 | 869.0 | 310,000.0 | 1,020.0 | 312,000.0 | 1,027.0 | 315,000.0 | 1,037.0 | 318,000.0 | 1,047.0 |
| පොල් | 270,000.0 | 900.0 | 368,036.2 | * 1,222.19 | 330,000.0 | 1,100.0 | 360,000.0 | 1,200.0 | 390,000.0 | 1,300.0 | 420,000.0 | 1,400.0 |
| කිතුල් | 413.0 | 1.40 | 422.0 | 1.4 | 459.0 | 1.56 | 506.0 | 1.71 | 553.0 | 1.87 | 599.0 | 2.03 |
| කල් | 367.0 | 1.70 | 599.1 | 1.99 | 650.0 | 2.167 | 700.0 | 2.33 | 750.0 | 2.50 | 800.0 | 2.66 |
| කජු | 333.0 | 1.16 | 271.06 | 0.89 | 366.0 | 1.28 | 403.0 | 1.41 | 443.0 | 1.54 | 487.0 | 1.69 |
| අපනයන ආදායම් මුළු එකතුව | **1,016,113.00** | **3,391.26** | **1,083,433.36** | **3,605.47** | **1,144,965.00** | **3,795.01** | **1,230,669.00** | **4,082.45** | **1,323,696.00** | **4,392.91** | **1,422,736.00** | **4,723.38** |

* 2025 වර්ෂයේ පොල් නිෂ්පාදනවල මිල යාම හා අගය එකතු කළ නිෂ්පාදන වැඩි වශයෙන් අපනයන වෙළඳපොළට එකතු වීම අපනයන ආදායම ඉලක්කය ඉක්මවා යාමට හේතු විය.

## 2.2 වැවිලි අංශයේ සමස්ත කාර්යසාධනය

### ❖ තේ ක්ෂේත්‍රය



| විස්තරය | වර්ෂ 2024 | වර්ෂ 2025 | | ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සත්‍ය | 2026 | 2027 | 2028 |
| නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලි.) | 262.0 | 267.0 | 264.0 | 287.0 | 312.0 | 338.0 |
| අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි.) | 245.0 | 250.0 | 257.0 | 270.0 | 297.0 | 320.0 |
| අපනයන ආදායම (රු.බිලි.) | 433.47 | 439.0 | 453.28 | 503.49 | 557.06 | 616.95 |
| අපනයන ආදායම (ඇ.ඩො.බිලි.) | 1.43 | 1.48 | 1.5 | 1.67 | 1.85 | 2.05 |

### ❖ රබර් ක්ෂේත්‍රය



| විස්තරය | වර්ෂ 2024 | වර්ෂ 2025 | | ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සත්‍ය | 2026 | 2027 | 2028 |
| නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලි.) | 69.0 | 73.0 | 62.0 | 73.0 | 76.0 | 78.0 |
| අපනයන ප්‍රමාණය (ඒකක.මිලි.) | 30.9 | 35.0 | 27.15 | 40.0 | 45.0 | 48.0 |
| අපනයන ආදායම (රු.බිලි.) | 302.749 | 306.000 | 260.825 | 310.000 | 312.000 | 315.000 |
| අපනයන ආදායම (ඇ.ඩො.බිලි.) | 1.001 | 1.007 | 0.869 | 1.020 | 1.027 | 1.037 |
| අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි.) | 80.0 | 85.0 | 73.0 | 90.0 | 95.0 | 100.0 |

## ❖ පොල් ක්ෂේත්‍රය



| විස්තරය | වර්ෂ 2024 | වර්ෂ 2025 | | ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සත්‍ය | 2026 | 2027 | 2028 |
| පොල් පැළ නිෂ්පාදනය (පැළ මිලි.) | 2.0 | 2.5 | 2.5 | 2.5 | 2.5 | 2.5 |
| අපනයන ආදායම (රු.බිලි.) | 257.92 | 270.0 | 368.0 | 330.0 | 360.0 | 390.0 |
| අපනයන ආදායම (ඇ.ඩො.බිලි.) | 0.855 | 0.90 | 1.22 | 1.10 | 1.20 | 1.30 |
| අපනයන ප්‍රමාණය (ගෙඩි මි.) | 1,271.85 | 1,300.0 | 1,390.0 | 1,350.0 | 1,400.0 | 1,450.0 |

## ❖ කිතුල් ක්ෂේත්‍රය



| විස්තර | | වර්ෂ 2024 | වර්ෂ 2025 | | ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|---|
| | | | ඉලක්ක | සත්‍ය | 2026 | 2027 | 2028 |
| අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.) | කිතුල් පැණි | 85,745.0 | 97,717.0 | 212,035.0 | 106,428.0 | 115,139.0 | 123,850.0 |
| | කිතුල් හකුරු | 249,324.0 | 274,902.0 | 138,492.0 | 304,272.0 | 333,642.0 | 363,012.0 |
| අපනයන ආදායම (රු.මිලි.) | | 380.0 | 413.0 | 422.0 | 459.0 | 506.0 | 553.0 |
| අපනයන ආදායම (ඇ.ඩො.මිලි.) | | 1.30 | 1.40 | 1.40 | 1.56 | 1.71 | 1.85 |

## ❖ තල් ක්ෂේත්‍රය





| විස්තරය | වර්ෂ 2024 | වර්ෂ 2025 | | ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සත්‍ය | 2026 | 2027 | 2028 |
| අපනයන ආදායම (රු.මිලි.) | 228.69 | 67.00 | 599.1 | 650.0 | 700.0 | 750.0 |
| අපනයන ආදායම (ඇ.ඩො.මිලි) | 0.76 | 0.21 | 1.997 | 2.167 | 2.333 | 2.500 |

## ❖ කජු ක්ෂේත්‍රය





| විස්තරය | වර්ෂ 2024 | වර්ෂ 2025 | | ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සත්‍ය | 2026 | 2027 | 2028 |
| නිෂ්පාදනය (කි.ග්‍රෑ.මි) | 14.0 | 15.747 | * | 17.322 | 19.054 | 20.959 |
| අපනයන ආදායම (රු.බි.) | 0.303 | 0.333 | 0.271 | 0.366 | 0.403 | 0.443 |
| අපනයන ආදායම (ඇ.ඩො.මි.) | 0.01 | 1.16 | 0.89 | 1.28 | 1.41 | 1.55 |
| අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මි) | 0.1047 | 0.115 | 0.087 | 0.1265 | 0.139 | 0.152 |

(මෙම වර්ෂවල ඉලක්ක දත්තයන් උපකල්පන හා ඇස්තමේන්තු මත පදනම් වී ඇත.)

*2025 වර්ෂයේ සත්‍ය නිෂ්පාදනය ජන ලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවෙන් මේ වනතෙක් ලැබී නොමැත.

## 2.3 2025 වර්ෂයේදී වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකරන ලද ක්‍රියාකාරකම්

### 2.3.1 වැවිලි අංශය

**තේ ක්ෂේත්‍රය**

- ශ්‍රී ලංකාවේ තේ ක්ෂේත්‍රයේ අනාගත අභිවෘද්ධිය සහ තිරසර සංවර්ධනයක් ඇති කිරීම අරමුණු කොට ගනිමින්, තේ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීම සඳහා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් (2026 – 2030 ) සකස් කිරීම.
  - තේ කර්මාන්තය මුහුණ දෙනු ලබන ප්‍රධාන අභියෝග හා ගැටළු ලෙස අඩු ඵලදායිතාවය, දේශගුණික විපර්යාසවල බලපෑම, ශ්‍රම හිඟය හා අඩු ශ්‍රම ඵලදායකත්වය, තේ වල ගුණාත්මය ආශ්‍රිත ගැටළු, ලෝක තේ වෙළඳපොළ තුළ තරඟකාරීත්වය, කසල තේ නිෂ්පාදනය ඉහළ යාම, ප්‍රමිතියකින් තොර තේ නිෂ්පාදනය ආදිය හඳුනාගෙන ඇත. ඒ සඳහා පිළියම් යෙදීමට හා තේ නිෂ්පාදනය වර්ධනය කර අපනයන ආදායම ඉහළ නංවාලීම සඳහා තේ ක්ෂේත්‍රයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් පස් අවුරුදු (2026-2030) උපායමාර්ගික සැලැස්මක් සකස් කර ඇත. මේ වන විට සකස් කරන ලද තේ ක්ෂේත්‍රයේ පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.
  - එම සැලැස්මේ සම්පත් කළමනාකරණය, පර්යේෂණ සහ සංවර්ධනය, අගයදාම සංවර්ධනය සහ අගය එකතු කිරීම, අලෙවිකරණය, වෙළඳාම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය, දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහ අවදානම් අවම කිරීම, පාර්ශ්වකරුවන් සවිබල ගැන්වීම, වෘත්තීයමය සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණය, ප්‍රතිපත්ති සහ පාලනය යන තේමාත්මක ක්ෂේත්‍ර 8 යටතේ ව්‍යාපෘති හා වැඩසටහන් හඳුනාගෙන ඇත. 2030 වන විට තේ නිෂ්පාදනය කි.ග්‍රෑ. 400 දක්වා වර්ධනය කර ගැනීමටත් අපනයන ආදායම ඇ.ඩො.බි. 2.5 දක්වා වර්ධනය කර ගැනීමටත් උපායමාර්ගිකව පරමාර්ථ කොටගෙන ඇත.
- තේ අංශය සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සඳහා වන ප්‍රමිතීන් සකස් කිරීම (SL GAP)
  - ශ්‍රී ලංකාවේ තේ ක්ෂේත්‍රය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ විධිමත් ක්‍රමවේදයකට අනුව යහපත් කෘෂිකාර්මික වත් පිළිවෙත් සඳහා වන අවශ්‍යතා වෙනුවෙන් Requirements for Good Agricultural Practice part 9: Tea නමින් ප්‍රමිතියක් සකස් කරන ලදී.
  - එමෙන්ම රාජ්‍ය, පෞද්ගලික හා මහජන හවුල්කාරීත්ව (PPP) ප්‍රවේශයකට අනුකූලව තිරසරභාවය ශක්තිමත් කිරීම සඳහා වන (ISEAL) සන්ධානයේ සාමාජිකත්වය ලබා ගැනීමට ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට ලබාදුන් තීරණය අනුව ඉදිරි කටයුතු කරමින් පවතී. නව ද ශ්‍රී ලංකා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (SL GAP) සඳහා පොදු ලාංඡනයක් හඳුන්වාදීම සහ "පොදු බලයලත් ඒකකයක්" පිහිටුවීම සඳහා ද කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය හා වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සමඟ ඉදිරිපත් කළ ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුමැතිය ලැබී ඇත.

- එසේම කෘෂිකර්ම විෂයභාර ලේකම්ගේ අනුමැතියට යටත්ව වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ කෘෂි අංශය වැවිලි බෝග සඳහා " උප බලයලත් ඒකකයක් " (Sub Scheme Owner)" ලෙස කටයුතු සංවිධානය වෙමින් පවතී.

➢ තේ කර්මාන්තය සඳහා "ජාතික තිරසාර ජෛව ස්කන්ධ වර්ධනය සහ මූලාශ්‍ර වැඩසටහන" ක්‍රියාත්මක කිරීම.

- මෙහි නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට තේ කර්මාන්ත සමාගම් 8ක් ඉදිරිපත් වී ඇත. ඒ පිළිබඳ අදාළ කර්මාන්තශාලාවල ක්ෂේත්‍ර නිලධාරීන් සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ හා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිළධාරීන් සමඟ සාකච්ඡා පවත්වා ඇත. ඒ අනුව, අරුණ තේ කර්මාන්තශාලාව හා ගල්තර තේ කර්මාන්තශාලාව නිරීක්ෂණ කිරීමෙන් පසු , ගල්තර තේ කර්මාන්තශාලාව සම්බන්ධ කර ගනිමින් නියමු වැඩසටහනක් පරෙයිගම ග්‍රාම නිළධාරී වසම ද සම්බන්ධ කර ගෙන සිදු කළ අතර, තේ ක්ෂේත්‍රය සඳහා සැකසෙන 2026 -2030 උපායමාර්ගික සැලැස්ම තුළ ක්‍රියාත්මක කිරිමට නියමිත ආදර්ශ තේ ගම්මාන 500 වැඩසටහන සඳහා මෙය සම්බන්ධ කිරීමට ද තීරණය කර ඇත.
- මේ යටතේ Guidelines for Best Practices in Sustainable Biomass Growing and Use in the Tea Industry – Sri Lanka" මාර්ගෝපදේශ සංග්‍රහය Ethical Tea Partnership ආයතනය සමඟ එක්ව තේ ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා සකස් කිරීමට කටයුතු කරන ලදී.

➢ පුනර්ජනීනය කෘෂිකර්මය සඳහා වන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

- වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ යුනිලිවර් ශ්‍රී ලංකා (ලිමිටඩ් ) ආයතනය වැවිලි ක්ෂේත්‍රයේ පුනර්ජනනීය කෘෂිකර්මාන්තය සහ ජාතික තිරසර ප්‍රමිති හඳුන්වාදීම සඳහා ගිවිසුම්ගත වූ අතර, එහි දී පුනර්ජනනීය කෘෂිකර්මය / කාබන් විමෝචන අගය ශුන්‍ය කිරීම , ගෝලීය වශයෙන් පිළිගත් ජාතික තිරසර ප්‍රමිතිය සහ වන විනාශයෙන් තොර තේ සැපයීම ඉලක්කගත ක්ෂේත්‍ර ලෙස හඳුනා ගන්නා ලදී.
- තවද, පුනර්ජනනීය කෘෂිකර්මාන්තයට අදාළව රාජ්‍ය - පෞද්ගලික හා මහජන හවුල්කාරීත්ව ව්‍යාපෘතිය යටතේ ගෝලීය වශයෙන් පිළිගත් දේශීය තිරසාර ප්‍රමිතීන් හඳුන්වාදීම හා තේ ක්ෂේත්‍රය සඳහා වන ප්‍රමිතීන් සකස් කිරීමට වන වැඩසටහන් මෙහෙයවීම හා අධීක්ෂණය කිරීමේ කටයුතු සිදු කරන ලදී.

➢ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය (SMELoC) ව්‍යාපෘතිය

- මේ යටතේ තේ අගය දාමය ශක්තිමත් කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් තාක්ෂණ තොරතුරු ලබාදෙන ජංගම යෙදවුම සහ තේ ව්‍යවසායකයින්ට වෙළඳපල හා විවිධ සේවා සඳහා සම්බන්ධ වීමට පහසුකම් සලසා දෙන ජංගම යෙදවුම සංවර්ධනය කිරීමේ කටයුතු අවසන් වී ඇති අතර, 2026 ජූනි 30 දින මෙම ජංගම යෙදවුම් ක්ෂේත්‍රයට හඳුන්වා දීමට සැලසුම් කර ඇත.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ සියවන සංවත්සර සැමරුම 2025 වර්ෂයේ නොවැම්බර් මස 10 සිට 11 දක්වා පැවැත්වූ අතර, එහි සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ ඒ නිමිත්තෙන් පවත්වනු ලැබූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ ඉහළ සහ පහළ ජලාධාර ප්‍රදේශවල ජීවත්වන ග්‍රාමීය ප්‍රජාව සහ සම්බන්ධ කෙරෙන පරිසර පද්ධති ස්වයං ප්‍රවාහයන් ආරක්ෂා කිරීම ද ඇතුළත් දේශගුණික විපර්යාසයන්ට අනුගත වීමට දුම්බර හරිත සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියට (GCF Knuckles) අදාළව ඇල්කඩුව වැවිලි සමාගම හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගම් වල ප්‍රගතිය සමාලෝචනය කිරීම හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
- රාජ්‍ය පොහොර සමාගම (State Fertilizer Company) මගින් පමණක් සිදු කරනු ලැබූ පොහොර බෙදාදීමේ වැඩසටහන ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සියළුම පොහොර සමාගම් හරහා කූපන් පත් ක්‍රමවේදයක් මගින් ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් QR කේතයක් සකස් කර 2025.12.31 දින අවසානය වන විට ඒ මගින් ගොවීන් වෙත මෙ.ටො. 18,095.2ක් පොහොර ලබා දී ඇත.
- ආසියානු සංවර්ධන බැංකු (ADB) ණය යෝජනා ක්‍රමය හා සම්බන්ධ ආසියානු සහ ශාන්තිකර කලාපය සමෘද්ධිමත් සහ ඔරොත්තු දීම සඳහා වූ ජපාන අරමුදල (JFPR) මගින් ක්‍රියාත්මක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය (SMELOC) ක්‍රියාත්මක කිරීම.
  - ඇ.ඩො.මි.20ක නියමු ව්‍යාපෘතින් ලෙස ක්‍රියාත්මක වූ මෙම ණය යෝජනා ක්‍රමය සඳහා මුදල් අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව සමඟ ගිවිසුම්ගතව ඇති අතර, එමගින් තේ වගාව දිරිමත් කිරීම සහ තේ වගාවට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමට යෝජිතය. ඒ අනුව නියමු ව්‍යාපෘතියට ගිවිසුම්ගත වූ මුදලින් කොටසක් ප්‍රදානයක් ලෙසත් කොටසක් ණය යෝජනා ක්‍රමයක් ලෙසත් ලබා දෙයි.
- වැවිලි අංශයේ අවසන් කරන ලද වැවිලි ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩල සංදේශය කෙටුම්පත් කර ඉදිරිපත් කිරීම.

## රබර් ක්ෂේත්‍රය

- රබර් නිෂ්පාදන අගය දාමය වැඩිදියුණු කිරීම සහ කුඩා රබර් වතු හිමියන්ගේ ධාරිතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය - “RIVER Project” (Rubber Improvement of Value chain & Embedded Smallholders Resilience)

රබර් නිෂ්පාදන අගය දාමය වැඩි දියුණු කිරීම සහ කුඩා රබර් වතු හිමියන් 6000ක ගේ ධාරිතාවය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රංශ රජයේ ආර්ථික, මූල්‍ය හා ප්‍රතිසාධන අමාත්‍යාංශයේ සහ ප්‍රංශයේ මිචෙලින් සමූහයේ මූල්‍ය ආධාර යටතේ 2023-2025 කාලයට ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය, මිචෙලින් ලංකා සමූහය සහ ලංකා කාබනික කෘෂිකර්ම ව්‍යාපාරය (LOAM) විසින් සිදු කළ අතර, මෙහි සම්බන්ධීකරණ කටයුතු රබර් සංවර්ධන අංශය විසින් සිදු කරන ලදි.

- **රබර් පාලන පනත**

1956 අංක 11 දරන රබර් පාලන පනත මඟින් බලතල පවරා තිබූ රබර් පාලක වෙනුවට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේදී ඇති කරන ලද අධ්‍යක්ෂ ජනරාල් තනතුරට එම බලතල පැවරීමට අදාළව නෛතික සංශෝධනය සඳහා ඉදිරිපත් කළ අංක 22/0703/518/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුමැතිය ලැබී ඇත. ඒ අනුව රබර් පාලන (සංශෝධන) පනත් කෙටුම්පත 2024.04.26 දිනැතිව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ අතර, එම පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කර නව වන පාර්ලිමේන්තුවට අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

- **ශ්‍රී ලංකාවේ රබර් වගාව සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම**

මෙරට රබර් වගාව වඩාත් තිරසාර සහ ගුණාත්මක වගාවක් බවට පත් කිරීම සඳහා ප්‍රමිතිගත යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP ) ප්‍රමිතීන් සකස් කර, එය මාර්ගෝපදේශයක් ලෙස භාවිතයට ගත හැකි අයුරින් සකස් කිරීමේ අවශ්‍යතාවය මත ඒ සඳහා මූලික පියවර වශයෙන් මෙම ක්ෂේත්‍රයට අදාළ රාජ්‍ය ආයතන හා එක්ව යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රමිතීන් සකස් කිරීමට කමිටුවක් පත් කර, ඒ අනුව රබර් ක්ෂේත්‍රයට ආදාළ ප්‍රමිති සැකසීම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් සිදු කිරීමේ සංවිධාන කටයුතු සිදු කිරීම.

- **ජාත්‍යන්තර වෙළඳපල ඉල්ලුම සපුරාලීම සඳහා රබර් ඉඩම් ලියාපදිංචි කිරීමේ ඩිජිටල් පද්ධතිය ඵලදායී ලෙස යොදා ගනිමින් රබර් කර්මාන්ත අංශය නවීකරණය කිරීම**

යුරෝපා සංගමයට අයත් රටවල් වෙත රබර් නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය අපනයනය කිරීමේ දී අනුගමනය කළ යුතු නව රෙගුලාසි සඳහා අනුගත වීමේ අරමුණින්, රබර් ඉඩම්වල භූගෝලීය පිහිටීම, අයිතිය හා භාවිතය පිළිබඳ දත්ත ලබා ගැනීමේ අවශ්‍යතාවය මත ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව එක්ව රබර් ඉඩම් 79,890ක් සිතියම්ගත කිරීමේ හා QR කේත නිකුත් කිරීමේ කටයුතු 2025 වර්ෂය තුළ ආරම්භ කරන ලදි. එම ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- **ජාතික රබර් අංශයේ මාර්ග සිතියම 2026 – 2030 සඳහා කැබිනට් අනුමැතිය ලබාගැනීම**

රබර් ක්ෂේත්‍රයේ තිරසාර භාවය , ඵලදායී තාවය හා ගුණාත්මක භාවය වඩාත් තහවුරු කිරීමටත් එමඟින් ක්ෂේත්‍රයේ අගය දාම සංවර්ධනය හා මෙරට රබර් කර්මාන්තය ලෝකය තුළ සන්නාමයක් බවට පත් කිරීමේ අරමුණු ඉටු කරගැනීම සඳහා ඉදිරි වසර පහ සඳහා (2026-2030) සැලසුම් ඇතුලත් මාර්ග සිතියමක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර වැඩමුළු 14ක් පවත්වා ඇත.

## පොල් ක්ෂේත්‍රය

- 2030 වන විට රටෙහි පොල් අවශ්‍යතාවය වන ගෙඩි මිලියන 4,200ක් සැපයීම සහ අපනයන ආදායම ඇ.ඩො.මි. 1,500ක් දක්වා ඉහළ නැංවීම ප්‍රධාන අරමුණු කර, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO) හා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS) සමග ක්ෂේත්‍රයේ සියළු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් පොල් ක්ෂේත්‍රය සඳහා දස අවුරුදු මාර්ග සැලැස්ම හා පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදු කිරීම.
- පොල් ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සහ විදේශීය පුහුණුව, දේශීය පුහුණුව හා දැනුවත් කිරීම සම්බන්ධව අවශ්‍ය සහාය ලබා දීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (International Finance cooperation) සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම. එම කටයුතු වෙනුවෙන් ඇ.ඩො. 200,000.00 ක් අධාර මුදලක් ලැබී ඇත.
- හරිත දේශගුණික අරමුදල (Green Climate Fund) මගින් පොල් ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා දායකත්වය ලබා ගත හැකි ආකාරය සම්බන්ධව සාකච්ඡා ආරම්භ කිරීම.
- උපපෘෂ්ඨීය ජල සම්පාදන පද්ධතීන් සකස් කිරීමට අදාළව වෙළඳ සංවර්ධන ආයතනය (Marketing Development Facility) සමඟ සාකච්ඡා පවත්වන ලද අතර, ඒ සඳහා පිරිවිතර ලැයිස්තුවක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර එම ආයතනය වෙත ඉදිරිපත් කිරීම.
- වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය පාලනය කිරීමට අදාළව පොල් පර්යේෂණායතනයේ හා පොල් වගා කිරීමේ මණ්ඩලයේ කාර්යභාරය නියාමනය කිරීම.
- පොල් වගාවෙහි රෝග හා පළිබෝධ හානි සහ වන සත්ව හානි අවම කිරීමට අදාළව සියළු පාර්ශ්ව සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙළක් සකස් කිරීම.
- ජාත්‍යන්තර පොල් ප්‍රජාව (ICC) සමඟ කටයුතු සිදු කිරීම හා 2024 වර්ෂයේදී ජාත්‍යන්තර පොල් ප්‍රජාවෙහි 60 වෙනි සංවත්සරය පැවැත්වීම සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගා කිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණායතනය, කිතුල් සංවර්ධන මණ්ඩලය හා කිතුල් සංවර්ධන මණ්ඩලය හා තල් සංවර්ධන මණ්ඩලය යන ආයතනවලින් සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණ කිරීම.
- පොල් වගාවෙහි ඵලදාව වැඩිකරගැනීමේ අරමුණු ඇතිව රුසියානු සමූහාණ්ඩුවේ සහ යූරල්කලී ආයතනයේ (රුසියාව) දායකත්වයෙන් සපයනු ලැබූ මිශ්‍ර පොහොර මෙ.ටොන් 56,700ක් පොහොර කි.ග්‍රෑ. 50 ක මිටියක් රු. 4,000.00 ක සහනාධාර මිලකට වගාකරුවන්ට ලබා දීම සම්බන්ධීකරණ කිරීම මගින් 2025 වර්ෂ අවසානවන විට ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් පහත පරිදි පොහොර ලබා දී ඇත.

| විස්තරය | ප්‍රමාණය (මෙ.ටො.) |
|---|---|
| ඇණවුම් කරන ලද පොහොර ප්‍රමාණය | 11,309.286 |
| නිකුත් කිරීමට නියමිත පොහොර ප්‍රමාණය | 32,032.764 |
| දැනට දිවයින පුරා බෙදා ඇති මුළුපොහොර ප්‍රමාණය | 14,257.95 |

➢ දේශීය පොල් ඵලදාව අඩුවීම හා ඉල්ලුම ඉහළයාමත් සමඟ පොල් මිල ඉහළයාම දේශීය පාරිභෝගිකයාට සහ පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා සිදුවන බලපෑම අවම කිරීම සඳහා, පොල් මද ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තායතන වෙත සෘජුවම ශීත කළ පොල් මද, පොල් කිරි/පිටි කළ පොල් කිරි, දිසිදි පොල් ප්‍රතිඅපනයනය සඳහා බදු විරාම පදනම (TIEP) මත පොල් ගෙඩි මිලියන 200කට සමාන ධාරිතාවයකින් යුත් ප්‍රමාණයක් ආනයනය කිරීමට අවසර ලබා දීම.

➢ මේ යටතේ 2025.12.31 දින වන විට ආනයනය සඳහා ඉල්ලුම් කර ඇති ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව 45ක් වේ. පොල් සංවර්ධන අධිකාරියේ නිර්දේශිත ඉල්ලුම්පත් සංඛ්‍යාව 33කි. පොල් පර්යේෂණ ආයතනය මඟින් නිර්දේශිත ඉල්ලුම්පත් සංඛ්‍යාව 27ක් වේ. ශාක නිරෝධායන ආයතනය මඟින් ආනයන අවසරය ලබා දුන් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව 09ක් වේ. (ධාරිතාවය පොල් ගෙඩි 25,305,000) ආනයනය කර ඇති පොල් ප්‍රමාණය පොල් කිරි මෙ.ටො. 20කි.

➢ දේශීය පොල්තෙල් කර්මාන්තකරුවා ආරක්ෂා කර ගැනීමේ අරමුණින් ආනයනික පොල්තෙල් නියාමනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම.

➢ "දේශීය පොල් මද ආශ්‍රිත කර්මාන්ත හා පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට පියවර ගැනීම" යන මැයෙන් ඉදිරිපත් කරන ලද අංක 25/0215/813/002-I දරන 2025.02.01 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව කැබලි කර වියලන ලද කුරුට්ට සහිත පොල් (කොප්පරා නොවන) ආනයනය කිරීමට ලැබී ඇති අනුමැතිය පරිදි ආනයනය කිරීමේදී, රේගු සංකේතාංකය (0801.11.90) යටතේ ආනයන බලපත්‍ර ලබාගෙන ආනයනය කළ හැකි, පොල් මද නොවන වෙනත් ද්‍රව්‍යන් ද පැවතිය හැකි බැවින්, ඒවා සඳහා ප්‍රතිශතාත්මක බදු ක්‍රමවේදය අදාල කරගනිමින් ගණනය කරන ලද්දකි. ග්‍රෑමයට රු. 320.00 ක් වූ නිශ්චිත බද්දක් 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ හඳුන්වාදීමටත්, දේශීය වශයෙන් පොල්තෙල් නිෂ්පාදනය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ නිර්දේශයන්ට යටත් ව, කැබලි කර වියලන ලද කුරුට්ට සහිත පොල් (කොප්පරා නොවන) ආනයනකරුවන්ට කි.ග්‍රෑ. රු.10.00 ක් වූ සහනදායි විශේෂ වෙළඳ භාණ්ඩ බදු අගයක් ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඊට අදාල ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීම.

➢ පොල්තෙල් සමඟ වෙනත් තෙල් මිශ්‍ර කිරීම වැළැක්වීම සඳහා පොල්තෙල් 175ml (1/4) සිට ලේබලයක් සහිතව ඇසුරුම්කර අලෙවි කිරීම අනිවාර්ය කිරීමට, ඇසුරුම්කරණය සම්බන්ධයෙන් 2286/26 දරණ 2022 ජුනි මස 29 වැනි දින පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නිකුත් කර ඇති ගැසට් පත්‍රයේ කොන්දේසි ද ඇතුළත් කර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නව ගැසට් පත්‍රයක් නිකුත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන මේ සඳහා අනුගතවීමට වසරක සහන කාලයක් ලබාදීම සහ ඊට අදාළ මාර්ගෝපදේශ පොල් සංවර්ධන අධිකාරිය මඟින් සකස් කර නියාමන කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ පොල් සංවර්ධන අධිකාරිය එක්ව කටයුතු කිරීම.

➢ කොහුබත් සඳහා අළුතින් නිර්මාණය කරන ලද HS කේතය මත අපනයන සෙස් බද්දක් ක්‍රියාත්මක කිරීම සඳහා පොල් සංවර්ධන පනත යටතේ 2024.06.19 වන දින පාර්ලිමේන්තුවේ දී සම්මත වූ යෝජනාවට අදාල ගැසට් නිවේදනය, 2025.02.05 දිනැතිව (අංක 2422/27) රජයේ ගැසට් පත්‍රයේ පල

කරන ලදී. නව HS කේතය වන 1404.90.93 යටතේ සම්පීඩනය නොකරන ලද හා සම්පීඩනය කරන ලද කොහුබත් අපනයනය වෙනුවෙන් සෙස් බදු ලෙස, සම්පීඩනය නොකරන ලද කොහුබත් අපනයනය සඳහා සෙස් ද බදු ලෙස අයකරනු ලබන මෙ.ටො. 1ක් සඳහා වන රු. 100ක මුදලම අයකරනු ලැබේ.

- ➢ පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගා කිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණායතනය, සී/ස හලාවත වැවිලි සමාගම හා සී/ස කුරුණෑගල වැවිලි සමාගම යන ආයතනවලින් සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය කිරීම.
- ➢ වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ, පොල් හා කුඩා වැවිලි බෝග සංවර්ධන අංශයේ සම්බන්ධීකරණය යටතේ, පොල් සංවර්ධන අධිකාරිය විසින් පෝෂණ ගුණය රැඳෙන පරිදි කාර්යක්ෂම පොල් භාවිතය පිළිබඳ දීප ව්‍යාප්තව සිදු කිරීමට නියමිත වැඩසටහන්මාලාවේ, නියමු වැඩසටහන 2025.07.21 වන දින සෙත්සිරිපාය දෙවන අදියරේ 11 වෙනි මහලේ පිහිටි ශ්‍රවනාගාරයේ දී සාර්ථකව පවත්වා, මෙම වැඩසටහනේ ඉතිරි වැඩසටහන් ද ක්‍රියාත්මක කර අවසන් කර ඇත.

## 2.3.2 ප්‍රජා යටිතල පහසුකම් අංශය

### 2.3.2.1 2025 වර්ෂයේදී ප්‍රජා යටිතල පහසුකම් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් අංශයන් විසින් සිදුකරන ලද කාර්යයන්

**පාලන අංශය**

- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ පාලන අංශය මඟින් එම අංශය යටතේ පවත්නා සියලුම ආයතනයන්හි මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම.
- මානව සම්පත් නිසි ලෙස කළමනාකරණය කරමින් අනුමත සේවක සංඛ්‍යාව තුළ සියලුම අංශයන්හි රාජකාරී වගකීම් සැළකිල්ලට ගෙන කාර්ය මණ්ඩලය බෙදාහැරීම.
- මෙම අංශය යටතේ පවත්නා සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම සහ ඒ යටතේ වන ආයතන සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් නොමැති වීමේ ගැටලුව වෙනුවෙන් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විධිමත් පරිදි අනුමත කර ගැනීමෙන් පසු අවශ්‍ය බඳවා ගැනීම් පටිපාටි අනුමත කර ගැනීම.
- නිලධාරින්ගෙන් සඵලදායි සහ කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම සඳහා නිලධාරීන් අභිප්‍රේරණය කිරීමට හඳුනාගත් විද්වතුන් මඟින් විද්වත් හමුව නමින් දේශන මාලාවක් පැවැත්වීම.

**සංවර්ධන අංශය**

- වැවිලි අංශයේ ජනතාවගේ සුභ සාධනය, වාසස්ථාන, ජීවන තත්ත්වය හා සමාජ ආර්ථික පහසුකම් වැඩි කිරීම උදෙසා ප්‍රජා යටිතල පහසුකම් අංශය යටතේ පවතින ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, හා පළාත් පාලන ආයතන ඔස්සේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම.

- ව්‍යාපෘති සම්බන්ධීකරණය පිළිබඳ සියළු වගකීම් දරමින් රජයේ ඒකාබද්ධ අරමුදලින් හා ඉන්දියානු රජයේ සහය යටතේ ලබා දෙන අරමුදල් ද යොදවමින් ප්‍රජා යටිතල පහසුකම් අංශයේ අරමුණු හා ඉලක්ක කරා මෙහෙයවීම.
- ඉහත කර්තව්‍යයන් නිසිලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉංජිනේරු අංශය හා සැළසුම් අංශය ද සංවර්ධන අංශ ද සමඟ සම්බන්ධීකරණ වී යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් පේලි නිවාසයන්හි අබලන් වූ වහලයන් නැවත සෙවිලි කිරීම, සෞඛ්‍යාරක්ෂිත පානීය ජල සැපයුම් ක්‍රම ඇති කිරීම සහ වැඩිදියුණු කිරීම හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

**වතු නිවාස වැඩසටහන යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ කාර්යයන් ඉටු කිරීම**

- නව ජීවන නිවාස වැඩසටහන යටතේ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන සමායෝජනය සහ අධීක්ෂණය කිරීම.
- නව ජීවන නිවාස වැඩසටහන සහ ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන යටතේ ඉදිකරනු ලබන නිවාස සඳහා ජලය, මාර්ග සහ විදුලි සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- නව ජීවන නිවාස වැඩසටහන් වලට අදාළ ණය වාරික අයකර ගැනීම.
- තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ ඇති, හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් හි පිහිටි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය සහ ප්‍රජා ශක්ති (E–kios) සංවර්ධන මධ්‍යස්ථාන යනාදියෙහි සමස්ථ අධීක්ෂණය.
- විදේශ ආධාර යටතේ හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීම, නියාමනය කිරීම හා ප්‍රගතිය අනුව ගෙවීම නිර්දේශ කිරීම.
- ඉදිකිරීම් හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ප්‍රගති වාර්තා හා ප්‍රසම්පාදන වාර්තා ඉදිරිපත් කිරීම.

**සැලසුම් අංශය**

- වැවිලි ප්‍රජාවගේ උන්නතිය සඳහා වූ ප්‍රතිපත්ති හා වැඩසටහන් හඳුනාගැනීම හා ප්‍රජා යටිතල පහසුකම් අංශයේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සහ වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම.
- සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහාභාණ්ඩාගාරයෙන් වෙන් කරවා ගැනීම.
- සංවර්ධන ප්‍රතිපත්ති සැකසීමේදී සහාය ලබාදීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රාග්ධන ඇස්තමේන්තු සැකසීම.
- නව සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම , ව්‍යාපෘති යෝජනා සැකසීම, ව්‍යාපෘති වලට අදාළව ස්ථාන පරීක්ෂාව, අධීක්ෂණය සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදු කිරීම.

- යෝජිත ව්‍යාපෘති ගෙන්වා ගැනීම, ඒ අතුරින් සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම, ශක්‍යතා ඇගයීම, ව්‍යාපෘති මෙහෙයවීම හා ඇගයීම, ක්ෂේත්‍ර නිරීක්ෂණ, ප්‍රගති සමාලෝචනය, මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය ඇතුලත් ප්‍රගතිය වාර්තා සැකසීම , අදාළ ආයතන වෙත යොමු කිරීම සහ සමාලෝචන රැස්වීම පැවැත්වීම.
- ග්‍රාමීය ප්‍රදේශවල ජීවනෝපාය සහ මූලික පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අදාළ ආයතන සම්බන්ධීකරණය හා පහසුකම් සැළසීම.
- වතු ප්‍රජාවගේ මූලික අවශ්‍යතා පිළිබඳ තොරතුරු යාවත්කාලීන කොට පවත්වා ගෙන යාම.
- වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සළසන නිලධාරීන් හා ප්‍රජා ශක්ති නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කොට වැවිලි අංශය වෙත ඉදිරිපත් කිරීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ සංවර්ධන වැඩසටහන් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම.
- තිරසාර සංවර්ධන ඉලක්ක පදනම් කරගත් වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම.
- ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් සඳහා වතු නිවාස අංශය වෙනුවෙන් නියෝජනය කිරීම.
- "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්තිමය ප්‍රකාශය යථාර්තයක් කිරීම උදෙසා හැටන් ප්‍රකාශට අනුව යමින් මලෙයිගම් ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් සැපිරුණු මොහොතේ නිවාස ප්‍රතිලාභය තහවුරු කිරීමේ අරමුණින් ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ IV වන අදියරේ (නිවාස 10000) ප්‍රතිලාභීන් 2000ක් සඳහා නිවාස හිමිකම් පත් ප්‍රදානය කිරීමේ සමාරම්භක උත්සවයක් 2025 10.12 වන දින බණ්ඩාරවෙල නගර සභා ක්‍රීඩාංගනයේදී පැවැත්වූ අතර, මෙහි සංවිධානය කටයුතු මෙම අංශය පුමුඛව සියළු අංශ ඒකාබද්ධ සිදු කිරීම.

## ගිණුම් අංශය

- ප්‍රජා යටිතල පහසුකම් අංශය හා ඒ යටතේ ඇති ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් ලබාදීම, වැටුප් හා දීමනා ගෙවීම, සංවර්ධන ක්‍රියාවලියන්ට අදාළ ගෙවීම් කිරීම, නඩත්තු කටයුතු ආදී රාජ්‍ය අරමුදල් මඟින් සිදු කරන ගෙවීම් සම්බන්ධ සියළු කටයුතු සිදු කිරීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ විෂය පථයට අයත් අංශ හා ආයතනවල මූල්‍ය කළමනාකරණය.
- ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම හා කළමනාකරණය.
- වත්කම් කළමනාකරණය.
- මූල්‍ය කළමනාකරණය සඳහා නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම.
- මූල්‍ය කළමනාකරණය හා සම්බන්ධ පුහුණු හා සංවර්ධන කටයුතු සිදු කිරීම.
- විගණනයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

## අභ්‍යන්තර විගණන අංශය

- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ මූල්‍ය කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳව ඇගයීම් සිදු කරමින් අඩුපාඩු වැළැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන අභ්‍යන්තර පරීක්ෂාවන් හි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ ඇගයීමකට ලක් කිරීම.
- වාර්ෂික ප්‍රතිපාදන මත ඉටු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිශ්චය කිරීමට සහායවීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී අදාළ කරුණු අනාවරණය කිරීම, වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීම, විගණන විමසුම් මඟින් පෙන්වා දුන් කරුණු නිවැරදි කර ගැනීම සහ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධීකරණය කිරීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීම් කිරීම හා එම අංශය මඟින් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති මෙන්ම අනෙකුත් ක්‍රියාකාරකම් පිළිබඳ විගණන නිරීක්ෂණ මහාභාණ්ඩාගාරය වෙත වාර්තා කිරීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් 2025.04.21, 2025.07.29, 2025.10.29 හා 2026.01.21 යන දිනයන්හි පැවැත්වීම.
- අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් සංඛ්‍යාව 07ක් සහ විශේෂ විමර්ශනයක් සිදු කිරීම.

## ඉංජිනේරු අංශය

- වාස්තු විද්‍යාත්මක සැලැසුම් (Architectural හා Design Drawings) සඳහා අනුමැතිය ලබා දීම සහ පිරිවිතරයන් හා ඇස්තමේන්තු වලට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- විවිධ අරමුදල් ප්‍රභවයන් මඟින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම හා උපදේශන සේවාවන් සැපයීම.
- ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- තාක්ෂණික ඇගයීම් කමිටු හා තාක්ෂණික විගණනයන් වලට සහභාගී වීම.
- ඉදිකිරීම් ව්‍යාපෘති වලට නව ක්‍රමවේදයන් හඳුන්වාදීම.
- ස්ථාන පරීක්ෂාව, අධීක්ෂණය සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදු කිරීම.
- විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් අධීක්ෂණය කිරීම හා ඇස්තමේන්තු සැකසීම.

### 2.3.2.2 ප්‍රජා යටිතල පහසුකම් අංශයට පැවරුණු ආයතන විසින් ඉටු කළ කාර්යයන්

- **සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම**

සියලු ප්‍රජාව අතර සාමය, හොඳ හිත, අවබෝධය සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම, ජාතීන් අතර එකමුතුකම සහ සමාජ සංකලනය ප්‍රවර්ධනය කිරීම හා ධෛර්යමත් කිරීම, ආගමික, අධ්‍යාපනික, වෘත්තීමය, සමාජයීය, දේශපාලන, ආර්ථික, සෞන්දර්යාත්මක හා භෞතික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම හා අවබෝධය නංවාලීම ආදිය මඟින් යහපත් ජන සමාජයක් බිහිකිරීම වෙනුවෙන් "සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම" 2005 අංක 19 දරණ පාර්ලිමේන්තු පනත මඟින් 2005 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. මේ යටතේ පහත ආයතන ක්‍රියාත්මක වේ.

1. හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය (TVTC)
2. රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය (TCC)
3. නෝර්වුඩ්හි පිහිටි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය (TSC)
4. ප්‍රජාශක්ති සංවර්ධන මධ්‍යස්ථාන- 44

සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම වෙනුවෙන් සංවර්ධන වැඩසටහන් සඳහා 2025 වර්ෂයේ රු.මි. 26.76 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇත. 2025.12.31 දිනට එහි ප්‍රගතිය රු.මි. 19.01කි.

- **හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය**

හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ වසරකට සිසුන් 400 ක් පුහුණු කිරීමේ හැකියාව ඇත. මෙම ආයතනයේ වර්තමානයේ වාර්ෂික සහ සය මාසික පාඨමාලා පවත්වනු ලබයි. සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාපටිපාටිය අනුව පසුගිය වසරේ විවිධ වර්ගයේ පාඨමාලා සඳහා පුහුණු සිසුන් 219ක් පමණ ලියාපදිංචි කරන ලදී. මෙම ලියාපදිංචි වූ සිසුන් අතරින් සිසුන් 186 දෙනෙකු (පිරිමි 115 සහ ගැහැණු 71) දැනට පුහුණුව ලබමින් සිටී.

- **රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය**

ඉන්දියානු සම්භවයක් ඇති වතු ප්‍රජාවගේ සංස්කෘතික අනන්‍යතාවය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය සහ සෞන්දර්ය විද්‍යාලය රම්බොඩ හි පිහිටුවන ලදී. මෙහි නර්තන හා සංගීත පන්ති අර්ධකාලීන (අවිධිමත්) පාඨමාලා ලෙස පවත්වයි. ඒ සඳහා 2014-2021 කාලයේදී පුද්ගලයින් 251ක් සහභාගී විය.

2021 දී, කොවිඩ් 19 රෝගීන් සඳහා රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය අතරමැදි සත්කාර මධ්‍යස්ථානයක් (ICC) බවට පරිවර්තනය කරන ලදී. එයින් පසු 2023 දී වසා දමන ලදී. වර්තමානයේ දේශන කටයුතු ආරම්භ කර ඇති අතර, ශාලා වෙන්කරවා ගැනීම් සහ කුඩා වගා කටයුතු සඳහා පමණක් භාවිතා වේ. 2025 ක්‍රියාකාරී සැලැස්මේ කොටසක් ලෙස සෞන්දර්ය විද්‍යාල කටයුතු නැවත ආරම්භ කිරීම

සඳහා සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම (STMF) සමඟ කටයුතු කිරීමට මෙන්ම රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය (TCC) තුළ තාක්ෂණික කෞතුකාගාරයක් පිහිටුවීමට සැලසුම් කර තිබේ.

- **නෝර්වුඩ්හි පිහිටි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය**

තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය, විශේෂයෙන් සේවා නොලැබූ සහ අඩු පහසුකම් සහිත ග්‍රාමීය ප්‍රජාවගේ භෞතික සංවර්ධනය සඳහා ස්ථාපිත කරන ලදී. පාපන්දු, වොලිබෝල්, ක්‍රිකට්, නෙට්බෝල් සහ අනෙකුත් ක්‍රීඩා ක්‍රියාකාරකම් ඇතුළු ක්‍රියාකාරකම් කිහිපයකට පුද්ගලයින් 942 (2023) ක්, සහභාගී විය. 2024 වර්ෂයේ නෝර්වුඩ් ක්‍රීඩා සමාජයේ ක්‍රියාකාරකම් කිහිපයකට පුද්ගලයින් 746 ක් සහභාගී විය.

- **ප්‍රජාශක්ති සංවර්ධන මධ්‍යස්ථාන**

2006 සිට නුවරඑළිය, බදුල්ල, කෑගල්ල, මහනුවර, රත්නපුර, මාතලේ, කළුතර, ගාල්ල, මාතර සහ මොනරාගල දිස්ත්‍රික්කවල වතු ප්‍රදේශ ආවරණය වන පරිදි ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 44ක් හරහා ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. එහිදී ඇඳුම් මැසීම, වෛද්‍ය සහ සෞඛ්‍ය වැඩසටහන් සහ අනෙකුත් සමාජ සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි.

**2025.12.31 දිනට ප්‍රජා ශක්ති සංවර්ධන ව්‍යාපෘතිය මඟින් සිදු කළ වැඩසටහන්**

| # | වැඩසටහනේ නම | සංඛ්‍යාව | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| 1 | සිසු සිසුවියන්ගේ පැමිණීම (පරිගණක සහ පාසල් පදනම් කරගත් වැඩසටහන්) | මධ්‍යස්ථාන 42 | 17,570 |
| 2 | ශිෂ්‍ය පැමිණීම | මධ්‍යස්ථාන 42 | 594 |
| 3 | කාය වර්ධන ක්‍රියාකාරකම් (Gym Youth Activities ) | මධ්‍යස්ථාන 42 | 370 |
| 4 | රෙදි මැසීම | මධ්‍යස්ථාන 42 | 740 |
| 5 | අධ්‍යාපනය | 93 | 4,390 |
| 6 | සංක්‍රමණය | 18 | 696 |
| 7 | කාන්තා මූලික වැඩසටහන් | 11 | 288 |
| 8 | ළමා මූලික වැඩසටහන් | 24 | 773 |
| 9 | සෞඛ්‍යය වැඩසටහන් | 47 | 3,276 |
| 10 | සෞඛ්‍යය හා ආරක්ෂාව | 17 | 654 |
| 11 | මධ්‍යසාර සහ මත්ද්‍රව්‍ය නිවාරණය | 29 | 2,057 |
| 12 | පරිසරය ආරක්ෂා කිරීම | 25 | 869 |
| 13 | සැමරුම් වැඩසටහන් | 21 | 1,233 |
| 14 | පෝෂණය | 13 | 415 |
| 15 | ස්ත්‍රී පුරුෂ සමානාත්වය | 18 | 1,095 |
| 16 | ජීවනෝපාය සංවර්ධනය | 37 | 836 |
| 17 | සමාජ හා ප්‍රජා මූලික වැඩසටහන් දැනුවත් කිරීම, ජංගම සේවා, තරුණ වැඩසටහන් පැවැත්වීම | 84 | 3,668 |
| | **සමස්ථ ප්‍රතිලාභීන් සංඛ්‍යාව** | | **39,524** |

### ➢ වැවිලි මානව සංවර්ධන භාරය (PHDT)

වැවිලි අංශයේ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම උදෙසා, 1992 සැප්තැම්බර් මස 18 වන දින 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ, ලියාපදිංචි සමාගමක් වශයෙන් "වතු නිවාස හා සමාජ සංවර්ධන භාරය" පිහිටුවන ලදී. 1992 දී රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තියකට අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB), ඇල්කඩුව වැවිලි සමාගම සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (SLSPC) , යටතේ ඇති වැවිලි සමාගම්, ප්‍රාදේශීය වැවිලි සමාගම් 23ක් යටතේ ඔවුන්ගේ කළමනාකාරීත්වය පැවරීම මගින් පෞද්ගලීකරණය කරන ලදී. පෞද්ගලීකරණයෙන් පසු කෙටි කාලයක් තුළ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, වැවිලි ප්‍රජාවගේ සෞඛ්‍ය, සමාජ සුභසාධන සහ ජීවනෝපාය කටයුතු වැඩිදියුණු කිරීම සඳහා වතු නිවාස හා සමාජ සංවර්ධන අරමුදල (PHSWT) ලෙස ඒකාබද්ධ කරන ලදී. 2002 ඔක්තෝබර් 10 වන දින මෙම සංවිධානය වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) ලෙස ප්‍රතිනාමගත කරන ලද අතර, මෙම භාරය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත. වතු ප්‍රජාවගේ යහපත උදෙසා පිහිටුවා ඇති මෙම ආයතනය, යටිතල පහසුකම් හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් මෙහෙයවීමට රජයේ අදාල අමාත්‍යාංශ, වෘත්තීය සමිති, ප්‍රාදේශීය වැවිලි සමාගම්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

- **ප්‍රජා යටිතල පහසුකම් අංශයේ ප්‍රතිපාදන හරහා වැවිලි මානව සංවර්ධන භාරය විසින් සිදුකරනු ලබන සංවර්ධන කටයුතු වල ප්‍රගතිය**

රටේ ආර්ථිකයට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන වැවිලි ප්‍රජාවගේ සමාජීය හා ආර්ථික සංවර්ධනයේ වැදගත්ම අවශ්‍යතාවයක් වන යටිතල පහසුකම් සංවර්ධනය සපුරාලීම සඳහා වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය ප්‍රමුඛත්වය ගෙන ඇති අතර, 2025 දී ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ හවුල්කරු ලෙස වැවිලි මානව සංවර්ධන භාරය කටයුතු කරනු ලබයි. මේ යටතේ වැවිලි ප්‍රජාව ඉලක්ක කර ගනිමින් නිවාස ඒකක 336 ක් ඉදිකිරීම සඳහා අරමුදල් වෙන් කර ඇත. තවද, දරිද්‍රතාවය පිටුදැකීම, සෞඛ්‍ය හා පෝෂණය වැඩිදියුණු කිරීම, වකුගඩු රෝග වැළැක්වීම, මත්ද්‍රව්‍ය වැළැක්වීම, පාරිසරික සංරක්ෂණය සහ ජල මූලාශ්‍ර සංරක්ෂණය වැනි අමාත්‍යාංශ අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී වැවිලි මානව සංවර්ධන භාරය සැලකිය යුතු දායකත්වයක් සපයයි.

- **වතු නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය**

අමාත්‍යාංශය මගින් ශ්‍රී ලංකා රජයේ අරමුදල් උපයෝගී කරගනිමින් 2025 වර්ෂයේදී නිවාස ඉදිකිරීම සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීමට වැවිලි මානව සංවර්ධන භාරය කටයුතු කරන ලදී. 2025 වර්ෂයේදී නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වශයෙන් රු. මි. 660.36 ක් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද අතර, 2025.12.31 දිනට එහි ප්‍රගතිය පහතින් දක්වා ඇත.

| ප්‍රාදේශීකය | අවිච්ඡේද නිවාස **2020/2021** | අවිච්ඡේද නිවාස **2018** | අවිච්ඡේද නිවාස **2017** | මුළු නිවාස ඒකක ගණන | ව්‍යාපෘති වටිනාකම (රු.මිලි) | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | සම්පූර්ණ කරන ලද නිවාස ඒකක ගණන | ක්‍රියාත්මක වෙමින් පවතින නිවාස ඒකක ගණන |
| ගාල්ල | - | - | 21 | 21 | 11.8 | - | 21 |
| රත්නපුර | - | - | - | - | - | - | - |
| බදුල්ල | - | - | - | - | - | | - |
| කෑගල්ල | 20 | - | - | 20 | 49.9 | - | 20 |
| මහනුවර | 53 | 28 | 28 | 109 | 151.7 | 30 | 79 |
| හැටන් | 12 | 60 | 30 | 102 | 207.8 | 38 | 64 |
| නුවරඑළිය | 39 | 45 | - | 84 | 161.6 | 46 | 38 |
| එකතුව | **124** | **133** | **79** | **336*** | **582.8** | **114** | **222** |

*මෙම නිවාස 336ට අමතරව අවිච්ඡේද නිවාස 61ක් 2025 වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා 2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා සැළසුම් කර ඇත.

## යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ජල ව්‍යාපෘති වැඩසටහන

**2025.12.31** දිනට ජල ව්‍යාපෘති වැඩසටහනට අදාල ප්‍රගතිය

| ප්‍රදේශීකය | පිරිසිදු පානීය ජලය සැපයීම | | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | වටිනාකම (රු.මි.) | සම්පූර්ණ කළ සංඛ්‍යාව | ක්‍රියාත්මක වෙමින් පවතින සංඛ්‍යාව |
| ගාල්ල | - | - | - | - |
| රත්නපුර | 02 | 4.7 | - | 02 |
| බදුල්ල | - | - | - | - |
| කෑගල්ල | 01 | 4.0 | - | 01 |
| මහනුවර | 07 | 24.4 | - | 07 |
| හැටන් | 15 | 103.8 | - | 15 |
| නුවරඑළිය | 10 | 32.2 | - | 10 |
| එකතුව | **35** | **35** | **169.1** | **35** |

## යටිතල පහසුකම් ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ ජල ව්‍යාපෘති වැඩසටහන

**2025.12.31** දිනට ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ ජල ව්‍යාපෘති වැඩසටහන අදාළ ප්‍රගතිය

| ප්‍රාදේශීකය | පිරිසිදු පානීය ජලය සැපයීම | | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | වටිනාකම (රු.මි.) | සම්පූර්ණ කළ සංඛ්‍යාව | ක්‍රියාත්මක වෙමින් පවතින සංඛ්‍යාව |
| ගාල්ල | 03 | 16.9 | - | 03 |
| රත්නපුර | 02 | 11.6 | 01 | 01 |
| බදුල්ල | 06 | 48.7 | - | 06 |
| කෑගල්ල | 01 | 4.0 | 01 | - |
| මහනුවර | 10 | 50.4 | 03 | 07 |
| හැටන් | 08 | 67.3 | - | 08 |
| නුවරඑළිය | 13 | 70.1 | 03 | 10 |
| එකතුව | **43** | **269.0** | **08** | **35** |

## විශේෂ ව්‍යාපෘති වැඩසටහන් වලට අදාළ ප්‍රගතිය

| ප්‍රාදේශීකය | ළමා සංවර්ධන මධ්‍යස්ථාන (CDCs) බලගැන්වීම | | නැවත වහළ සෙවිළි කිරීමේ ව්‍යාපෘතිය | | Clean Sri Lanka වැඩසටහන | | භෞතික/මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | වටිනාකම (රු.මි.) | සම්පූර්ණ කළ ඒකක සංඛ්‍යාව | වටිනාකම (රු.මි.) | සම්පූර්ණ කළ ඒකක සංඛ්‍යාව | වටිනාකම (රු.මි.) | සම්පූර්ණ කළ ඒකක සංඛ්‍යාව | වටිනාකම (රු.මි.) |
| ගාල්ල | - | - | 82 | 8.5 | 12 | 14.6 | 09 | 85 |
| රත්නපුර | - | - | 54 | 5.0 | 12 | 12.3 | 11 | 55 |
| බදුල්ල | 06 | 18.6 | 238 | 26.6 | 11 | 10.6 | 08 | 247 |
| කෑගල්ල | - | - | 36 | 3.1 | 08 | 4.4 | 08 | 36 |
| මහනුවර | - | - | 70 | 6.3 | 25 | 28.2 | 19 | 76 |
| හැටන් | - | - | 182 | 15.3 | 06 | 7.4 | 01 | 187 |
| නුවරඑළිය | - | - | 74 | 5.1 | 05 | 4.1 | 03 | 76 |
| **එකතුව** | **06** | **18.6** | **736** | **69.9** | **79** | **81.6** | **59** | **762** |

- **වැවිලි කලාප සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය (NEVIDA)**

වැවිලි ප්‍රජාවගේ උන්නතිය සඳහා ක්‍රියාත්මක වන සංවර්ධන කටයුතු කඩිනමින් ඉටු කිරීමේ අරමුණින් 2018.06.25 දින, "වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය" පිහිටුවන ලදී. ඊට අදාලව 2018 අංක 32 දරණ පනත, පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද අතර, එහි මෙහෙයුම් කටයුතු 2019 පෙබරවාරි 07 දින සිට ආරම්භ කරන ලදී. අධිකාරියේ කළමණාකාරීත්වය 13 දෙනෙකුගෙන් සැදුම්ලත් කළමණාකරණ මණ්ඩලයකින් සමන්විත වන අතර, ගරු අමාත්‍යතුමා විසින් මෙහි සභාපති පත් කරනු ලබයි. එසේම "අධ්‍යක්ෂ ජනරාල්" අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර, කාර්යය මණ්ඩලයේ තනතුරු 28කි.

## 2.4 2026 වර්ෂයේදී වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට යෝජිත ක්‍රියාකාරකම්

### 2.4.1 වැවිලි අංශය

**තේ ක්ෂේත්‍රය**

- තේ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීමට ඉදිරි පස් වසර සඳහා සකස් කරන උපායමාර්ගික සැලැස්මට අනුව කටයුතු කිරීම හා තේ කර්මාන්තය සඳහා පාලන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා වන ජාතික උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම මෙහෙයවීම සඳහා තේ කර්මාන්තයේ පාර්ශ්වකරුවන්ගෙන් සැදුම්ලත් ජාතික කමිටුවක් පිහිටුවීම සහ ජාතික කමිටුවට සහය වීම සඳහා ඒකකයක් පිහිටුවීම, නීති හා රීතිවල උචිතභාවය නිර්දේශ කිරීම හා පාලන ව්‍යුහය නිර්දේශ කිරීම.
- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (SL GAP) ප්‍රමිති ලේඛනය සකස් කිරීම.
- ආදර්ශ තේ ගම්මාන 500ක් පිහිටුවීම යටතේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ගම්මාන 140ක් පිහිටුවීම සම්බන්ධීකරණය කිරීම.
- කුඩා තේ වගාකරුවන් සඳහා කාර්යසාධනය මත පදනම් වූ දිරි ගැන්වීමේ ක්‍රමවේදයක් අනුමත කර ගැනීම.
- සෙවන ශාක ද ඇතුළුව, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පැළ තවාන් ලියාපදිංචි කිරීම.
- තේ අංශයේ සහයෝගී පර්යේෂණ සඳහා උපදේශක කමිටු ශක්තිමත් කිරීම, පර්යේෂණ අධීක්ෂණය හා ඇගයීම් කිරීම හා පේටන්ට් බලපත්‍ර සඳහා පර්යේෂණ දිරිගැන්වීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම යටතේ පවත්වන ලද සමාලෝචන රැස්වීම් සහ සහයෝගී පර්යේෂණ සංඛ්‍යාව පිළිබඳව අධීක්ෂණය කිරීම.
- තේ කර්මාන්තයේ සියලුම පාර්ශ්වකරුවන් අතර වේගවත් සහ නිවැරදි තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා තාක්ෂණ හුවමාරුව / වාණිජකරණය සඳහා වන විනිවිද පෙනෙන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා ඇප් (APP) හඳුන්වා දීම.
- අගයදාම සංවර්ධනය සහ අගය එකතු කිරීම සඳහා හැකියාව තහවුරු කිරීමට වන රෙගුලාසි සකස් කිරීම.
- තේ සහ විවිධාංගීකරණය වූ නිෂ්පාදන ( පාරම්පරික හෝ ශිල්පීය ක්‍රම භාවිතයෙන් සකස් කරන ලද තේ) සමඟ සම්බන්ධ ක්‍රියාකාරකම් /පාරිසරික සංචාරක කර්මාන්තය සඳහා මඟ පෙන්වීම, මාර්ගෝපදේශ සහ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.
- ඩිජිටල් අලෙවිකරණය සහ විද්‍යුත් වාණිජ්‍යය පහසු කිරීම සඳහා පවතින රෙගුලාසි සමාලෝචනය කිරීම හා සංශෝධනය කිරීම තුළින් නව හෝ සංශෝධිත රෙගුලාසි සකස් කිරීම.
- දේශගුණික වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව නැංවීම සඳහා ජාතික තේ අගය දාමය සඳහා ගෝලීය වශයෙන් පිළිගත් ශ්‍රී ලංකාවේ තිරසර ප්‍රමිතීන් සකස් කර අනුමත කිරීම.
- පුනර්ජනනීය කෘෂිකර්මාන්තය සඳහා මාර්ගෝපදේශයක් සකස් කිරීම.

- තේ වගාව මගින් සිදුවන වන විනාශය (Deforestation) වැළැක්වීම සඳහා මාර්ගෝපදේශයක් සකස් කිරීම.
- ප්‍රධාන ජීව හා අජීවී ආතතීන් ( biotic and abiotic stresses) සහ ආන්තික දේශගුණික තත්ත්වයන්ට එරෙහිව බෝග රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා මාර්ගෝපදේශයක් සකස් කිරීම.
- තේ පාර්ශ්වකරුවන් සවිබල ගැන්වීම සඳහා තොරතුරු ඉදිරිපත් කිරීමට යාන්ත්‍රණයක් හඳුන්වා දීම.
- තේ වගාකරන ප්‍රදේශයන්හි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට දායකයින් / මූල්‍ය ආයතන හඳුනා ගැනීම සහ අවබෝධතා ගිවිසුම් ඇති කර ගැනීම.

## රබර් ක්ෂේත්‍රය

- **යුරෝපා සංගමයේ (EU) අරමුදල් මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිය (Agri Green Initiative Project) සඳහා ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීම**
  - යුරෝපා සංගමයේ අරමුදල (EU) මගින් 2026-2028 දක්වා තිරසර, පරිසර හිතකාමී සහ හරිත ආර්ථික ප්‍රවර්ධනය අරමුණු කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත. Agree Green Initiative ව්‍යාපෘතිය කුඩා රබර් වගාකරුවන්ගේ ඵලදායිතාවය හා ආදායම ඉහළ නැංවීම, කාන්තාවන් හා තරුණයින් ශක්තිමත් කිරීම, ආහාර සුරක්ෂිතතාවය වැඩි කිරීම සහ පරිසර සංරක්ෂණයක් ඇති කිරීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතියේ අවශ්‍ය සම්බන්ධීකරණ සිදු කිරීම.
  - මෙම සියලු ප්‍රදේශවල රබර් වගාව විශාල වශයෙන් පවතින දිසා ලේකම් කොට්ඨාස කේන්ද්‍ර කරගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.
- **රබර් වගාව සඳහා යහපත් කෘෂිකාර්මික ප්‍රමිතීන් (GAP) කෙටුම්පත් කිරීම**
  - මෙරට රබර් වගාව වඩාත් තිරසර සහ ගුණාත්මක වගාවක් බවට පත් කිරීම සඳහා ප්‍රමිතිගත යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP ) සකස් කිරීම, 2025 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර, ඒ අනුව 2026 වසර තුළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කටයුතු කරන පාර්ශවකරුවන් හා අනෙක් ආයතන හා විශේෂයෙන් මේ සම්බන්ධයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නියෝජිතයන් ගෙන් ද සමන්විත කමිටුවක් මගින් සාකච්ඡා කරමින් ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සමාලෝචනයක් කරමින් ප්‍රමිතීන් සකස් කිරීමේ මුල් අදියර ලෙස සිදු කිරීමට නියමිතය.
- **ජාතික රබර් අංශයේ මාර්ග සිතියම 2026 – 2030 සඳහා කැබිනට් අනුමැතිය ලබාගැනීම**
  - රබර් ක්ෂේත්‍රයේ තිරසරභාවය, ඵලදායිතාවය හා ගුණාත්මකභාවය වඩාත් තහවුරු කිරීමටත්, එමඟින් ක්ෂේත්‍රයේ අගයදාම සංවර්ධනය හා මෙරට රබර් කර්මාන්තය ලෝකය තුළ සන්නාමයක් බවට පත් කිරීමට රබර් මාර්ග සිතියමක් කෙටුම් පත් කිරීම 2025 වර්ෂයේ දී සිදු කළ අතර, එම කෙටුම් පත විධිමත් පරිදි අනුමත කර ගැනීම සඳහා ජාතික රබර් මාර්ග සැලැස්මේ කෙටුම්පතේ කටයුතු අවසන් කර, ඊට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය ද සකස් කර අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට 2026 වසරේදී මුල් භාගය තුළ ඉටු කිරීමට සැලසුම් කර ඇත.

- **රබර් අංශය සඳහා ජාතික පර්යේෂණ දත්ත ගබඩාවක් (database) ස්ථාපිත කිරීම**
  - රබර් ක්ෂේත්‍රය සඳහා ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය හා වෙනත් දේශීය විශ්ව විද්‍යාල මඟින් විවිධ පර්යේෂණ රැසක් සිදු කර ඇති අතර, මෙරට ප්‍රධාන වැවිලි බෝගයක් හා අපනයන ආදායම උපයන ක්ෂේත්‍රයක් ලෙස රබර් ආශ්‍රිතව පවතින පර්යේෂණ දත්ත එම වගාව හා කර්මාන්තය නඟා සිටුවීම ට යොදා ගැනීම අත්‍යවශ්‍ය බැවින් විසිර පවතින රබර් ක්ෂේත්‍රය සම්බන්ධ සියළු පර්යේෂණ තොරතුරු එක් රැස් කර දත්ත සමුදායක් ලෙස යාවත්කාලීනව පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් කටයුතු ආරම්භ කිරීම .

## පොල් ක්ෂේත්‍රය

- කාලීන අවශ්‍යතාවය මත නව රෙගුලාසි ඇතුලත් කිරීමට හැකිවන ලෙසට 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීමට කටයුතු ආරම්භ කර ඇති අතර, එමඟින් ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම මෙන්ම පොල් සංවර්ධන පනත ද සංශෝධනය කිරීමට අපේක්ෂිතය. විශේෂයෙන් පොල් සංවර්ධන පනත මඟින් පොල් සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති බලතල අනුව, පොල් වෙන්දේසිය සඳහා නීති මාලාවක් සකස් කිරීමට පනත සංශෝධනය කිරීමට අපේක්ෂිතය.
- 2030 වන විට රටෙහි පොල් අවශ්‍යතාවය වන ගෙඩි මිලියන 4,200ක් සැපයීම සහ අපනයන ආදායම ඇ.ඩො.මි. 1,500ක් දක්වා ඉහළ නැංවීම ප්‍රධාන අරමුණු කර, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO) හා ප්‍රතිශක්ති අධ්‍යයන ආයතනය (IPS) සමඟ ක්ෂේත්‍රයේ සියළු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් පොල් ක්ෂේත්‍රයේ දස අවුරුදු මාර්ග සැලැස්ම හා පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේ කටයුතු අවසන් කිරීම.
- පොල් ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා විදේශීය දේශීය පුහුණුව හා දැනුවත් කිරීම සම්බන්ධව අවශ්‍ය සහාය ලබා දීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය සංස්ථා (International Finance cooperation) සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත. ඒ අනුව, ලැබෙන ආධාර මුදල ඇ.ඩො. 200 ,000.00කි. ඒ සඳහා අනුබද්ධ ආයතන සමඟ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කිරීම.
- හරිත දේශගුණික අරමුදල (Green Climate Fund) මඟින් පොල් ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා දායකත්වය ලබා ගත හැකි ආකාරය සම්බන්ධව සාකච්ඡා පවත්වා ඉදිරි කටයුතු කිරීම.
- උපපෂ්ඨිය ජල සම්පාදන පද්ධතීන් සකස් කිරීමට අදාළව වෙළඳ පහසුකම් සංවර්ධන ආයතනය (Marketing Development Facility) සමඟ සාකච්ඡා පවත්වා, ජාතික ණය සුරැකුම් ආයතනය සමඟ සාකච්ඡා කර, ක්ෂුද්‍ර, සුළු හා කුඩා පරිමාණ වගාකරුවන් හා කර්මාන්තකරුවන්ට ඇපකර සහිත ණය ලබා ගැනීමේ යාන්ත්‍රණයක් සිදු කිරීම සම්බන්ධව සාකච්ඡා පවත්වන අතර, එහි ඉදිරි කටයුතු සිදු කිරීම.

## 2.4.2. 2026 වර්ෂයේදී ප්‍රජා යටිතල පහසුකම් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට යෝජිත ක්‍රියාකාරකම්

➢ **වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය**

01. වැවිලි ප්‍රජාව සඳහා ඉඩම් හිමිකම් තහවුරු කිරීමේ අරමුණින් ඉඩම් සහ ඔප්පු නිකුත් කිරීමේ වැඩසටහන යටතේ ඔප්පු සකස් කිරීම, නිවාස ව්‍යාපෘති සමීක්ෂණ සහ වැවිලි කලාප සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය (NEVIDA) යටතේ නම් කළ භූමි සීමා නිර්ණය කිරීම සිදු කිරීම.
02. දත්ත සහ ක්ෂේත්‍ර සමීක්ෂණ වැඩසටහන යටතේ ජංගම දුරකථන යෙදුමක් භාවිතා කරමින් වැවිලි නිවාස දත්ත එකතු කිරීම, පේළි නිවාස (line-room) සමීක්ෂණ සහ දත්ත වල නිරවද්‍යතාව තහවුරු කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම.
03. නව ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ රත්නපුර, කොළඹ, බදුල්ල, මොණරාගල, මහනුවර, මාතලේ සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල නව ගම්මාන සංවර්ධනය කිරීම, යටිතල පහසුකම් සැපයීම සහ උපකරණ ලබාදීම.
04. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ කිරි ගම්මාන සංවර්ධනය, නව කිරි ගම්මාන ආරම්භ කිරීම සහ වැවිලි කලාපවල අතිරේක ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැළසුම් කිරීම.
05. වැවිලි කලාපයේ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂ හා කුඩා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අවදානම් කණ්ඩායම් සඳහා විශේෂ මැදිහත්වීම් සිදු කිරීම සහ භූමි හා ජල සම්පත් වලට සිදුවන භෞතික හානි අවම කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
06. වැවිලි තරුණයින් සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන් යටතේ වෘත්තීය හා තාක්ෂණික පුහුණු වැඩසටහන්, ප්‍රජාශක්ති මධ්‍යස්ථාන සංවර්ධනය සහ හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය (TVTC) හා ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) ආයතන සමඟ එක්ව සහතික පදනම් වූ පුහුණු ලබාදීමට කටයුතු කිරීම.

වැවිලි කලාපයේ මහජන සේවා වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිතව මූලික රාජ්‍ය සේවාවන් වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ අමාත්‍යාංශ හා පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණය කර යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සැළසුම් කිරීම.

## 2.5 අමාත්‍යාංශය මගින් සිදු කරන ලද වෙනත් විශේෂ ක්‍රියාකාරකම්

### 2.5.1. වැවිලි අංශය

**සැලසුම් අංශය**

- **විශේෂ සංවර්ධන ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම**
  - වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනය හා ඵලදායීතාවය ඉහළ නැංවීමට අදාළ ව්‍යාපෘති යෝජනා 22 ක් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශයට යොමු කරන ලදී.

- **ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම**
  - ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වැවිලි ක්ෂේත්‍රයේ කාර්යසාධනය සඳහා වර්ෂය තුළ ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳ හා ක්‍රියාකාරකම් සම්බන්ධව වාර්ෂිකව තොරතුරු හා දත්ත වාර්තා කිරීම.
  - වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රගතිය ඇතුළත් මාසික වාර්තා මහා භාණ්ඩාගාරය වෙත හා වෙනත් ආයතන වෙත යොමු කිරීම.

- **අමාත්‍යාංශයීය ප්‍රකාශන සැකසීම**
  - අමාත්‍යාංශයීය කාර්යසාධන වාර්තාව - 2024 සහ 2025 අමාත්‍යාංශීය ප්‍රගති වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට යොමු කිරීම.
  - වැවිලි ක්ෂේත්‍රය පිළිබඳ දත්ත ඇතුළත් සංඛ්‍යාලේඛන අත්පොත - 2023 සැකසීම.

- **ක්‍රියාත්මක සැලසුම් සැකසීම**
  - 2025 අමාත්‍යාංශයීය ක්‍රියාත්මක සැලැස්ම හා සංශෝධිත ක්‍රියාත්මක සැලැස්ම සකසා අනුමත කර ගැනීම.
  - අමාත්‍යාංශය සඳහා සෘජුව ප්‍රතිපාදන ලැබෙන සංවර්ධන ව්‍යාපෘතිවල ක්‍රියාත්මක සැලසුම් හා සංශෝධිත ක්‍රියාත්මක සැලසුම් සකසා අනුමත කිරීම.
  - අනුබද්ධ ආයතනවල ක්‍රියාත්මක සැලසුම් සමාලෝචනය හා ක්‍රියාත්මක ප්‍රගතිය පිළිබඳ මෙහෙයුම් කටයුතු සිදුකිරීම.

- **විශේෂ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය**
  - අමාත්‍යාංශයට සෘජුව ප්‍රතිපාදන ලැබෙන ව්‍යාපෘතීන්ට අදාළව ප්‍රගතිය සමාලෝචනය කිරීම.
  - අමාත්‍යාංශයන්ට අනුබද්ධ ආයතනයන්හි ක්‍රියාත්මක සැලසුම් අනුව කාර්තුමය ප්‍රගතිය සමාලෝචනය කිරීම.

- **අභ්‍යන්තර විගණනයට අදාළව සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්**
  - අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සංඛ්‍යාව - 29
  - අනුබද්ධ ආයතනයන් සම්බන්ධව සිදුකරන ලද විශේෂ පරීක්ෂණ සංඛ්‍යාව - 10
  - අනුබද්ධ ආයතනයන් සම්බන්ධව සිදු කරන ලද ක්ෂේත්‍ර සංඛ්‍යාව - 10
  - අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් - 04
  - අනුබද්ධ ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගීවීම - 52

## 2025.12.31 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද යටිතල පහසුකම් සංවර්ධනය ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු

- **වතු තරුණ තරුණියන්ට විරැකියාවෙන් මිදීම සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම**

හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය (TVTC) මගින් සිසුන්ට වෘත්තිය පුහුණුව ලබා දෙමින් ඔවුන්ගේ ජීවනෝපාය වෙනුවෙන් කුසලතා වර්ධනට ගැහැණු සහ පිරිමි ලෙස වෙනම නේවාසිකාගාර, නවීන උපකරණ සහිත ශාලා පහසුකම් ඇතුළු අමතර පහසුකම් සපයයි. සියලුම පුහුණුකරුවන් සඳහා ආහාර සහ නවාතැන් පහසුකම් නොමිලේ සපයනු ලැබේ. හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය (TVTC) හි පුහුණුකරුවන් සඳහා පාඨමාලා සම්පූර්ණ කිරීම සඳහා ජාතික වෘත්තිය සුදුසුකම (NVQ) සහතිකය ලබා දෙනු ලැබේ.

- **පානිය ජල පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් නොමැති ලයින් නිවාස සහ වතුකරයේ පාසල් සඳහා පිරිසිදු පානිය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාදීම.**

ජල උල්පත් ආශ්‍රිත කඳුකර ප්‍රදේශවල ජීවත් වන වැවිලි ප්‍රජාව වෙත සෞඛ්‍යාරක්ෂිත පානිය ජලය ලබාගැනීමට නොහැකි වීම ප්‍රධාන ගැටලුවකි. එම අවධානමෙන් ජනතාව මුදවා ගැනීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. 2024 වර්ෂයේදී සෞඛ්‍යාරක්ෂිත පානිය ජල ව්‍යාපෘති සිදුකර ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා එක්ව වැවිලි මානව සංවර්ධන භාරය විසින් ප්‍රජා යටිතල පහසුකම් අංශය මගින් ලබාදෙන නව නිවාස සඳහා සෞඛ්‍යාරක්ෂිත පානිය ජල පහසුකම් ලබාදීමට කටයුතු කරයි.

වැවිලි ප්‍රජාවගෙන් බොහෝ පිරිසක් සනීපාරක්ෂක පහසුකම් අවම වීමේ ගැටලුවට මුහුණ පා සිටී. ඒ අනුව ඉදි කරනු ලබන නව නිවාස සඳහා ජල පහසුකම් සහිත නව වැසිකිළියක් සහ ලැයින් කාමර වැසියන් සඳහා අවශ්‍යතාවය මත නව වැසිකිළි ලබාදීම සිදුකරයි.

- **වතු ජනතාව සඳහා ආගමික හා සංස්කෘතික පහසුකම් සහතික කිරීම**

වතු ප්‍රජාව යනු ආගමික සහ සංස්කෘතික කටයුතු සඳහා ඉතා ලැදියාවක් දක්වන ජන කොට්ඨාශයකි. ඔවුන් සිය එදිනෙදා ජීවන කටයුතු වලදී කෝවිල්, පන්සල්, පල්ලි, දේවස්ථාන යන ආගමික ස්ථානවල වන්දනාමාන කටයුතු කෙරෙහි නිරන්තරයෙන් යෙදෙන අතර සමාජ සංහිඳියාව සහ ප්‍රජා සමගිය සඳහා එය මනා පිටුවහලක් වේ. ඒ අනුව, වැවිලි ප්‍රජාවගේ ආගමික සහ සංස්කෘතික සංවර්ධනය උදෙසා ආගමික ස්ථාන වල අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරුණි.

- **ආපදාවලින් විපතට පත් වතු ජනතාවට සහන සේවා සැපයීම**

ආපදාවට ලක් වූ වතු ජනතාව සඳහා සහන සේවාවන් සැලසීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද අතර, 2024 වර්ෂයේදී විපතට පත් වූ ජනතාව සඳහා සෙවිලි තහඩු ලබා දීමේ ව්‍යාපෘතියක් සිදු කරන ලදි.

- **ප්‍රජා සවිබල ගැන්වීම සහ ජීවනෝපාය සංවර්ධනය රැකියා විරහිත වතු ජනතාවට ස්වයං රැකියා සඳහා පහසුකම් සැලසීම (පවුල් 25ක් සඳහා)**

සෞම්‍යමූර්ති තොණ්ඩමාන් ආයතනය මගින් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ වතුකරයේ තෝරාගත් ප්‍රතිලාභීන් 25 දෙනෙකු වෙත 2024.04.06 දින එළුවන් බෙදාදෙනු ලැබීය. . මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වතු ජනතාවගෙන් රැකියා විරහිත පුද්ගලයන්ට ස්වයං රැකියා අවස්ථා සැලසීම මගින් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ජීවන තත්ත්වය උසස් කිරීමයි. එළුවන් බෙදාදීමෙන් ඔවුන්ට කර්මාන්තයක නිරත විය හැකි

වන අතර, දිගුකාලීනව ආදායම් මාර්ගයක් බිහි කිරීමේ හැකියාව ඇතිවෙයි. මෙය වතු ප්‍රජාව සවිබල ගැන්වීම හා තිරසාර සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය පියවරක් ලෙස සැලකිය හැක.

- **ක්‍රීඩා ක්‍රියාකාරකම්, ක්‍රීඩා පිටි සහ පාසල් සංවර්ධනය**

මෙම ව්‍යාපෘතිය මඟින් ක්‍රීඩා සමාජ 48කට පාපන්දු බෙදාදීමේ කටයුතු සාර්ථකව අවසන් කර ඇත. මෙය තරුණයින්ගේ සමාජ සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා මූලික පියවරක් ලෙස හඳුනාගත හැක. එමෙන්ම, සමනල පෙර පාසලට ආරක්ෂක වැටක් ලබාදීම, ශාන්ත ෆ්‍රැන්සිස් දෙමළ විද්‍යාලයේ වහලය ප්‍රතිසංස්කරණය කිරීමද සිදු කරන ලදී. මෙම ව්‍යාපෘති සියල්ලම දරුවන්ගේ සමාජ, මානසික හා බුද්ධිමය වර්ධනයට සහය වන අයුරින් ක්‍රියාත්මක කර ඇත.

- **හැඳුනුම්පත් උප්පැන්න සහතික නිකුත් කිරීම**

හැඳුනුම්පත් සහ උප්පැන්න සහතික නිකුත් කිරීමේ වැඩසටහන යටතේ, ගාල්ල සහ කළුතර දිස්ත්‍රික්කයන්හි වැඩසටහන් 2 ක් සාර්ථකව ක්‍රියාත්මක කර අවසන් කර ඇත. මෙහිදී මුළු ප්‍රතිලාභීන් 139 දෙනෙකුට අවශ්‍ය ලේඛන නිකුත් කිරීම සිදුකරන ලදී. අයදුම්කරුවන්ගේ නීතිමය අනන්‍යතාවය සනාථ කිරීම සහ රාජ්‍ය සේවාවන් වෙත පහසුවෙන් පිවිසීමේ අවස්ථාව ලබාදීමේ අරමුණින් මෙය ක්‍රියාත්මක විය.

- **විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය ගුරු පුහුණුව**

ගුරු පුහුණු වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කළ ගුරුවරුන් 2,122 ප්‍රතිලාභීන් ලෙස හඳුනාගන්නා ලදී. පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ ගුරුවරුන්ගේ විෂය දැනුම සහ ඉගැන්වීමේ කුසලතා වර්ධනය කිරීමයි. මෙය සිසුන්ගේ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිත අධ්‍යාපනය තත්ත්වය වැඩිදියුණු කිරීමේ වැදගත් පියවරක් ලෙස සැලකේ. වැඩසටහන තුළ නව ඉගැන්වීම් විධිමත් ක්‍රම, උදාහරණ සහ තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ පුහුණු කිරීම ද සිදු විය.

- **තරුණ සමුළුව**

වතු ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200 ක් සැමරීමේ අවස්ථාවට සමගාමීව තරුණ සමුළුවක්, ශ්‍රී ලංකාවේ වතුකරයේ සහ අනෙකුත් ප්‍රජාවන්හි තරුණ තරුණියන් ඉලක්ක කරගෙන පැවති අතර, එය වතුකරයේ තරුණ ජනතාවගේ ආර්ථිකය හා අධ්‍යාපන අවස්ථාවන්හි පවතින හිඩැස පිරවීමටත්, අනෙකුත් තරුණ ප්‍රජාව සමඟ සම්බන්ධ වීම තුළින් ශ්‍රී ලාංකීය සමාජය ඒකාබද්ධ කිරීමත් අරමුණු කර ගෙන සිදුකරන ලදී. මෙම එක් දින තරුණ සමුළුව 2024 ජුනි 22 වන දින මහනුවර (ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේදී) හිදී 450 කට අධික පිරිසක් සහභාගිත්වයෙන් පැවැත්විය.

- **හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීම**

හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීමෙන් පුද්ගලයන්ට නීතිමය අයිතියක් ලැබේ. විශේෂයෙන්ම, ඔප්පු ප්‍රදානය කිරීම වතු කම්කරුවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම මෙන්ම ඔවුන්ගේ නිවෙස් පිහිටි ඉඩම් සම්බන්ධයෙන් නීතිමය අයිතිය ලබාදීම, සමාජ ආරක්ෂාව, අධ්‍යාපනික හා ආර්ථික වාසියන් ලබාදීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිතයි.

## 2.6. තේ, රබර්, පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය මඟින් සිදුකරන ලද විශේෂ ක්‍රියාකාරකම්

❖ **2025.12.31 දිනට අයදුම්පත් ලැබීම සමස්ත සාරාංශය**

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන | 15 |
| 2025.01.01 දිනට ඉදිරියට ගෙන ආ අයදුම්පත් | 196 |
| 2025.01.01 දින සිට 2025.12.31 දක්වා ලැබුණු අයදුම්පත් | 883 |
| 2025.12.31 දක්වා ලද මුළු අයදුම්පත් ගණන | 1,079 |
| පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත් ගණන | 777 |
| පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල මඟින් අනුමත කරන ලද අයදුම්පත් ගණන | 614 |
| ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් ගණන | 62 |
| ක්ෂේත්‍ර පරීක්ෂණ/ නීති උපදෙස් / වාර්තා ලබා ගැනීමට තීරණය වූ අයදුම්පත් ගණන | 42 |
| පනතට අදාල නොවන අයදුම්පත් ගණන | 50 |
| අභියාචනා තීරණ මත අනුමැතිය ලබා දුන් අයදුම්පත් | 9 |

❖ **ඉඩම් ඒකක අනුව අයදුම්පත් ලැබීම (2025.01.01 සිට 2025.12.31 දක්වා)**

| ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව | පවරනු ලබන ආකාරය | ඉල්ලුම් කළ ප්‍රමාණය | | | අනුමැතිය ලබාදුන් ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|---|
| | | අක්. | රූඩ්. | පර්. | අක්. | රූඩ්. | පර්. |
| 213 | තනි ඒකක | 2,750 | 1 | 16.96 | 1,957 | 0 | 26.13 |
| 345 | බැංකු උකස් | 3,896 | 1 | 33.14 | 3,364 | 2 | 37.93 |
| 521 | අනෙකුත් පැවරීම් | 9,866 | 0 | 18.37 | 4,765 | 1 | 33.94 |
| **1,079** | **එකතුව** | **16,512** | **3** | **28.47** | **10,087** | **1** | **18.00** |

❖ **දිස්ත්‍රික්ක අනුව ලැබී ඇති අයදුම්පත් පිළිබඳ විස්තරය (2025.01.01 සිට 2025.12.31 දක්වා)**

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 362 |
| පුත්තලම දිස්ත්‍රික්කය | 305 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 166 |
| ඉහත දිස්ත්‍රික්ක හැර අනෙකුත් දිස්ත්‍රික්ක | 246 |
| ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාව | 1,079 |
| වාර්තා ලබා ගැනීමට යොමුකර ඇති සහ අසම්පූර්ණ අයදුම්පත් | 291 |
| පැවරීම අනවශ්‍ය බව දන්වන ලද අයදුම්පත් ගණන | 11 |

❖ භෝග වර්ගයන්ට අනුව අයදුම්පත් ලැබීම

| අයදුම්පත් ලැබීම (2025.01.01 සිට 2025.12.31 දක්වා) | | | | |
|---|---|---|---|---|
| භෝග වර්ගය | අයදුම්පත් ගණන | ඉල්ලුම් කරන ලද භූමි ප්‍රමාණය | | |
| | | අක්. | රූඩ්. | පර්. |
| පොල් | 775 | 11,066 | 1 | 33.52 |
| රබර් | 48 | 784 | 3 | 31.14 |
| තේ | 46 | 2,124 | 0 | 23.45 |
| වෙනත් | 210 | 2,538 | 0 | 10.36 |
| **එකතුව** | **1,079** | **16,512** | **3** | **28.47** |

## 2.7. අමාත්‍ය මණ්ඩල තීරණ හා ඊට අදාළ ප්‍රගතිය

| අනු අංකය | ගනු ලැබූ විශේෂ ප්‍රතිපත්තිමය තීරණය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | 2025/04/28 දිනැති අංක අමප/25/0674/813/019 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පොල් කොළ කුණු වීම හෙවත් වැලිගම පොල් කොළ මැලවීමේ රෝගයට ගොදුරු වූ ගස් කපා හෙලීම. | වැලිගම පොල්කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගයට ගොදුරු වූ එක් ගසක් කපා හෙලීම වෙනුවෙන් ලබා දෙන වන්දි මුදල රු.3000 සිට රු.10,000 දක්වා ද රෝගයට ගොදුරු වූ පොල් ගසක් එන්නත් කරණය සඳහා රු. 10,000.00 බැගින් ද වැඩිකරන ලදී. ඊට අමතරව මෙම රෝග පාලන වැඩසටහනට තාවකාලිකව බඳවාගත් නිලධාරීන්ට ලබා දෙන දෛනික දීමනාව රු. 1700 සිට රු 3500 දක්වා වැඩි කරන ලදී. |
| 02 | 2025/02/03 දිනැති අංක අමප/25/0215/813/002-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දේශීය පොල් මද ආශ්‍රිත කර්මාන්තය හා පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට පියවර ගැනීම | දේශීය පොල් මද ආශ්‍රිත කර්මාන්තය හා පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා පියවරක් ලෙස ශිත කළ පොල් මද, කැබලි කර වියළන ලද පොල් (කොප්පරා නොවන), පොල් කිරි, පිටි කළ පොල් කිරි, දිසිදි පොල් ආනයනය කිරීමට අනුමැතිය ලබා දී ඇත. 2025.11.07 වන විට ආනයනය කර ඇති පොල් ප්‍රමාණය - පොල් කිරි මෙ.ටො. 20 කි. |
| 03 | 2025/03/10 දිනැති අංක අමප/25/038/813/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දේශීය පොල් තෙල් කර්මාන්තය ආරක්ෂා කිරීමට පියවර ගැනීම | අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් පරිදි, ගරු කම්කරු හා ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් "දේශීය පොල්තෙල් කර්මාන්තය ආරක්ෂා කිරීම සඳහා ගත යුතු පියවරයන් හඳුනා ගැනීම" සම්බන්ධ කමිටුව පත් කරන ලදී. ඒ අනුව, අදාළ කමිටුව රැස් වී, කමිටු නිර්දේශ ඇතුළත් කමිටු වාර්තාව සකස් කර, ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ඇත. |
| 04 | 2025/01/21 දිනැති අංක අමප/24/2319/813/006 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පොල් වගාව සඳහා මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) පොහොර බෙදා හැරීම. | අ.ම.ප 47/2024 හා අ.ම.ප 02/2025 සඳහා අමාත්‍ය මණ්ඩල එකඟතාවය ලැබී ඇත. ඒ අනුව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව අදාල ආයතන වෙත උපදෙස් ලබා දී ඇත.<br>2025.12.31 දින වන විට ප්‍රගතිය<br>- ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් ඇණවුම් කරන ලද පොහොර ප්‍රමාණය මෙ.ටො. 11,309.286කි.<br>- දිවයින පුරා බෙදා ඇති මුළු පොහොර ප්‍රමාණය, මෙ.ටො. 14,257.95කි.<br>- නිකුත් කිරීමට නියමිත පොහොර ප්‍රමාණය මෙ.ටො. 32,032.764 කි. |
| 05 | 2025/04/21 දිනැති අංක අමප/25/0610/813/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව තේ වගාව පුනරුත්ථාපනය උදෙසා තේ වගා කරුවන්ට පොහොර | මේ වන විට QR කේත 212, 859ක් ලබා දී ඇත. කුඩා තේ වතු සමිති හා තේ කර්මාන්තශාලා වල සහයෝගයෙන් QR කේත සකස් කිරීම, QR කේත පද්ධතිය ගබඩා කිරීම හා සත්කාරකත්වය සඳහා |

| | | |
|---|---|---|
| | සහනාධාර ලබා දීම | අවශ්‍ය පහසුකම් ලබා දීමට ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය වෙත සිදු කරන ලද ඉල්ලීමට අනුව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ගබඩා පහසුකම් සැපයීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. 2025.12.31 දින අවසානයේ ගොවීන් 252,883ක් QR කේතය ලබා ගැනීම සඳහා ගොවීන් වෙත මෙ.ටො. 18,095ක් පොහොර ලබා දී ඇත. |
| 06 | 2025/08/11 දිනැති අංක අමප/25/1378/813/031-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාත්‍යන්තර වෙළෙඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා රබර් ඉඩම් සිතියම්ගත කිරීමේ /ලියාපදිංචි කිරීමේ ඩිජිටල් පද්ධතිය ඵලදායි ලෙස යොදා ගනිමින් රබර් කර්මාන්ත අංශය නවීකරණය කිරීම | (i) ඒ අනුව, රබර් ඉඩම් සිතියම්ගත කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, 2025.08.27 වන දින ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී. |
| 07 | 2025/06/02 දිනැති අංක අමප/25/0860/813/025 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඌන උපයෝජිත ඉඩම් හා දේපළ ප්‍රශස්ත උපයෝජනය සඳහා සුදුසු ආයෝජකයන් වෙත ලබා දීම | ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවක් සහ යෝජනා ඇගයීම් කමිටුවක් පත් කර ඇත. ආයෝජකයින්ගෙන් අභිලාෂය කැඳවීමේ කටයුතු 2025.09.25 දින අවසන් කරන ලදි. ( ඒ සඳහා ලැබුනු 470 ක් ඇගයීම් කර අවසන් කර ඇත) කෙටි ලැයිස්තුගත කරන ලද ආයතනවලින්/පුද්ගලයින්ගෙන් යෝජනා සඳහා වන ඉල්ලීම් (RFP) කැඳවා ඇති අතර, 2026.02.23දින එම යෝජනා බාර ගැනීම අවසන් කිරීමට නියමිතය. |
| 08 | 2025/04/28 දිනැති අංක අමප/25/0676/813/021 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් විෂය පථයට අදාළව 2025 වර්ෂය තුළ හඳුන්වා දීමට අපේක්ෂිත නව නීති හා පවත්නා පනත් ආශ්‍රිතව සිදු කිරීමට අපේක්ෂිත සංශෝධන ක්‍රියාත්මක කිරීම. | |
| | I. 1956 අංක 11 දරන රබර් පාලන සහ සංශෝධනය කිරීම | අනුමැතිය ලැබී ඇත |
| | II. 1958 අංක 02 දරන තේ, රබර් සහ පොල් වතු කැබලි කිරීමේ පාලන පනත සංශෝධනය කිරීම | "අමාත්‍ය මණ්ඩල සංදේශය කෙටුම්පත් කර ඇති අතර එහි ඇතුළත් කරුණක් සංශෝධනය කිරීමට ගරු අමාත්‍යතුමා විසින් දන්වා ඇත. ඒ අනුව, අදාළ කරුණ සංශෝධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඒ අනුව කටයුතු කිරීමට නියමිත බව දන්වන ලදි." |
| | III. 1957 අංක 51 තේ පාලන පනත සංශෝධනය කිරීම | තේ පාලන පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවීමෙන් අනතුරුව නිරීක්ෂණ යොමු කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. ඒ අනුව නිරීක්ෂණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත දන්වා යවා ඇත. |

| | | |
|---|---|---|
| | IV. 2025 අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පනත සංශෝධනය කිරීම | තීරණය ලබා දීම කල් තබා ඇත. |
| | V. 1971 අංක 24 දරන පොල් සංවර්ධන පනතට කාලීන අවශ්‍යතාව මත නව රෙගුලාසි ඇතුළත් කිරීමට හැකි වන පරිදි එම පනතට සංශෝධන ගෙන ඒම | "1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනත" ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ සංශෝධනය කළ යුතුව ඇති බවත්, එම යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේදී පනත් සංශෝධනය මෙන්ම නව පනත් ඇති කිරීම සම්බන්ධයෙන්ද යොජනා ඉදිරිපත් කරන බවත්, අතිරේක ලේකම් (පොල් හා ආශ්‍රිත බෝග සංවර්ධන විසින් කරුණු දන්වා 2025.09.30 දින අභ්‍යන්තර සටහනක් යොමු කර ඇත) |
| | VI. 1975 අංක 14 දරන තේ මණ්ඩල පනතේ (ආනයන අපනයන) නියෝග සංශෝධනය | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද රෙගුලාසි සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (SLTB )සභාපතිතුමාගේ අත්සනද සහිතව එම රෙගුලාසිය පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය කෙටුම්පත් කිරීමට අදාළව පසුබිම් තොරතුරු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |
| 09 | 2025/11/03 දිනැති අංක අමප/25/2019/813/0044-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ස්වභාවික ආපදා වලින් වාසස්ථාන අහිමි වූ වැවිලි ප්‍රජාව සඳහා නව නිවාස ලබා දීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂයේ ඉතිරි වන ප්‍රතිපාදන වතු ප්‍රදේශවල පවතින ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යොදා ගැනීමට අනුමැතිය ඉල්ලීම. | මේ වනවිටත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මි.500ක් වෙන්කර ඇත. ඒ අනුව, බදුල්ල, මොණරාගල, රත්නපුර, කෑගල්ල, නුවරඑළිය, මහනුවර, මාතලේ, ගාල්ල, මාතර, කළුතර, සහ කොළඹ දිස්ත්‍රික් සඳහා මාර්ග සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමට රු.මිලි. 427.45ක ප්‍රතිපාදන නිදහස් කර ඇත.<br><br>2025.12.31 දිනට ප්‍රගතිය<br>මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා මුළු වියදම රු.196.13 කි. |
| | **ප්‍රජා යටිතල පහසුකම් අංශය** | |
| 10 | 2025/10/07 දිනැති අංක අමප/25/1827/813/044 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ස්වභාවික ආපදා වලින් වාසස්ථාන අහිමි වූ වැවිලි ප්‍රජාව සඳහා නව නිවාස ලබා දීමේ වැඩසටහනේ කාලසීමාව දිගු කිරීම සහ ප්‍රතිපාදන වැඩි කිරීම සඳහා අනුමැතිය ඉල්ලීම. | මේ වනවිටත් ස්වභාවික ආපදා හේතුවෙන් වාසස්ථාන අහිමි වූ වැවිලි ප්‍රජාව සඳහා නව නිවාස ලබා දීමේ වැඩසටහන සඳහා බදුල්ල, මොණරාගල, රත්නපුර, කෑගල්ල, නුවරඑළිය, මහනුවර, මාතලේ, මාතර, කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත රු.මි. 853.15ක ප්‍රතිපාදන නිදහස් කර ඇත. එසේම, 2026 වර්ෂය සඳහා මෙම වැඩසටහන යටතේ රු. මිලි. 1,200ක ප්‍රතිපාදන ඉල්ලා ඇත.<br><br>2025.12.31 දිනට ප්‍රගතිය මුළු වියදම රු.323.27 කි. |
| 11 | 2025/03/24 දිනැති අංක අමප/25/0438/813/016 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වැවිලි ස්වයංරැකියා චක්‍රිය අරමුදල වසා දැමීම | ස්වයං රැකියා චක්‍රීය අරමුදල සඳහා ඇවරකරු ලෙස පත් කරන ලද අමාත්‍යාංශයේ ගණකාධිකාරීගේ නිර්දේශ පරිදි චක්‍රීය අරමුදල වෙනුවෙන් ලංකා බැංකුවේ පවත්වාගෙන යන ලද අංක 21960011 දරණ |

| | | |
|---|---|---|
| | | නිල බැංකු ගිණුම වසා දැමීමට පියවර ගන්නා ලදි. |
| 12 | 2025/10/07 දිනැති අංක අමප/25/1817/813/042 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉන්දියානු රජයේ මධ්‍ය පරිමාණ ප්‍රධාන අධාර යටතේ වැවිලි ප්‍රජාව සඳහා නිවාස 4000ක් ඉදි කිරීම | 2025.12.31 දින වන විට මෙම නිවාස 14හි ප්‍රගතිය පහත පරිදි වේ.<br>1. බෙන්තොට වත්තේ නිවාස 09න් නිවාස 04ක අත්තිවාරම් දමා ඇත.<br>2. වලහන්දුව වත්තේ නිවාස 05හි වහලය ගසා නිම කර ඇත. |
| 13 | 2025/10/07 දිනැති අංක අමප/25/1827/813/044 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ස්වභාවික ආපදා වලින් වාසස්ථාන අහිමි වූ වැවිලි ප්‍රජාව සඳහා නව නිවාස ලබා දීමේ වැඩසටහනේ කාලසීමාව දිගු කිරීම සහ ප්‍රතිපාදන වැඩි කිරීම සඳහා අනුමැතිය ඉල්ලීම | ස්වභාවික ආපදා හේතුවෙන් වාසස්ථාන අහිමි වූ වැවිලි ප්‍රජාව සඳහා නව නිවාස ලබා දීමේ වැඩසටහන සඳහා වැය ශීර්ෂ අංක 135-2-19-006-2202 යටතේ අදාල දිස්ත්‍රික්ක සඳහා රු.මි.1706.3 ක ප්‍රතිපාදන නිදහස් කර 2025.12.31 වන විට රු.මි.323.27 ක් වැය කර ඇත. |
| 14 | 2025/11/03 දිනැති අංක අමප/25/2019/813/0044-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ස්වභාවික ආපදා වලින් වාසස්ථාන අහිමි වූ වැවිලි ප්‍රජාව සඳහා නව නිවාස ලබා දීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂයේ ඉතිරි වන ප්‍රතිපාදන වතු ප්‍රදේශ වල පවතින ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යොදා ගැනීමට අනුමැතිය ඉල්ලීම | මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා වැය ශීර්ෂ අංක 135-2-19-006-2202 යටතේ රු. මිලියන 500 ක් වෙන් කර අදාළ දිස්ත්‍රික්ක සඳහා රු. මිලි.427.45 ක ප්‍රතිපාදන නිදහස් කර 2025.12.31 දින වන විට රු. මිලි.196.13 ක් වැය කර ඇත. |

## 2.8. අනුබද්ධ ආයතනයන්හි "වාර්ෂික වාර්තා" අනුමත කිරීමේ ප්‍රගතිය

| අනු අංකය | ආයතනය | අවසන් වරට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව | වාර්ෂික වාර්තා සකස් කිරීම පිළිබඳ ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය | 2021 | 2022 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br><br>2023 වාර්ෂික වාර්තාවේ මුද්‍රිත පිටපතක් අමාත්‍යාංශය වෙත යොමු කර පරීක්ෂා කිරීමෙන් පසුව සංශෝධනය කිරීම සඳහා ආයතනය වෙත යොමු කර ඇත.<br><br>2024 වාර්ෂික වාර්තාවේ මුද්‍රිත පිටපත අමාත්‍යාංශය මගින් පරීක්ෂා කරමින් පවතී. |
| 2 | ශ්‍රී ලංකා තේ මණ්ඩලය | 2023 | 2024 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. |
| 3 | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 2024 | 2024 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. |
| 4 | ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | 2023 | 2024 වාර්ෂික වාර්තාවේ මුද්‍රිත පිටපතක් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, පරීක්ෂා කරමින් පවතී. |
| 5 | තේ ශක්ති අරමුදල | 2016 | 2016 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.<br>(2017, 2018 හා 2019 වාර්ෂික වාර්තා අමාත්‍යාංශයෙන් අනුමත කර ඇති අතර, පරිවර්තන කටයුතු සඳහා යොමු කර ඇත.) |
| 6 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 2024 | 2023 සහ 2024 රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. |
| 7 | රබර් පර්යේෂණ ආයතනය | 2023 | 2023 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. |
| | | 2024 | ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය විසින් යොමු කරන ලද 2024 වාර්ෂික වාර්තා කෙටුම්පත හා අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලැබී ඇති අතර, අමාත්‍යතුමාගේ අත්සනින් යුතුව කැබිනට් අනුමැතියට යොමු කිරීමට භාෂා ත්‍රිත්වයෙන් පරිවර්තනය කර අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස ආයතනය වෙත දන්වා ඇත. |
| 8 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 2023 | වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් එම වාර්ෂික වාර්තාව සභානායක කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | | 2024 වාර්ෂික වාර්තාවේ කෙටුම්පතේ සඳහන් අඩුපාඩු නිවැරදි කර අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත දැනුම් දී ඇත. |
| 9 | පොල් වගා කිරීමේ මණ්ඩලය | 2022 | 2023 වාර්තාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. සභාගත කිරීමට නියමිතය. 2024 වාර්තාවේ දෙවෙනි කෙටුම්පත පරීක්ෂාකර ආයතනය වෙත යවා ඇත. |
| 10 | පොල් පර්යේෂණ ආයතනය | 2022 | 2023 වාර්තාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කරමින් පවතී. |
| 11 | පොල් සංවර්ධන අධිකාරිය | 2021 | 2022 වාර්තාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. සභාගත කිරීමට නියමිතය. |
| 12 | කුරුණෑගල වැවිලි සමාගම | 2022 | 2023 වාර්තාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කරමින් පවතී. |
| 13 | හලාවත වැවිලි සමාගම | 2022 | 2023 වාර්තාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා යොමුකර ඇත. |
| 14 | කිතුල් සංවර්ධන මණ්ඩලය | 2022 | 2022 වාර්තාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇත. |
| 15 | තල් සංවර්ධන මණ්ඩලය | 2020 | 2021/2022 වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල නිර්දේශය ලැබී ඇත. |
| 16 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 2021 | 2021 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු සභානායක කාර්යාලය වෙත යොමු කර ඇත. |
| | | | 2022, 2023, 2024 වාර්ෂික වාර්තා කෙටුම්පත් අමාත්‍යාංශය විසින් පරීක්ෂාකර බලා නිවැරදි කිරීම් සිදුකර වාර්ෂික වාර්තා මුද්‍රණය කර මෙම අංශයට යොමු කරන ලෙස දන්වා ඇත. |
| 17 | සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2023/2024 | 2023/ 2024 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පසු පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු එම ආයතනය මඟින් සිදු කර ඇත. |
| | | | 2024/ 2025 වාර්ෂික වාර්තාවේ කෙටුම්පත අමාත්‍යාංශය වෙත ලැබී ඇති අතර, එහි තිබුණු අඩුපාඩු හා දෝෂ නැවත නිවැරදි කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන ලෙසට ආයතනය දැනුවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| 18 | ඇල්කඩුව වැවිලි සමාගම | 2018 | 2018 වාර්ෂික වාර්තාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, එම වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු සභානායක කාර්යාලය වෙත යොමු කර ඇත. |
| | | | 2019 වාර්ෂික වාර්තාව අමාත්‍යාංශය වෙත ලැබී ඇත. එහි තිබුණු අඩුපාඩු හා දෝෂ නැවත පරීක්ෂා කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. |
| 19 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 2019 | 2019 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති අතර, 2020 වාර්ෂික වාර්තාව සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයේ කෙටුම්පත සකස් කර ඇත. 2021 වර්ෂයේ වාර්ෂික වාර්තා කෙටුම්පත අමාත්‍යාංශයට ලැබී ඇති අතර, පරීක්ෂාකරමින් පවතී. |

## 2.9. විශේෂ සංවර්ධන ව්‍යාපෘතීන්හී ප්‍රගතිය (2025.12.31 දිනට)

**අයවැය ඇස්තමේන්තු මගින් සෘජුව ප්‍රතිපාදන ලැබෙන ව්‍යාපෘතිවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

## 2.9.1 වැවිලි අංශය

| ව්‍යාපෘතියේ නම | 2025 අනුමත ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| **ක්‍රියාත්මක අංශය: වැවිලි කළමණාකරණ අධීක්ෂණ අංශය** | | | |
| ප්‍රාදේශීය වැවිලි සමාගම්, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේ පාලනය වන වතු ඉඩම්වල වට මැනුම් සිදුකර කඩයිම් සිතියම් සකස් කිරීමේ ව්‍යාපෘතිය. | 110.0 | 50.73 | වතු 67ක් මැනුම් කටයුතු කිරීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුව අපේක්ෂා කල ද මැනුම් කටයුතු අවසන් කර ඇති වතු ගණන 27කි. |
| **ක්‍රියාත්මක අංශය: රබර් සංවර්ධන අංශය** | | | |
| රබර් අස්වනු නෙලීමේ සහායකයින්ගේ රබර් වගා පිළිවෙත් නිර්දේශ පිලිබඳ කුසලතා සංවර්ධනය කිරීම | 0.316 | 0.316 | වැසි ආවරණ සම්බන්ධ ප්‍රායෝගික වැඩමුළු 04 ක්, රබර් වගාව ආශ්‍රිත රෝග පිළිබඳ වැඩමුළු 04, ගුණාත්මක කිරි කැපීම පිළිබඳ වැඩමුළු 04 ක් පවත්වා ඇති අතර, රබර් අස්වනු නෙලීමේ සහායකයින් 91කගේ රබර් වගා පිළිවෙත් නිර්දේශ පිලිබඳ කුසලතා සංවර්ධනය කර ඇත. |
| වැසි ආවරණ සවි කිරීම සඳහා රබර් පර්යේෂණ ආයතනයේ සහතික ලත් කාර්මික ශිල්පින් හඳුන්වාදීම | 0.184 | 0.184 | වැසි ආවරණ සවිකිරීම පිළිබඳ තාක්ෂණික නිලධාරීන්ගේ දත්ත පද්ධතිය සැකසීම අවසන් කර ඇත. වැසි ආවරණ සම්බන්ධව ප්‍රායෝගික |

| | | | |
|---|---|---|---|
| | | | වැඩමුළුව අවසන් කර ඇත. වැසි ආවරණ සවි කිරීම සඳහා රබර් පර්යේෂණ ආයතනයේ සහතිකලත් කාර්මික ශිල්පීන් 37 හඳුන්වා දීම. |
| සාම්ප්‍රදායික නොවන රබර් වගා කරන ප්‍රදේශ වලින් උප ප්‍රශස්ත දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දිය හැකි නිරසාර රබර් ක්ලෝන හඳුනා ගැනීම | 4.50 | 4.50 | රු.මී.3.57ක ප්‍රසම්පාදනය කරන ලද භාණ්ඩ මිලදී ගැනීමේ ඇනවුම්පත් යවා ඇත. ක්ලෝන 15ක ශාක වර්ධන සාධක සහ පවතින රෝග හඳුනා ගැනීම සිදු කරන ලදී. ක්ලෝන් 15ක නොවැම්බර් මාසයට අදාළ සාම්පල් එකතු කිරීම සහ ක්ෂිර කායික විද්‍යාත්මක ලක්ෂණ විශ්ලේෂණය කරන ලදි. ක්ලෝන 08ක නොවැම්බර් මාසයට අදාළ සාම්පල් එකතු කිරීම සහ දළ රබර් විශ්ලේෂණ කරන ලදී. |
| **ක්‍රියාත්මක අංශය: කප්රුක අරමුදල කළමනාකරණ මණ්ඩලය** | | | |
| පොල් ආශ්‍රිත අවිධිමත් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාන කර්මාන්තවල ව්‍යවසායකයින්ට ආයෝජන ප්‍රාග්ධනය ලබා දීම යටතේ ණය ප්‍රාග්ධනය ලබාදීමේ ව්‍යාපෘති මූලික පරීක්ෂණ, පසුවිපරම් කිරීම හා නියාමනය | 4.10 | 4.10 | ණය ලාභීන් 11ක් සඳහා ණය ලබාදීම හා 410කගේ දැනට මූලික පරීක්ෂණ, පසුවිපරම් කිරීම සිදු කර ඇත. |
| කුඩා හා ක්ෂුද්‍ර ව්‍යවසාය නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ අවස්ථා සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම | 2.70 | 2.70 | ප්‍රදර්ශන 05ක් පවත්වා ඇත. සමීක්ෂණ පත්‍රිකා 2500 බෙදා සේවා මධ්‍යස්ථාන 02ක් සංවර්ධන කර ඇත. |
| පොල් ආශ්‍රිත කුඩා හා ක්ෂුද්‍ර පරිමාණ කර්මාන්ත පිළිබඳ තාක්ෂණික දැනුම හා නිපුණතාවන් ඉහළ නැංවීම හා යාවත්කාලීන කිරීම | 0.20 | 0.20 | දැනුවත් කිරීමේ වැඩසටහන් 20ක් පවත්වා ඇත. |
| කුඩා පොල් ඉඩම් වල ඵලදායිතා වැඩිදියුණු කිරීම සහ ආදායම් උත්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ණය ප්‍රාග්ධන ලබාදීම හා ව්‍යාපෘති මූලික පරීක්ෂණ සහ පසු විපරම් කිරීම | 3.70 | 3.70 | ඉඩම සංවර්ධන ව්‍යාපෘති 10ක් මූල්‍යනය කර ඇත. මූලික පරීක්ෂණ, පසුවිපරම් 405ක් සිදු කර ඇත. |
| කුඩා පරිමාණ පොල් ඉඩම් හිමියන්ගේ ඉඩම් කළමණාකරණය හා තාක්ෂණික භාවිතයන් පිළිබඳ දැනුම ඉහළ නැංවීම හා යාවත්කාලීන කිරීම | 0.20 | 0.20 | දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් සිදු කර ඇත. |
| කප්රුක සමිති බලගැන්වීම මගින් ඒවායේ කාර්ය සාධනය හා ප්‍රජා සහභාගීත්වය ඉහළ නැංවීම, ශක්තිමත් කිරීම, විධිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම | 2.40 | 2.40 | සමිති පරීක්ෂාව 15ක් සහ නියාමන 25 ක්, සමිති නිලධාරී පුහුණු වැඩසටහන් 17 ක් සිදු කර ඇත.නව සමිති 22 පිහිටුවා ඇත. |
| කප්රුක සමිති බලගැන්වීම වැඩසටහන යටතේ කප්රුක උදාන | 1.20 | 1.20 | වැඩසටහන් 06ක් පවත්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| ග්‍රාමීය වැඩසටහන | | | |
| කප්රුක අරමුදලේ නිලධාරීන්ගේ දැනුම ආකල්ප කුසලතා ඉහළනැංවීම හා ධාරිතා සංවර්ධනය තුලින් ඔවුන්ගේ කාර්යය සාධනය ඉහළ නැංවීම | 1.00 | 1.00 | නිළධාරි පුහුණු වැඩසටහනක් පවත්වා ඇත. |
| කළමනාකරණ තොරතුරු පද්ධති සංවර්ධනය හා සන්නිවේදන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන | 2.00 | 2.00 | පරිගණක යන්ත්‍ර 08ක් මිලදී ගෙන ඇත. |
| සංවර්ධන ක්‍රියාකාරකම් නියාමනය, අධීක්ෂණය සහ ඇගයීම | 2.50 | 2.50 | ප්‍රගති සමාලෝචන රැස්වීම් 54, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 04ක් පවත්වා ඇත. |
| **ව්‍යාපෘතියේ නම :පොල් වගාවේ රෝග පාලනය හා මර්ධන වැඩසටහන** | | | |
| **ක්‍රියාත්මක ආයතනය : පොල් වගා කිරීමේ මණ්ඩලය<br>පොල් පර්යේෂණ ආයතනය** | | | |
| වැලිගම පොල් කොළ මැලවීමේ රෝග මර්ධන වැඩසටහන | 107.1 | 100.624 | රෝගී ගස් හඳුනා ගැනීම හා සළකුණු කිරීම 17,015<br>රෝගී ගස් එන්නත් කිරීම- 4457<br>වන්දි ගෙවූ ගස් ගණන- 9004 |
| බ්‍රෝන්ටිස්පා කෘමි හානිය පාලනය | 4.0 | 4.0 | රෝගී ගස් 2339 හඳුනාගෙන සළකුණු කර , මොනොක්‍රොටපස් යෙදීම සිදු කර ඇත. පුහුණු වැඩසටහන්11ක් පවත්වා ඇත. |
| පොල් වගාවේ සුදු මැස්සා හානිය පාලනය කිරීම | 4.5 | 4.5 | රෝගී ගස් 82,639 හඳුනාගෙන කොහොඹ තෙල් යෙදීම සිදුකර ඇත. |

| ව්‍යාපෘතිය | 2025 අනුමත ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| **වැවිලි අංශයේ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති** | | | |
| **තේ ක්ෂේත්‍රය** | | | |
| **ක්‍රියාත්මක ආයතනය - තේ පර්යේෂණ ආයතනය** | | | |
| දේශගුණික වෙනස්වීම් වලට ඔරොත්තු දෙන වැඩිදියුණු කළ බීජ නිපදවීමට බීජ උද්‍යාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය (2021 - 2025) | 0.95 | 0.95 | ▪ 2021-2023 දක්වා බීජ උද්‍යාන 12ක් නැවත ප්‍රතිස්ථාපනය කර, 2025 වර්ෂයේ දී බීජ උද්‍යාන 03ක් නඩත්තු කරන ලදී. ව්‍යාපෘතිය 2025 වසරේදී අවසන් විය. එහි අවසන් වාර්තාව 2026 පළමු කාර්තුව තුළ ඉදිරිපත් කිරීමට නියමිතය. ව්‍යාපෘතියේ මූලික ඉලක්කය වන බීජ උද්‍යාන තුළ පැළ 1500 සිටුවීම සම්පූර්ණ කර ඇත. |
| නව තේ ප්‍රභේදවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය වගාකරුවන් අතර බෙදා හැරීමට වගාවන් ති වපසරිය (Mother | 18.5 | 18.5 | ▪ ව්‍යාපෘතිය මගින් හෙක්: 13.5ක පමණ පුනරුත්තාපන තෘණ වගා කර තවත් හෙක්: එකක |

| | | | |
|---|---|---|---|
| Bush Area) වැඩි කිරීම (2022-2027) | | | පුනරුත්ථාපන තෘණ වගාව ආරම්භ කර ඇත. පැවති අයහපත් කාලගුණ තත්වය නිසා ශාන්ත කුම්බස් වතුයායේ (ලැම්ලියර් කොටසෙහි) සහ තේ.ප.ආ පස්සර මධ්‍යස්ථානයේ පුනරුත්ථාපන තෘණ වගා කිරීමේ කටයුතු 2026 වසරේ මුල් කාර්තුව තුළ අවසන් කිරීමට බලාපොරොත්තු වේ.<br>▪ මේ වනවිට ස්ථාපනය කර ඇති නව මව් වගා භූමි ප්‍රමාණයක හෙක්ටයාර 8.0 කි (2025 ඉලක්කය සපුරා ඇත). |
| තේ පැළවල කෙටි කාලීන නියඟ ආතතියට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා යොදා ගත හැකි ශාක-පාදක ද්‍රව්‍ය නිෂ්පාදනය කර සංවර්ධනය කිරීම (2025-2027) | 4.95 | 4.95 | ▪ යාවත්කාලීන කරන ලද නිස්සාරණ ක්‍රියා පටිපාටිය දැනට සිදු වෙමින් පවතී. HPLC ක්‍රමය භාවිතයෙන් පසුකාලීන රසායනික සංයුති විශ්ලේෂණය සඳහා සාම්පල ලබා ගන්නා ලද අතර, ඉදිරි වියළි කාලය තුළ දත්ත ජනනය කිරීම සඳහා සමාන්තර අත්හදා බැලීමක් ස්ථාපිත කරන ලදී. |
| ශාක පෝෂ්‍ය මූල ද්‍රව්‍යවල නැනෝ අංශු වලින් පොහොසත් ජෛව අඟුරු සංකීර්ණ පිළිබඳ විමර්ශනය සහ ඒවා මගින් තේ පැළ වර්ධනයට සහ පසෙහි ගුණාත්මක භාවයට බලපෑම් පිළිබඳ විමර්ෂණ කිරීමේ ව්‍යාපෘතිය (2025 - 2029) | 26.4 | 16.0 | ▪ ජෛව අඟුරු නිපදවීමේ ක්‍රමවේදය අත් හදා බැලීම් 3ක් සිදුකර ඇත.<br>▪ විද්‍යාගාර භාණ්ඩ/උපකරණ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඇත.<br>▪ ජෛව අඟුරු නිපදවීම පිළිබඳ වැඩිදුර සොයාබැලීම් සහ නිරීක්ෂණය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු අධ්‍යනාංශයේ ජෛව අඟුරු නිපදවීමේ පර්යේෂණ ඒකකය මගින් ක්ෂේත්‍ර නිරීක්ෂණයක් සිදු කරන ලදී.<br>▪ ජෛව අඟුරු නිපදවීම සඳහා අවශ්‍ය විද්‍යාගාර උපකරණ මිලදී ගැනීමේ ක්‍රියාවලිය හරහා විද්‍යාගාර උපකරණ 2ක් විද්‍යාගාරයට ලැබී ඇත. ඉතිරි විද්‍යාගාර උපකරණ ලද විගස අදාළ අධ්‍යයන කටයුතු ආරම්භ කල හැක. |

| | | | |
|---|---|---|---|
| තේ වතුවල ඵලදායිතාව ඉහල නැංවීමට ස්වභාවධර්මය මත පදනම් වූ විසඳුමක් සහ දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා උපාය මාර්ගයක් ලෙස පාංශු සෞඛ්‍ය වැඩිදියුණු කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පාංශු සංශෝධනයක් ලෙස ජීව අඟුරු (Bio char) භාවිතය (2025 – 2027) | 10.2 | 0.0 | ▪ ජෛව අඟුරු නිපදවීමේ ක්‍රමවේදය අත් හදා බැලීම් 3 ක් සිදුකර ඇත.<br>▪ ජෛව අඟුරු නිපදවීම පිළිබඳ වැඩිදුර සොයාබැලීම් සහ නිරීක්ෂණය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි ඉංජිනේරු අධ්‍යනාංශයේ ස්ථාපිත කර ඇති ජෛව අගුරු නිපදවීමේ පර්යේෂණ ඒකකයේ ක්ෂේත්‍ර නිරීක්ෂණයක් සිදු කරන ලදී.<br>▪ ජෛව අඟුරු නිපදවීම සඳහා අවශ්‍ය විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම. |
| රත්නපුර දිස්ත්‍රික්කයේ තේ වගාව සිදු කරන ප්‍රදේශයන්හි නෙමටෝඩා පලිබෝධ (වට පණුවන්) පැතිරීමේ ප්‍රවණතාවය හඳුනා ගැනීම සඳහා වන සමීක්ෂණය ක්‍රියාත්මක කිරීම. | 3.98 | 1.4583 | ▪ සාම්පල 117ක් විශ්ලේෂණය කරන ලදි. අන්වීක්ෂය මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. |
| ඕතඩොක්ස් රෝලරය සඳහා රෝලිං පරාමිතීන් නිරීක්ෂණය කිරීමේ සහ පාලනය කිරීමේ ක්‍රමය සංවර්ධනය කිරිම. (2025) | 15.8 | 15.8 | ▪ ඕතඩොක්ස් රෝලර් සඳහා රෝලිං පරාමිතීන් අධීක්ෂණ සහ පාලන ක්‍රමය ස්ථාපනය කිරීම අවසන් කර ඇත . |
| **ක්‍රියාත්මක ආයතනය - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය** | | | |
| පාංශු පරීක්ෂා උපකරණ (P.H.Meter) මිලදී ගැනිම. | 5.1 | 2.989 | ▪ උපකරණ 17ක් ලබාගෙන ඇත. |
| Silver Tip Tea Cultivation" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. | 9.85 | 9.85 | ▪ පැළ 90,000ක් සිටුවා අවසන් කර ඇත. |
| **ක්‍රියාත්මක ආයතනය - තේ සංවර්ධන හා වැවිලි ප්‍රතිපත්ති අංශය** | | | |
| වැවිලි අංශය සඳහා දිරිදීමනා යෝජනා ක්‍රමයක් සංවර්ධනය කිරීම | 5.0 | 0.2498 | ▪ දිරිදීමනා යෝජනා ක්‍රමය සකස් කර වාර්තාව ඉදිරිපත් කර ඇත. |
| තවාන් කළමණාකරණ ඩිජිටල්කරණය කිරිම | 3.95 | 2.199 | ▪ තේ පැළ තවාන් කළමනාකරණ දත්ත පද්ධතිය (Digital )සකස් කර අවසන් කර ඇත. |
| **කුඩා වැවිලි භෝග ක්ෂේත්‍රය** | | | |
| **ක්‍රියාත්මක ආයතනය - ශ්‍රී ලංකා කජු සංස්ථාව** | | | |
| ගොවි ප්‍රජාවන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා උතුරු සහ නැගෙනහිර පළාත්වල කජු පොකුරු ගම්මාන පිහිටුවීම | 7.84 | 6.705342 | ▪ බද්ධ කජු පැළ 22,000 අක්කර 314 මගින් වගා කර ඇත. |

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් ඉඩම් මැනීම් කටයුතු සිදුකිරීම | 8.755 | 0.00 | ▪ වතුයායන් 7න් කමන්දලුව, පුත්තලම සහ හාඩි වතුයායන් 3 සඳහා මැනුම් නියෝග නිකුත්කර ඇත. |
| **ක්‍රියාත්මක ආයතනය - කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය** | | | |
| යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) අනුකූලතා සහාය හරහා ගුණාත්මක කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (SMEs) සපුරාලීම සහ ශක්තිමත් කිරීම. | 9.5 | 9.5 | ▪ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 18 දෙනෙකු සඳහා යන්ත්‍ර ලබාදීම සිදුකර ඇත. එසේම සම්පූර්ණ වියදමෙන් 25% ව්‍යවසායකයන් විසින් දරා ඇත. |
| **වැවිලි සමාගම් ක්ෂේත්‍රය** | | | |
| **ක්‍රියාත්මක ආයතනය - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව** | | | |
| වැවිලි ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් ස්ථාපිත කිරීම | 9.15 | 9.15 | ▪ වැවිලි ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) ස්ථාපනය කර ඇත. |
| තේවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා කැලෑබොක්ක තේ කර්මාන්තශාලා මාරු කිරීමේ කාමරය ස්වයංක්‍රීයකරණය කිරීම සමඟ නව තාක්ෂණයන් හඳුන්වා දීම | 8.9 | 5.125 | ▪ තේ කර්මාන්තශාලා යාන්ත්‍රිකරණය සහ නවීකරණය අවසන් කරමින් පවතී |
| **ක්‍රියාත්මක ආයතනය - ජනතා වතු සංවර්ධන මණ්ඩලය** | | | |
| තේ කර්මාන්තශාලා නවීකරණය සහ සංවර්ධනය සඳහා වියළුම් පද්ධතිය වැඩිදියුණු කිරීම | 9.6 | 9.59 | ▪ වියළුම් පද්ධතිය වැඩිදියුණු කිරීම සම්පූර්ණ කර ඇත |
| තේ කර්මාන්තශාලා නවීකරණය සහ සංවර්ධනය සඳහා - දර මඩු ඉදිකිරීම, දර විදින යන්ත්‍ර සවි කිරීම, රෝලර් ප්‍රතිසංස්කරණය සහ යන්ත්‍ර මාරු කිරීම උත්ශ්‍රේණි කිරීම | 9.8 | 8.9477 | ▪ තේ කර්මාන්තශාලා යන්ත්‍ර නවීකරණය සහ සංවර්ධනය සම්පූර්ණ කර ඇත |
| **ක්‍රියාත්මක ආයතනය - ඇල්කඩුව වැවිලි සමාගම** | | | |
| වැවිලි නිරීක්ෂණ පද්ධතිය නවීකරණය කිරීම | 9.5 | 6.999 | ▪ වැවිලි මෙහෙයුම් පද්ධති ස්ථාපනය සිදු කරමින් පවතී |
| කුඩා තේ කර්මාන්ත ශාලා සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම | 2.5 | 2.399 | ▪ යන්ත්‍ර පද්ධති ස්ථාපනය අවසන් කරමින් පවතී |
| **වෙනත්** | | | |
| **ක්‍රියාත්මක ආයතනය - වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය** | | | |
| වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ඇති කොට්ඨාශ අතර පරිගණක ජාල පද්ධතියක් ස්ථාපිත කිරීම | 9.35 | 9.34 | ▪ ජාල පද්ධතිය හා වේගවත් දත්ත ගබඩා කිරීම (SSD) ස්ථාපිත කර අවසන් කර ඇත |

| | | | |
|---|---|---|---|
| වැවිලි අංශයේ සංවර්ධන කටයුතු පිළිබඳ ප්‍රචාරණ වැඩසටහන | 3.84 | 0.9 | ▪ රූපවාහිනී වැඩසටහන් දෙකක් විකාශය කරන ලදී.<br>▪ ගුවන් විදුලි වැඩසටහන් 12 ක් පැවැත්වීම.<br>▪ අත් පොතක් සහ පුවත් පත් අතිරේකය මුද්‍රණය කිරීම. |
| නවීකරණය විවිධාංගීකරණය හා නව්‍යකරණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 5.9 | 0.77 | ▪ දැනුවත් කිරීමේ වැඩසටහන් හතරක් සහ ක්ෂේත්‍ර නිරීක්ෂණයක් සිදුකිරීම. |
| | | 4.08 | ▪ තේ දළු නෙලීම සඳහා නවීන දළු නෙලීමේ යන්ත්‍ර 03ක් මිල දී ගෙන ඇත.<br>▪ අධිබලැති දියර හා කැට ඉසින යන්ත්‍ර 02 හා සූර්ය බලයෙන් හා බැටරියෙන් ක්‍රියා කරන දියර ඉසින යන්ත්‍ර 02ක් මිල දී ගෙන ඇත.<br>▪ බිංදු ජල සැපයුම් පද්ධතිය එලා ඇත. |
| **ක්‍රියාත්මක ආයතන: තේ,රබර් සහ පොල් වතු (කැබැලි කිරීමේ පාලන මණ්ඩලය)** | | | |
| තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) පණතින් ආවරණය වන ඉඩම් වල අයිතිය පැවරීමේදී කටයුතු කලයුතු ආකාරය සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීම - 2025 | 0.70 | 0.35 | ▪ මුද්‍රිත මාධ්‍යන් වන පුවත් පත් 03 ක් ඇසුරින් 2025.09.07 දින මහජනයා දැනුවත් කිරීම.<br>▪ නීතිපති දෙපාර්තමේන්තුව වෙත නීතිඥවරුන් දැනුවත් කිරීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීම. |
| **ක්‍රියාත්මක ආයතනය : රබර් පර්යේෂණ ආයතනය** | | | |
| නව පත්‍ර පතන රෝගයට අදාල වසංගත විද්‍යාත්මක අධ්‍යයන සහ ව්‍යාධිජනකයන්ගේ ජීව විද්‍යාත්මක අධ්‍යයන සිදු කිරීම සහ කාර්යක්ෂම රෝග කළමණාකරණ ක්‍රම වැඩි දියුණු කිරීම.(2021-2025) | 6.98 | 6.98 | ▪ හඳුනාගෙන ඇති දිලීර මාදිලි 12 ක් අතරින් වඩාත් කාර්යක්ෂම දිලීර 5ක් තෝරා ගෙන ඇත. 2025 වසර සඳහා ක්ලෝන 40ක පරීක්ෂාව සම්පූර්ණ කර ඇත.<br>▪ ක්ෂේත්‍ර 05ක (IDM) සමෝධායන රෝග පාලන කටයුතු සිදු කරන ලදී.<br>▪ පුහුණු කිරීම් - 10<br>▪ පර්යේෂණ පත්‍රිකා - 06 |
| රබර් පර්යේෂණ ආයතනයේ ශිෂ්‍ය පර්යේෂණ නේවාසිකාගාර දෙකක් ප්‍රතිසංස්කරණය කිරීම. | 9.7 | 8.42 | ▪ ශිෂ්‍ය/පර්යේෂක නේවාසිකාගාර දෙක ප්‍රතිසංස්කරණය කිරීම නිම කරන ලදී. |
| රාජ්‍ය සේවාවන්හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණය උපයෝගී කරගනිමින් (RRISL) පුස්තකාලය ප්‍රතිසංස්කරණය හා | 4.9 | 4.4 | ▪ මේ සඳහා අවශ්‍ය පරිගණක මිලදීගෙන පුස්තකාලය ස්වයංක්‍රීයකරණය කිරීම.<br>▪ පොත් රාක්ක අලුත්වැඩියා |

| | | | |
|---|---|---|---|
| නවීකරණය කිරීම. | | | කිරීම.<br>▪ කියවීමේ මේසයට අදාළ පුටු මිලදී ගැනීම.<br>▪ පුස්තකාලය වායු සමීකරණය කිරීම.<br>▪ රත්මලාන පුස්තකාලයට මේ සඳහා අවශ්‍ය බඩු මිලදී ගැනීම සහ එහි Network point සැකසීම හා පුස්තකාලයේ කොටසක් බෙදා වෙන් කිරීම. |
| ශ්‍රී ලංකාවේ රබර් දැව කර්මාන්තය පුනරුත්ථාපනය කිරීමට නවීකෘත විද්‍යාගාර පහසුකම් ලබාදීම. | 4.0 | 4.0 | ▪ පර්යේෂණ උපකරණ 11ක් මිලදී ගැනීම, තෝරාගත් ක්ලෝනවලින් ලබාගත් රබර් දැව සාම්පල් 50ක් දැවවල ජීවරසායනික සහ භෞතික විද්‍යාත්මක විශ්ලේෂණ සිදු කිරීම. |
| රත්මලාන රබර් පර්යේෂණ ආයතනයේ පුස්තකාල වහලය ප්‍රතිසංස්කරණය කිරීම. | 5.0 | 5.0 | ▪ පුස්තකාල පරිශ්‍රයේ වහළ අලුත්වැඩියාව භාණ්ඩ මිලදී ගැනීම සිදු කර නිමකර ඇත. |
| ▪ **ක්‍රියාත්මක ආයතනය :රබර් සංවර්ධන අංශය** | | | |
| ජාත්‍යන්තර වෙළඳපොළට මුහුණ දීම සඳහා රබර් ඩිජිටල් ඉඩම් ලියාපදිංචි කිරීමේ පද්ධතිය ඵලදායී ලෙස භාවිතා කිරීමෙන් රබර් අංශය නවීකරණය කිරීම. | 63.13 | 59.59 | ▪ මැනීමට යෝජිත ඉඩම් ඒකක- 79,890 ක් වන අතර, මැනුම් කටයුතු 41% කර ඇත.එමගින් 4% (1,358) ක් සඳහා QR කේත නිකුත් කර ඇත. ඉතිරි මැනීම් වෙනුවෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද මුදල රු. මි. 56.37 කි. |
| රබර් අංශයේ තිරසාර සංවර්ධනය සඳහා මාර්ගෝපදේශ සහ නිර්දේශ ලබා දීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම. | 1.6 | 1.32 | ▪ පාර්ශව කරුවන් සම්බන්ධ කර වැඩමුළු පවත්වා 2026-2030 රබර් මාර්ග සිතියම කෙටුම්පත් කර අදාළ පාර්ශවයන් වෙත යොමු කර මාර්ග සිතියමේ කෙටුම්පත සැකසීම. |

| **පොල් ක්ෂේත්‍රය** | | | |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ නම | **2025 අනුමත ප්‍රතිපාදන (රු.මි.)** | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
| **ක්‍රියාත්මක ආයතනය : පොල් පර්යේෂණ ආයතනය** | | | |
| අපනයනය ඉලක්ක කරගත් පානීය කර්මාන්තයක් ලෙස තැඹිලි වතුර ප්‍රවර්ධනය සඳහා තැඹිලි වල ජෛව රසායනික අධ්‍යයනයන් සිදුකිරීම (2025) | 2.0 | 1.19 | ▪ සාම්පල 60ක විශ්ලේෂණය සිදු කර තාක්ෂණික විශ්ලේෂණයට භාර දී ඇත. |
| පොල් කිරි වල අස්වැන්න සහ ගුණාත්මකභාවය කෙරෙහි පොල් ප්‍රභේදයේ, පොල් ගෙඩිවල පරිණත | 5.2 | 1.08 | ▪ තෙත් කලාපයෙන් සාම්පල එකතු කිරීම 100% ක් අවසන් කරන ලදී. අයහපත් කාලගුණය හේතුවෙන් |

| | | | |
|---|---|---|---|
| භාවයේ හා වගාකරනු ලබන ප්‍රදේශවල දේශගුණික තත්ත්වයන්හි බලපෑම අධ්‍යයනය කිරීම (2025-2027) | | | උතුරු පළාතෙන් සාම්පල එකතු කිරීම කළ නොහැකි විය. |
| මධ්‍යම විශ්ලේෂණ රසායනාගාරයේ විශ්ලේෂණාත්මක ධාරිතාවයන් සහ රසායනාගාර ආරක්ෂාව වැඩි දියුණු කිරීම | 3.14 | 3.14 | ▪ අවශ්‍ය උපකරණ මිලදීගෙන ඇත. |
| පොල් පර්යේෂණ ආයතනයෙහි පටක රෝපණ රසායනාගාරයේ පටක රෝපණ ශාක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම | 3.19 | 3.19 | ▪ උපකරණ මිලදීගෙන ඇත. |
| පොල් පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන රසායනාගාරය සඳහා රසායනාගාර උඳුනක් මිලදී ගැනීම | 1.22 | 1.22 | ▪ රසායනාගාර උඳුනක් මිලදීගෙන ඇත. |
| පොල් ඉඩම්වල නිරසාර කෘෂි විද්‍යාත්මක පිළිවෙත් සහ කෘෂි පරිසර පද්ධති පර්යේෂණ සඳහා රසායනාගාර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | 1.68 | 1.68 | ▪ රසායනාගාර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට උපකරණ මිලදීගෙන ඇත. |
| පොල් පර්යේෂණ ආයතනයේ වගා සංරක්ෂණ අංශ රසායනාගාරයේ පළිබෝධ සහ රෝග කළමනාකරණය පිළිබඳ ප්‍රචාරණය වැඩිදියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය | 5.39 | 5.31 | ▪ උපකරණ මිලදීගෙන ඇත. |
| ඩ්‍රෝන යානා භාවිතා කරමින් (UAVs) පොල් වගාව සඳහා දේශගුණික මැදිහත්වීම් සිදු කිරීම | 5.79 | 5.66 | ▪ මිලදීගෙන ඇත. |
| සමාජ-ආර්ථික අධ්‍යයනයන් සඳහා අත් පරිගණක මිලදී ගැනීම | 0.71 | 0.70 | ▪ අත් පරිගණක 05ක් මිලදීගෙන ඇත. |
| දේශගුණික විපර්යාස සඳහා රසායනාගාර උපකරණ මිලදී ගැනීම අනුවර්තනය පර්යේෂණ (බොත්තම් සහ ඩිජිටල් උෂ්ණත්වමාන) | 1.82 | 1.81 | ▪ බොත්තම් සහ ඩිජිටල් උෂ්ණත්වමාන මිලදීගෙන ඇත. |
| පොල් සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සම්පාදනය කිරීම | 0.1 | 0.0 | ▪ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් අදාළ කාර්යයන් සිදු කර ඇත. |
| පොල් සැකසුම් අංශයට උපකරණ මිලදී ගැනීම | 1.567 | 1.549 | ▪ උපකරණ මිලදීගෙන ඇත. |
| අණුක ජීව විද්‍යාගාරය සඳහා PCR යන්ත්‍රයක් මිල දී ගැනීම | 3.513 | 0.0 | ▪ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලි. 1.5 වුවත් ලංසු කැඳවූ විට රු. මිලි. 3.5 වූ නිසා ලංසු අවලංගු කර ලංසු ආපසු කැඳවීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනයෙන් පසු මිලදී ගැනීම සඳහා කාලය ප්‍රමාණවත් නොවිය. |
| බ්‍රොන්ටිස්පා කෘමි හානිය පාලනය* | 41.4 | 23.4 | ▪ එතනෝල් ලීටර් 20,ටියුබස් 2000, මොනක්‍රොටපස් ලීටර් 113ක් මිලදී ගෙන ඇත. විද්‍යාගාර භාණ්ඩ, උපකරණ මිලදී ගෙන ඇත, විද්‍යාගාර 1ක අලුත්වැඩියා කටයුතු සිදුකිරීම. |

| | | | |
|---|---|---|---|
| **ක්‍රියාත්මක ආයතනය : පොල් සංවර්ධන අංශය** | | | |
| තල් කිතුල් පොල් හා කුඩා වැවිලි බෝග ආශ්‍රිතව පර්යේෂණ සහ ව්‍යාපෘති සංවාද පැවැත්වීම | 0.275 | 0.22 | ▪ තල්, පොල් හා කුඩා වැවිලි භෝග ආශ්‍රිතව පර්යේෂණ හා ව්‍යාපෘති සංවාදය පවත්වා අවසන් කර ඇත. |
| **තල් සංවර්ධන මණ්ඩලය** | | | |
| තල් පර්යේෂණ ආයතනයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් පර්යේෂණ සහ පරීක්ෂණ හැකියාවන් ශක්තිමත් කිරීම- | 9.8 | 8.88 | ▪ AC පද්ධති 06ක් , ගිණි නිවන උපකරණ 02ක් හා විද්‍යාගාර 3ක් ටයිල් කිරීම, කබඩ නවීකරණය, ඩෙක්ස්ටොප් පරිඝනක 02ක් හා ලැප්ටොප් පරිගණක 02ක් සහ රසායන ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ මිල දී ගැනීම. ජල නල පද්ධතිය ප්‍රතිසංස්කරණය හා පින්තාරු කිරීමට අදාළ කාර්යයන් අවසන් කර ඇත, |
| යටිතල පහසුකම් සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය තුළින් ආයතනික කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම | 9.95 | 9.95 | ▪ ලැප්ටොප් පරිගණක 07ක් , ඩෙක්ස්ටොප් පරිඝනක 12ක්, අල්මාරි 20 ක්, කාර්යාලීය මේස 05 ක් සහ මුද්‍රණ යන්ත්‍ර හා ෆැක්ස් යන්ත්‍ර 02 ක් ස්ථාපනය අවසන් කර ඇත. වාහන දෙකෙහි අළුත්වැඩියා කටයුතු අවසන්. AC පද්ධති 05ක්, වාහන නැවැත්වීමේ පරිශ්‍රයක් ස්ථාපිත කර අවසන්. විවේකාගාර දෙකේ අළුත්වැඩියාකිරීමේ අවසන්. කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් අවසන්ය. |

## 2.9.2 ප්‍රජා යටිතල පහසුකම් අංශය

- වතු නිවාස වැඩසටහන

වාසස්ථාන සම්බන්ධයෙන් වන දර්ශක සැළකීමේ දී වඩාත් පසුබෑමකට ලක්ව ඇති ජන කොට්ඨාසයක් ලෙස වැවිලි ප්‍රජාව සැලකිය හැකිය. එම ජනතාව ජීවත් වන නිවාස වලින් වැඩි ප්‍රමාණයක් පේළි නිවාස වේ. එම නිවාස ඉතා පැරණි මෙන්ම අබලන් තත්ත්වයේ පැවතීම, හිරු එළිය හා වාතාශ්‍රය අවමවීම, අධික තදබදය, පෞද්ගලිකත්වයක් නොමැතිවීම, අනු පවුල් බිහිවීම නිසා පවුල් කිහිපයක් එකම නිවස තුළ ජීවත්වීම ආදී ගැටළු හඳුනාගත හැකි අතර, ඒ හේතුවෙන් විවිධ අපචාරයන්ට ගොදුරුවීම, අනාරක්ෂිත බව, පිළිගැනීමක් නොමැති වීම, සෞඛ්‍යය සහ ළමුන්ගේ අධ්‍යාපනයට සුදුසු වටපිටාවක් නොමැතිවීමේ තත්වයක් උදා වී ඇති අතර, එම හේතුවෙන් විවිධ ගැටළු වලට මුහුණු පා ඇත. යුගල බැරැක්ක හා තවකාලික නිවාසවල වැවිලි ප්‍රජාව වාසය කරයි.

ඉතා අඩු පහසුකම් වලින් යුතු නිවාස හේතුවෙන් අත්විඳින්නා වූ මෙම දුෂ්කරතා මගහරවා ගනිමින් අභිමානයකින් යුතුව ජීවත්වීමේ අයිතිය ඔවුන් වෙත ද හිමිකරදීමේ අරමුණුනින් වතු නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි.

මේ යටතේ ඉඩම් ඔප්පු හිමිකම සහිත පර්චස් 07ක බිම් අයිතිය ද සමඟ සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය, විදුලිය හා සංවර්ධනය කරන ලද ප්‍රවේශ මාර්ග ආදී යටිතල පහසුකම් ද සහිතව වර්ග අඩි 550කින් සමන්විත යාබද වැසිකිළි සහිත තනි නිවාසයක් ලබාදීම සිදුකරයි. මීට අමතරව සත්ත්ව පාලනය සහ ගෙවතු වගාවන් පවත්වා ගැනීමට හැකි වන ලෙස අමතර පර්චස් 03ක් ලබා දීමට ද 2021 ජනවාරි මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත.

**2025.12.31 දිනට නිවාස වැඩසටහනෙහි සමස්ත ප්‍රගතිය (රජයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වූ නිවාස වැඩසටහනකි)**

| ව්‍යාපෘතිය | කාර්යයන් | 2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලි.) | 2025 වර්ෂයේ වියදම (රු.මිලි.) | භෞතික ඉලක්ක (ඒකක ගණන) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| වතු නිවාස වැඩසටහන | 2024 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ නිවාස ව්‍යාපෘති (අතැති බිල්පත් සහ බැඳීම්) | 33.50 | 33.14 | - | 2024 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති 5කට අදාළ නිවාස ඒකක 127ක් සඳහා කොටස් වශයෙන් ගෙවීම් සිදු කර ඇත. |
| | 2024 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ජල සැපයුම් ව්‍යාපෘති (අතැති බිල්පත් සහ බැඳීම්) | 16.00 | 16.67 | ජල සැපයුම් ව්‍යාපෘති 3ක් | ජල සැපයුම් ව්‍යාපෘති 3ක් සම්පූර්ණ කර ඇති අතර, ඒවාට අදාල බිල්පත් ගෙවා ඇත |
| | සම්පූර්ණ කළ නිවාස සඳහා ජල | 54.50 | 0.18 | ජල සැපයුම් ව්‍යාපෘති 12ක් | ජල සැපයුම් ව්‍යාපෘති 11ක් අනුමත කර ඇත |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ජලය සහ විදුලිය යටිතල පහසුකම් සමඟ නිවාස 397ක් සම්පූර්ණ කිරීම | 663.00 | 434.08 | නිවාස 397ක් | ඒකක 114ක් 100%ක් සම්පූර්ණ කර ඇත. ඒකක 222ක් අවසන් කිරීමේ අදියරේ පවතින අතර මුදල් වෙන්කිරීම් ගැටළු හේතුවෙන් ඒකක 61ක් තාවකාලිකව නවතා ඇත.<br><br>ජල ව්‍යාපෘති 13ක් අනුමත කර ඇති අතර විදුලි ව්‍යාපෘති 2ක් සඳහා ගෙවීම් සිදු කර ඇත. |
| | පෙර වර්ෂවල බිල්පත් සඳහා ගෙවීම් සිදු කිරිම | - | 15.96 | - | පෙර වසරවල බිල්පත් සඳහා ගෙවීම් සිදුකිරිම |
| | එකතුව | **767.00** | **500.03** | | |

## 2.9.3 යටිතල පහසුකම් සංවර්ධනය

වැවිලි ප්‍රදේශයන්හි ජනතාව ආරක්ෂිත පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම් , ගමනාගමන දුෂ්කරතා, ආගමික හා සංස්කෘතික පහසුකම් නොමැති වීම, ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා අධ්‍යාපනික පහසුකම් නොමැතිවීම පිළිබඳ ගැටලු වලට මුහුණපානු ලබයි. මෙම ගැටළු මෙන්ම එම ප්‍රදේශයන්හි පවතින යටිතල පහසුකම් අවශ්‍යතා හඳුනාගනිමින් ඒ සඳහා සුදුසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදු වේ. ඒ අනුව ආරක්ෂිත පානීය ජලය , සනීපාරක්ෂක පහසුකම්, ගමනාගමන දුෂ්කරතා පිළිබඳ , ආගමික හා සංස්කෘතික පහසුකම් නොමැති වීම හා ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා අධ්‍යාපනික පහසුකම් නොමැතිවීම පිළිබඳ ගැටලු අවම කිරීම සඳහා ක්‍රීඩා පහසුකම් හා අනෙකුත් පොදු පහසුකම් සැපයීම හා ආපදා තත්ත්ව වලදී වැවිලි ප්‍රජාව සඳහා සහන සැලසීම, වැනි ව්‍යාපෘතීන් සිදු කරනු ලබයි. ප්‍රජා යටිතල පහසුකම් අංශයේ සෞම්‍යමූර්ති තොණ්ඩමාන් පදනම, වැවිලි මානව සංවර්ධන භාරයට අයත් ප්‍රාදේශීය කාර්යාලයන් මෙන්ම දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පළාත් පාලන ආයතන මඟින් ද එම ප්‍රජාව වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සිදුකරයි.

## 2025.12.31 දිනට සම්පූර්ණ කරන ලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය

| ව්‍යාපෘතිය | වාර්ෂික ප්‍රතිපාදන (රු. මි.) | 2025.12.31 දිනට වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය (රු. මි.) | 2025.12.31 දිනට තත්‍ය වියදම (රු. මි.) | භෞතික ඉලක්කය | ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | සම්පූර්ණ කළ ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| **01) යටිතල පහසුකම් සංවර්ධනය (රු මිලියන 500)** | | | | | | |
| වතු තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව (ආහාර, පාඨමාලා ද්‍රව්‍ය, NVQ ඇගයීම) | 29.15 | 29.15 | 24.35 | සිසුන් 300 | - | පාඨමාලා සඳහා සිසුන් 219 ක් ලියාපදිංචි වී ඇති අතර සිසුන් 33 දෙනෙකු පාඨමාලාව අතහැර දමා ඇති අතර සිසුන් 186 දෙනෙකු TVTC හි පාඨමාලාව හදාරා ඇත. |
| නේවාසිකාගාර ප්‍රතිසංස්කරණය, පිරිමි ගැහැණු නේවාසිකාගාර අයිතම මිලදී ගැනීම. | 3.47 | 3.47 | 0.42 | - | අයිතම 17 | ගිනි නිවන උපකරණ (TVTC) නැවත පිරවීම සහ අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම |
| TVTC හි LED විදුලි පහන් සහ නව ශ්‍රවණාගාර ගොඩනැගිලි අයිතම ලබා දීම. | 2.94 | 2.94 | - | - | LED විදුලි පහන් සහ ශ්‍රවණාගාර අයිතම ලබා දී ඇත. | - |
| තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම | 4.08 | 4.08 | 3.15 | - | තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කරන ලදී. | ප්‍රතිසංස්කරණය කරන ලදී |
| උප එකතුව | **39.64** | **39.64** | **27.92** | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වතු ප්‍රජාව සඳහා ඔප්පු නිකුත් කිරීමේ වැඩසටහන | 15.00 | 15.00 | 8.23 | | Blockout survey සැලසුම් 800ක් සම්පූර්ණ කිරීම සහ ඔප්පු 400ක් නිකුත් කිරීම | 1.Block 978ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත<br>2.Block 204ක් සඳහා සමීක්ෂණ සම්පූර්ණ කර ඇත<br>3.ඔප්පු 206ක් සඳහා අයදුම්පත් සම්පූර්ණ කර LRC ක්‍රියාවලිය සිදුවෙමින් පවතී<br>4.RPCs (300) බාධා සහ අයහපත් කාලගුණය හේතුවෙන් සමීක්ෂණ කටයුතු තාවකාලිකව නවතා ඇත<br>5.බදුල්ල දිස්ත්‍රික්කයේ සැලසුම් කළ ඔප්පු භාරදීමේ වැඩසටහන ආපදා හේතුවෙන් නවතා ඇත |
| වතු ප්‍රදේශවල මහජන පහසුකම් වෙත ප්‍රවේශය පහසු කිරීම | 9.50 | 9.50 | 7.31 | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 1ක් | 1.කලුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.<br>2.කලුතර ප්‍රාදේශීය ලේකම් විසින් වියදම් වාර්තාව ඉදිරිපත් නොකළ බැවින්, නිකුත් කළ රු. 5.86 මිලියන මුදල වියදම ලෙස සලකා ඇත. |
| වතු සඳහා ඉඩම් හා නිවාස ප්‍රතිපත්ති සංවර්ධනය | 0.50 | 0.50 | - | | කමිටුව පත් කිරීම, උපදේශක පත් කිරීම සහ ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීම | 3.උපදේශන කමිටුව ස්ථාපිත කර ධාරිතාව වර්ධනය සම්පූර්ණ කර ඇත<br>4. Steering Committee රැස්වීම් 3ක් පවත්වා ඇත.<br>5. උපදේශක පත් කර ප්‍රතිපත්ති කෙටුම්පත සහ වලංගු කිරීමේ වාර්තාව සකස් කර ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | 6. පළමු කමිටු රැස්වීම පවත්වා, කැබිනට් අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.<br>7.අධිකාරියේ කාර්ය මණ්ඩල හිඟය සහ අනෙකුත් ප්‍රමුඛ කාර්යයන් හේතුවෙන් ප්‍රමාදයන් පවතී. |
| වතු ප්‍රජාව සඳහා ඩිජිටල් දත්ත පද්ධතිය සංවර්ධනය | 6.00 | 6.00 | 4.35 | | ජංගම යෙදුම සහ දත්ත එකතු කිරීමේ අයදුම්පත් සම්පූර්ණ කිරීම<br>PCCF නිලධාරීන් පුහුණුව සහ දත්ත එකතු කිරීම | 1.Mobile App වර්ධනය සම්පූර්ණ කර පරීක්ෂණ අදියරේ පවතී.<br>2.PCCF පුහුණුව සම්පූර්ණ කර සියලු වතු ආවරණය කර දත්ත එකතු කර ඇත<br>3. වතු 150කට අධික ප්‍රමාණයක දත්ත සමීක්ෂණ සම්පූර්ණ කර ඇත. |
| වතු කලාපයේ ජීවනෝපාය සංවර්ධනය (පශු සංවර්ධන ව්‍යාපෘති) | 3.50 | 3.50 | 1.29 | | ව්‍යාපෘති 5ක් ආරම්භ කිරීම | 1.පශු වෛද්‍ය කාර්යාලයේ ගොවීන් 100ක් ලියාපදිංචි කර ගොවීන් 50ක් සඳහා පුහුණුව ලබාදී ඇත.<br>2. ප්‍රතිලාභීන් 18ක් සඳහා පළමු වාරිකය නිකුත් කර ඇත.<br>3. තවත් ප්‍රතිලාභීන් 20ක් සඳහා ඇස්තමේන්තු සහ ලේඛන සම්පූර්ණ කර ඇති නමුත් අයහපත් කාලගුණය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO)නිර්දේශ බලාපොරොත්තුවෙන් කටයුතු තාවකාලිකව නවතා ඇත. |
| වතු කලාපයේ ආදර්ශ ගම්මාන සංවර්ධනය | 2.00 | 2.00 | 1.20 | | ව්‍යාපෘතිය 1ක් ආරම්භ කිරීම | මූලික අනුමැති ලබාගෙන ඇත |

# 03. පරිච්ඡේදය

## 3.1. සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 | | සටහන | සත්‍ය 2025 | සත්‍ය 2024 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| 2,682,592,339 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 1,994,559,464 | - | ඒසීඒ-1 |
| 2,682,592,339 | මුළු ආදායම් ලැබීම් (අ) | | 1,994,559,464 | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 3,341,918,106 | - | ඒසීඒ-3 |
| - | හැන්පත් | | 433,927,700 | - | ඒසීඒ-4 |
| 12,000,000 | අත්තිකාරම් ගිණුම | | 43,867,001 | - | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| 12,000,000 | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | **3,819,712,807** | - | |
| | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | **5,814,272,271** | - | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 260,686,383 | - | |
| - | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 5,553,585,888 | - | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | ඒසීඒ-2(ii) |
| 890,500,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලා | 5 | 874,070,950 | - | ඒසීඒ-2(ii) |
| 521,773,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 412,037,589 | - | ඒසීඒ-2(ii) |
| 3,545,739,226 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 3,427,086,450 | - | ඒසීඒ-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 100,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| 4,958,112,226 | මුළු පුනරාවර්තන වියදම (ඊ) | | **4,713,194,989** | - | |
| | මූලධන වියදම් | | | | |
| 50,500,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 36,571,582 | - | ඒසීඒ-2(ii) |
| 1,110,700,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 331,254,456 | - | ඒසීඒ-2(ii) |
| 8,569,451,859 | ප්‍රාග්ධන මාරුකිරීම | 12 | 5,486,463,196 | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 3,500,000 | හැකියා වර්ධනය | 14 | 2,654,039 | - | ඒසීඒ-2(ii) |
| 1,595,800,935 | වෙනත් මූලධන වියදම් | 15 | 1,091,612,223 | - | ඒසීඒ-2(ii) |
| 11,329,952,794 | මුළු මූලධන වියදම (උ) | | **6,948,555,496** | - | |
| - | හැන්පතු ගෙවීම් | | 399,566,641 | - | ඒසීඒ-4 |
| 35,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 147,424,240 | - | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | **546,990,882** | - | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 12,208,741,367 | - | |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (6,655,155,479) | - | |
| | අග්‍රිම සැලසුම් ප්‍රකාශනය අනුව ශේෂය | | (6,655,155,479) | - | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | | ඒසීඒ-3 |
| | | | - | - | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2025 දෙසැම්බර් 31 දිනට**

| | | තතය | |
|---|---|---|---|
| | සටහන | **2025** | **2024** |
| | | රු. | රු. |
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,328,912,315 | - |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 103,557,240 | - |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | **1,432,469,555** | **-** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 15,901,484 | - |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,328,912,315 | - |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 87,655,756 | - |
| අග්‍රිම පරීක්ෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | **1,432,469,555** | **-** |

පිටු අංක. 61 සිට 62 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 63 සිට 65 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ............................ | ...................... | ........................................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2026.02.16 | දිනය : | දිනය : 2026.02.16 |

ඩී.එම්.එම්. දිසානායක
ප්‍රධාන ගණකාධිකාරී
වැව්, සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය,
8 වන මහල, සෙත්සිරිපාය II අදියර,
බත්තරමුල්ල

# 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | සත්‍ය 2025 රු. | සංශෝධිත 2024 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 319,622,241 | - |
| අග්‍රිම ලැබීම් | 3,341,918,106 | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 113,602,103 | - |
| තැන්පතු ලැබීම් | 433,927,700 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | **4,209,070,151** | - |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,271,342,620 | - |
| සහනාධාර සහ මාරුකිරීම් | 189,853,690 | - |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම , මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | 4,077,839,113 | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 5,937,266 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 260,686,383 | - |
| අත්තිකාරම් ගෙවීම් | 113,469,673 | - |
| තැන්පතු ගෙවීම් | 399,566,641 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | **6,318,695,386** | - |
| | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ) | **(2,109,625,235)** | - |
| | | |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| ගිම්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | - | - |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම | 5,474,765 | - |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | **5,474,765** | - |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ) | **(5,474,765)** | - |
| | | |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | **(2,115,100,000)** | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | 2,115,100,000 | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | **2,115,100,000** | - |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | **2,115,100,000** | - |
| | | |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

| සටහන | වියදම | 135-01-01 | 135-01-02 | 135-01-16 | 135-02-17 | 135-02-18 | 135-02-19 | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | | | | |
| 5 | වැටුප්, වේතන හා අනෙකුත් ප්‍රතිලාභ | 22,995,745 | 611,940,387 | 239,134,818 | - | - | - | 874,070,950 |
| 6 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 20,842,770 | 287,136,589 | 104,058,229 | - | - | - | 418,742,841 |
| 7 | සහනාධාර, ප්‍රදාන හා සේවා | - | 17,636,506 | 185,645,006 | 6,705,253 | 3,217,099,686 | - | 3,420,381,198 |
| 8 | පොලී ගෙවීම් | - | - | - | - | - | - | - |
| 9 | වෙනත් පුනරාවර්තන වියදම් | - | - | - | - | - | - | - |
| මුළු පුනරාවර්තන වියදම් (ඇ) | | 43,838,515 | 916,713,482 | 528,838,053 | 6,705,253 | 3,217,099,686 | - | 4,713,194,989 |
| මූලධන වියදම් | | | | | | | | |
| 10 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 1,402,372 | 26,935,835 | 8,233,375 | - | - | - | 36,571,582 |
| 11 | මූලධන වත්කම් අත්පත් කරගැනීම | 1,466,427 | 2,813,468 | 1,194,870 | - | - | 325,779,692 | 331,254,457 |
| 12 | ප්‍රාග්ධන මාරු කිරීම | - | - | 4,164,445 | 206,423,809 | 1,902,450,193 | 3,373,424,749 | 5,486,463,196 |
| 13 | මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම | - | - | - | - | - | - | - |
| 14 | හැකියා වර්ධනය | - | 2,562,349 | 91,690 | - | - | - | 2,654,039 |
| 15 | වෙනත් මූලධන වියදම් | - | - | - | 1,074,376,290 | - | 17,235,933 | 1,091,612,223 |
| මුළු මූලධන වියදම් (ඉ) | | **2,868,799** | **32,311,652** | **13,684,380** | **1,280,800,099** | **1,902,450,193** | **3,716,440,374** | **6,948,555,497** |

## 3.5 ආදායම් එකතුකිරීමේ කාර්යසාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව (රු.මිලි) | | එකතු කරන ලද ආදායම (රු.මිලි) | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 20.02.01.04 | ප්‍රාදේශීය වැවිලි සමාගම් වලින් ලැබෙන කල් බදු කුලී | 2,351 | 2,682.59 | 1,994.55 | 74.35 |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 4,885,000,000 | 4,958,122,226 | 4,713,194,989 | 95.06 |
| ප්‍රාග්ධන | 11,088,000,000 | 11,329,952,794 | 6,948,555,497 | 61.33 |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| 1. | පරිසර අමාත්‍යාංශය | - | 2,365,428 | 2,365,428 | 2,365,428 | 100% |
| 2. | නාගරික සංවර්ධන ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය | - | 119,667.70 | 119,667.70 | 119,667.70 | 100% |
| 3. | මැතිවරණ කොමිසන් සභාව | - | 2,973,002 | 2,973,002 | 2,973,002 | 100% |
| **4.** | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | - | 479,168 | 479,168 | 479,168 | 100% |
| | එකතුව | - | **5,937,265.70** | **5,937,265.70** | **5,937,265.70** | **100%** |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | **2025.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය | **2025.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 1,328,862,315 | 1,328,862,315 | | |
| 9153 | ඉඩම් | - | - | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 50,000 | 50,000 | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | | |

## 3. 9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

* මෙම වාර්තාව කාර්යසාධන වාර්තාව අවසානයේ අමුණා ඇත

## 04. පරිච්ඡේදය

# 4. කාර්යසාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

### 4.1.1 වැවිලි අංශය

| අනු අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 01. | විගණන හා කළමනාකරණ රැස්වීම් වර්ෂය අවසන් වන විට පැවැත්වීම | √ | | |
| 02. | අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම | √ | | |
| 03. | ඉඩම් පැවරීමට අදාළ අයදුම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම | | √ | |
| 04. | වර්ෂය තුළ පවත්වන ලද කාර්යමණ්ඩල රැස්වීම් සංඛ්‍යාව | | | √ |
| 05. | වර්ෂය තුළ අවසන් කරන ලද පෞද්ගලික ලිපිගොනු සංඛ්‍යාව | √ | | |
| 06. | වාර්ෂික කාර්සාධන ඇගයුම්පත්‍ර වර්ෂය තුළ අවසන් කිරීම | √ | | |
| 07. | කාර්යමණ්ඩල ලේඛනය යාවත්කාලීන කිරීම | √ | | |
| 08. | නිවාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම | √ | | |
| 09. | වර්ෂය තුළ සකසන ලද අග්‍රහාර හිමිකම් සංඛ්‍යාව | √ | | |
| 10. | අමාත්‍යාංශයට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණවල ප්‍රගතිය සමාලෝචනය කිරීම | √ | | |
| 11. | අමාත්‍යාංශ විෂය පථයට අදාළ කටයුතු පිළිබඳ තොරතුරු සකස් කිරීම සහ ඒවා ජනමාධ්‍ය / අවශ්‍ය පාර්ශව වෙත නිකුත් කිරීම | √ | | |
| 12. | කාර්යමණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | √ |
| 13. | අමාත්‍යාංශයේ වෙබ් අඩවිය නිතිපතා සැලසුම් කිරීම, යාවත්කාලීන කිරීම | √ | | |
| 14. | වර්ෂය තුළදී තැපැල් කළමනාකරණ පද්ධතියට ඇතුළත් කරන ලද ලිපි සංඛ්‍යාව | √ | | |
| 15. | වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම | √ | | |
| 16. | වැවිලි ක්ෂේත්‍රයේ බල ශක්ති අවශ්‍යතාවය සැපිරීම සඳහා ජෛව ස්කන්ධ බල ශක්ති සැලසුමක් සකස්කර | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| | 2024 වර්ෂයේදි නිම කිරීම | | | |
| 17. | ශ්‍රී ලංකාවේ ස්ත්‍රී /පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම සඳහා වැවිලි ක්ෂේත්‍රයේ සැලැස්මක් 2023 දී සැකසීම | √ | | |
| 18. | අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණ සාකච්ඡා හා වැඩමුළු පැවැත්වීම | √ | | |
| 19. | තේ පර්යේෂණ ආයතන විසින් විදේශ ආයතන සමඟ එළඹීමට නියමිත අවබෝධතා ගිවිසුම් සැකසීම | | √ | |
| 20. | මහා භාණ්ඩාගාරයට 2024 වර්ෂය තුළ ලබාදිය යුතු මූල්‍ය වාර්තා | √ | | |
| 21. | ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | √ | | |
| 22. | වර්ෂය තුළ අනුමත කරන ලද ක්‍රියාත්මක සැලසුම් | √ | | |

## 4.1.2 ප්‍රජා යටිතල පහසුකම් අංශය

| විශේෂිත දර්ශක | | අපේක්ෂිත ඉලක්කය 2025 වර්ෂය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙසනතා නිමවුම | | |
|---|---|---|---|---|---|
| | | | **100%-90%** | **75%-89%** | **50% -74%** |
| 01) නිම කරන ලද නව නිවාස සංඛ්‍යාව | වතු නිවාස වැඩසටහන (ඉදිකළ) | නිවාස 377ක | ✓ | | |
| | ඉන්දියානු ආධාර යටතේ ඉදිකරන ලද නිවාස (4000) | නිවාස ඒකක 138ක් සම්පූර්ණ කිරීම(ව්‍යාපෘති 4) | | ✓ | |
| | ඉන්දියානු ආධාර යටතේ ඉදිකරන ලද නිවාස (4000) | නිවාස ඒකක 150ක් සඳහා යටිතල පහසුකම් ලබාදීම (ව්‍යාපෘති 3) | | | ✓ |
| | ඉන්දියානු ආධාර යටතේ ඉදිකරන ලද නිවාස (10000) | නිවාස ඒකක 200 ක් සම්පූර්ණ කිරීම | | | ✓ |
| | ඉන්දියානු ආධාර යටතේ ඉදිකරන ලද නිවාස සඳහා යටිතල පහසුකම් ලබාදීම. (10000) | නිවාස ඒකක 200 ක් සම්පූර්ණ කිරීම | | | |
| 02) නුවරඑළිය, බදුල්ල සහ මහනුවර වතු පාසල් 60ක සුහුරු පන්ති කාමර ස්ථාපිත කිරීම | | | | | |
| 2.1) මිලදී ගත් උපකරණ කට්ටල සංඛ්‍යාව | | 60 | | | ✓ |
| 2.2) අලුත්වැඩියා කළ සුහුරු පන්ති කාමර සංඛ්‍යාව | | 60 | | | |

| | | | | |
|---|---|---|---|---|
| 03) යටිතල පහසුකම් සංවර්ධනය (රු 100 මිලියන) | | | | |
| 3.1) විරැකියාවෙන් මිදීම සඳහා වෘත්තීය පුහුණුව ලබාදුන් වතු තරුණ තරුණියන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් 350 | | | ✓ |
| 3.2) සිදුකළ පානීය ජල පහසුකම් ව්‍යාපෘති සංඛ්‍යාව | 10 | | | ✓ |
| 3.3) සංවර්ධනය කළ ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව | 97 | ✓ | | |
| 3.4) සිදු කළ විශේෂ අවශ්‍යතා ව්‍යාපෘති ගණන | 10 | | | ✓ |
| 3.5) ප්‍රජා සවිබල ගැන්වීම සහ ජීවනෝපාය සංවර්ධනය යටතේ රැකියා විරහිත ස්වයං රැකියා සඳහා පහසුකම් සලසන ලද පවුල් සංඛ්‍යාව (එළුවන් බෙදා දීමේ ව්‍යාපෘතිය පමණක්) | පවුල් 25 | ✓ | | |
| 3.6) දත්ත සමීක්ෂණය සඳහා තොරතුරු ලබාගත් වතු පවුල් සංඛ්‍යාව | 993,021 (මූලාශ්‍රය:- වැවිලි මානව සංවර්ධන භාරය, 2024) | | | ✓ |
| 04) වැවිලි අංශයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති (රු.බිලි. 2 වැඩසටහන) | | | | |
| 4.1) ආගමික සහ සංස්කෘතික පහසුකම් ලබා දුන් ආගමික ස්ථාන සංඛ්‍යාව | 595 | | | ✓ |
| 4.2) පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂණ පහසුකම් ව්‍යාපෘති සංඛ්‍යාව | ජල සැපයුම් ව්‍යාපෘති සංඛ්‍යාව 15 සනීපාරක්ෂණ පහසුකම් ව්‍යාපෘති සංඛ්‍යාව 2 | | | ✓ |
| 4.3) වතුකරයේ ආපදාවට ලක්වූ ජනතාව සඳහා සැපයු සෙවිලි තහඩු සංඛ්‍යාව | සෙවිලි තහඩු 8500<br>ලයින් කාමර3ක් සඳහා සෙවිළි තහඩු | | | ✓ |
| 4.4)සංවර්ධනය කළ පාසල් සංඛ්‍යාව | | | | |
| 4.4.1) පන්ති කාමර පහසුකම් සැපයු පාසල් සංඛ්‍යාව | පාසල් 24 | | | ✓ |
| 4.4.2) STEM ගුරු පුහුණුව ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන්-2400 | ✓ | | |
| 4.4.3) තාක්ෂණික ඉගැන්වීම් උපකරණ ලබාදුන් පාසල් සංඛ්‍යාව | 412 | | | ✓ |
| 4.4.4) පාසල් සංවර්ධන ව්‍යාපෘති සිදුකළ පාසල් සංඛ්‍යාව | පාසල් 24 | | | ✓ |
| 4.5)ක්‍රීඩා සංවර්ධනය | | | | |
| 4.5.1) සංවර්ධනය කළ ක්‍රීඩා පිටි ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති 73 | | | ✓ |
| 4.5.2) ක්‍රීඩා උපකරණ ලබාදුන් ක්‍රීඩා සමාජ සංඛ්‍යාව | ක්‍රීඩා සමාජ 1351 | | | ✓ |
| 4.6) සංවර්ධනය කළ මාර්ග හා පාලම් | ව්‍යාපෘති 396 | | | ✓ |

| | | | | |
|---|---|---|---|---|
| ව්‍යාපෘති සංඛ්‍යාව | | | | |
| 4.7)පොදු පහසුකම් ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති 73 | | | ✓ |
| 4.8) වතුකරයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම සඳහා සිදු කළ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | | | |
| 4.8.1) සනීපාරක්ෂක කට්ටල සංඛ්‍යාව | 2000 | | | ✓ |
| 4.8.2) මාතෘ කට්ටල සංඛ්‍යාව | 1000 | | | |
| 4.9) ප්‍රජා සවිබල ගැන්වීම සහ ජීවනෝපාය සංවර්ධනය | | | | |
| 4.9.1) සිදු කළ තරුණ සමුළු සංඛ්‍යාව | 1 | ✓ | | |
| 4.9.2) ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව | 4 | | | ✓ |
| 4.10) හිමිකම් ඔප්පු ප්‍රදානය කළ සංඛ්‍යාව | 2000 | | | ✓ |

අත්තිවාරම් මට්ටමට සම්පූර්ණ කළ නිවාස- ඒකක 406, බිත්ති මට්ටමට සම්පූර්ණ කළ නිවාස- ඒකක 35, වහළ මට්ටමට සම්පූර්ණ කළ නිවාස- ඒකක 18 සහ ඉදිකිරීම් අවසන් කළ නිවාස- ඒකක 5

## 05. පරිච්ඡේදය

# 5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

### 5.1.1 වැවිලි අංශය

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මෙ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50% - 74% | 75% - 100% |
| 02 | 2.4: 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතිම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරීවන්නා වූ කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාලගුණ තත්වයන් නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නාවූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම. | සිටුවන ලද රබර් නව වගා/ නැවත වගා හෙක්ටයාර ප්‍රමාණය (2025)<br>නව වගා (කුඩා වතු) - ඉලක්කය හෙක්.445<br>නව වගා (කුඩා වතු) ප්‍රගතිය- හෙක්.431.58<br>නැවත වගා (කුඩා වතු) - ඉලක්කය හෙක්.240.81<br>නැවත වගා (කුඩා වතු) - ප්‍රගතිය හෙක්.221.66 | | | ✓ |
| | | *තේ නැවත වගාව -<br>නැවත වගාව සඳහා ඉලක්කගත<br>බිම් සැකසීම හා පස පුනරුත්තාපනය - 1<br>හෙක්ටයාර් ප්‍රමාණය - හෙක්.910<br>ප්‍රගතිය - හෙක්.906.6 | | | ✓ |
| | | *පාළු සිටුවීම<br>සිටුවන ලද පාළු පැළ සංඛ්‍යාව-<br>පාළු සිටුවීම (2025 අවසරපත්) – 2,112,500<br>පැළ<br>ප්‍රගතිය - 2,253,531<br>පාළු සිටුවීම අදියර 2 (පෙර වර්ෂ වල බැදීම් ඇති කරගත්) – 1,039,139 පැළ<br>ප්‍රගතිය - 1,043,207 පැළ | | | ✓ |
| | | *භෝග වැඩිදියුණු කිරීම<br>පාලිත තත්ව යටතේ දෙමුහුම්කරණය කරනලද (Controlled Hybridization) - මුහුම් (crosses) | | | ✓ |
| | | අඛණ්ඩ ප්‍රභේද නිර්දේශ ක්‍රියාවලිය සඳහා වන මූලික, ප්‍රථම අදියර, දෙවන අදියර හා අනුවර්තී පර්යේෂණ - 33 | | | ✓ |
| | | නියඟය සඳහා ප්‍රතිරෝධී දර්ශ ඇගයීමේ පර්යේෂණ - 04 | | | ✓ |
| | | බිබිලි අංගමාරය සඳහා ප්‍රතිරෝධී දර්ශ ඇගයීමේ පර්යේෂණ - 01 | | | ✓ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | නෙමටෝඩාවන් සඳහා ප්‍රතිරෝධී දර්ශ ඇගයීමේ පර්යේෂණ - 04 | | | ✓ |
| | | පටක රෝපණ තාක්ෂණය හා ප්‍රේරිත විකරණ (Mutation Breeding) තේ වගාවේ බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන් සඳහා භාවිතා කිරීමේ - විද්‍යාගාර පර්යේෂණ 02, ක්ෂේත්‍ර පර්යේෂණ 02 හා ගැමා කිරණ භාවිතයෙන් සිදුකල ප්‍රේරිත විකරණ සිදුකිරීම | | | ✓ |
| | | පාංශු ඛාදනය අවම කිරීම සඳහා ඉදිකරන ලද ජෛව වැටි.<br>පර්යේෂණ 01 | | | ✓ |
| 08 | 8.2: විවිධාංගීකරණය, තාක්ෂණය ඉහළනැංවීම සහ නවෝත්පාදනය තුළින් සහ ඉහළ වටිනාකම් එකතුකරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමුකිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදනයක් ලබාගැනීම. | *අගය එකතු කළ තේ නිෂ්පාදන හා තේ වල සෞඛ්‍යමය ප්‍රතිලාභ පිළිබඳ සිදුකළ අධ්‍යයන | | | ✓ |
| | | • තහවුරු කරන ලද FT-NIR තාක්ෂණය භාවිතයෙන් සීනි මිශ්‍ර කළ තේ හඳුනාගැනීම සඳහා සකස් කරන ලද ක්‍රමාංකන ආකෘතිය. | | | ✓ |
| | | *තාක්ෂණ ව්‍යාප්තිය<br><br>•තාක්ෂණික පණිවිඩ ගණන<br>• පවත්වන ලද අනුවර්තී පර්යේෂණ - 6<br>• පිහිටුවන ලද තේ තාක්ෂණ උද්‍යාන- 6 | | | ✓<br><br>✓ |
| 09 | 9.4: 2030 වනවිට යටිතල පහසුකම් වැඩිදියුණුකිරීම සහ කර්මාන්ත තිරසර කිරීම සඳහා නව තාක්ෂණය මගින් සංවර්ධනය කිරීම. කර්මාන්ත ක්‍රියාවලියේදී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිතාකිරීම වැඩිදියුණුකිරීම, පිරිසිදු සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළතාක්ෂණයන් උපයෝගීකරගැනීමට සියලුම රටවල් ඔවුන්ට පවත්නා ධාරිතාවන් අනුව මේ සම්බන්ධයෙන් පියවරගැනීම. | අගය එකතු කිරීම තුළින් පොල් ආශ්‍රිත කර්මාන්තවල ආදායම වැඩි කිරීම සහ සායනික අධ්‍යයනය තුළින් පොල්වල සෞඛ්‍ය ප්‍රතිලාභ හෙළිදරව් කිරීම.<br>* නවෝත්පාදන සහ ක්‍රියාවලි වැඩි දියුණු කිරීම තුළින් වැඩි දියුණු කරන ලද පොල් කර්මාන්තයේ තාක්ෂණික හැකියාව.<br>* පොල් මදය / පොල් වතුර පදනම් කරගත් නිෂ්පාදන සහ වැඩි දියුණු කරන ලද / හඳුන්වා දුන් තාක්ෂණයන් ගණන<br>* පොල් ලෙලි සහ කොහු ආශ්‍රිත වැඩි දියුණු කරන ලද / හඳුන්වා දුන් තාක්ෂණයන් සංඛ්‍යාව | | ✓ | |
| 17 | 17.11: අවම වශයෙන් සංවර්ධනය වූ රටවලින් ලෝක අපනයනයට සපයන කොටස 2020 වන විට දෙගුණ කිරීමේ දැක්මකින් යුක්තව, සංවර්ධනය වෙමින් පවත්නා රටවල අපනයන | විදේශීය වාණිජ මණ්ඩල සහ විදේශීය රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල සමඟ සම්බන්ධ වීමෙන් සහ විදේශීය රටවල පැවති ජාත්‍යන්තර අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් වලට සහභාගී වීමෙන් නව අපනයන අවස්ථා හඳුනා ගැනීම<br>* සහභාගීවූ වෙළඳ ප්‍රදර්ශන | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සැළකිය යුතු මට්ටමකින් වර්ධනය කිරීම. | සංඛ්‍යාව (ඉලක්කය-33)<br>*තේ අපනයන ඉලක්කය<br>- කි.ග්‍රෑ.මිලි. 255<br>තේ අපනයන ආදායම<br>ඇ.ඩො.මි.1520<br>* පොල් අපනයන ඉලක්කය<br>- ඇ.ඩො.මි.852.00<br>* පොල් අපනයන ආදායම<br>- ඇ.ඩො.මි.900.00<br>* රබර් අපනයන ඉලක්කය<br>- ඇ.ඩො.මි.1007.00<br>* රබර් අපනයන ආදායම<br>- ඇ.ඩො.මි.955.00 | | | ✓<br>✓<br>✓<br>✓<br>✓ |

## 5.1.2 ප්‍රජා යටිතල පහසුකම් අංශය

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | **0%-49%** | **50%-74%** | **75% -100%** |
| තිරසර සංවර්ධන ඉලක්කය 11<br>**2030 වනවිට සියළු දෙනාටම ප්‍රමාණවත්, ආරක්ෂිත නිවාස ලැබීම හා වාසස්ථාන වැඩිදියුණු කිරීම තහවුරු කිරීම** | ලයින් කාමරවල වෙසෙන පවුල් 4,500 ක් සඳහා නව නිවාස හා ඉඩම් හිමිකම ලබාදීම<br><br>අබලන් වූ ලයින් කාමර 1000 ක වහල නැවත සෙවිළි කිරීම | ඉදි කරන ලද නව නිවාස සංඛ්‍යාව හා ලබාදුන් ඉඩම් හිමිකම් ඔප්පු ප්‍රමාණය<br><br>සෙවිළි කරන ලද ලයින් කාමර සංඛ්‍යාව | 18%<br><br>3.4% | | |
| තිරසර සංවර්ධන ඉලක්ක 6<br><br>**වසර 2030 වනවිට සියළු දෙනාටම ප්‍රශස්ත මට්ටම් යටතේ පානීය ජලය ලබාගැනීමට සමාන අවස්ථා තහවුරු කිරීම.**<br><br>**වසර 2030 වනවිට ප්‍රමාණවත් සනීපාරක්ෂාවක් හා ස්වස්ථතාවක් ලැබීමේ අවස්ථා සියළු දෙනාටම අත්පත්කර ගැනීම** | පානීය ජල පහසුකම් නොමැති පවුල් 4000 ක් සඳහා ජල පහසුකම් සම්පාදනය<br><br>ප්‍රමාණවත් සනිපාරක්ෂක පහසුකම් නොමැති පවුල් 3500 ක් සඳහා සනිපාරක්ෂක පහසුකම් ලබා දීම | පානීය ජල පහසුකම් ලැබූ පවුල් සංඛ්‍යාව<br><br>සනිපාරක්ෂක පහසුකම් ලැබූ පවුල් සංඛ්‍යාව / | | 53.6%<br><br>41.5% | |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

### 5.2.1 වැවිලි අංශය

**ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ**

- පහත රට කලාපය සඳහා නව ප්‍රභේද තේ 4 ක් නිර්දේශ කිරීම (TRI 5007, TRI 5008, TRI 5009, TRI 5010)
- 2025 වර්ෂයේ අපේක්ෂිත තේ අපනයන ප්‍රමාණය සඳහා වූ ඉලක්ක, අපේක්ෂිත මට්ටම කි.ග්‍රෑ.මිලි. 255 ඉක්මවමින් ලඟා කරගෙන ඇත.
- 2025 වර්ෂයේ තේ අපනයන ආදායම් ඉලක්කය ඇ.ඩො.මි.1520 ඉක්මවමින් ළඟාකරගෙන ඇත.
- දැනට ජාතික වශයෙන් ප්‍රකාශයට පත්ව ඇති තිරසාර සංවර්ධන ඉලක්ක හා දර්ශකයන්ට සම්බන්ධව දැකිය හැකි වැවිලි ක්ෂේත්‍රයේ උප දර්ශක ප්‍රමාණයක් ගොඩනගා ගැනීමට හැකිවීම.
- 2025 වර්ෂයේ පොල් ක්ෂේත්‍රයේ ඉලක්කගත අපනයන ආදායම ඇ.ඩො.මි.900 ක් වූ අතර, එය ඉක්මවා 2025 වර්ෂයට ඇ.ඩො.මි.1220 ක් ලබා ගැනීමට හැකි විය.

**ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග**

- 2025 වසර අග භාගයේදී ඇතිවූ අනපේක්ෂිත 'දිට්වා' සුළි කුණාටු තත්ත්වය හේතුවෙන් සමස්ත වැවිලි ක්ෂේත්‍රයටම ප්‍රබල හානි සිදු වීම. අයහපත් කාලගුණික තත්වය
- ජාතික වශයෙන් දායකත්වය සැපයිය හැකි යාවත්කාලීන කළ හැකි දත්ත සහිත ඉලක්ක නිශ්චය කිරීමේ අපහසුව.
- අමාත්‍යාංශයීය විෂයපථයන් වෙනස්වීම හේතුවෙන් ඉලක්ක නිගමනය කර ඒ සඳහා වූ දර්ශක ගොඩනගා ගැනීමේ අපහසුව.
- ගෝලීය දේශගුණික විපර්යාස හා ස්වභාවික උපද්‍රව, විවිධ ලෙඩ රෝග හා සත්ත්ව හානි මඟින් වගාවන් විනාශවීම හා ඵලදාව අඩුවීම
- විධිමත් වගාවන් ලෙස ස්ථාපිත වී නොමැති සාම්ප්‍රදායික කර්මාන්තයක් වශයෙන් පවතින කිතුල් හා තල් වගාවන් පිළිබඳ, කර්මාන්තකරුවන් පිළිබඳ හා වගාව ආශ්‍රිතව දත්ත නොමැතිවීම. එම වගාවන් ආශ්‍රිත කර්මාන්ත කුඩා පරිමාණයෙන් සම්ප්‍රදායික හා ගෘහ කර්මාන්ත ලෙස ව්‍යාප්ත වී ඇති නිසා තාක්ෂණය යොදා ගැනීමට හෝ යාන්ත්‍රිකරණය කර සංවර්ධනය කිරීමට අපහසු වීම.
- වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව ශ්‍රම බලකාය සීඝ්‍රයෙන් අඩුවීම හා තරුණ ශ්‍රමිකයින් සේවා අංශ වෙත යොමු වීම හේතුවෙන් මෙම ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනයක් පවත්වාගෙන යාමට බාධා ඇතිවීම.
- පොල් වගාව සඳහා බලපාන සුදු මැස්සා , බ්‍රොන්ටිස්පා වැනි කෘමි හා පළිබෝධ උවදුරු හේතුවෙන් පොල් වගාවට හානි සිදු වීම හා ඒ හේතුවෙන් පොල් වගාවේ අස්වැන්න අඩු වීම
- තේ ක්ෂේත්‍රයේ ශ්‍රම දායකත්වය වෙනුවෙන් ඉහළ පිරිවැයක් දැරීමට සිදුවීම හේතුවෙන් නිෂ්පාදන වියදම වැඩි වී ලාභදායිත්වය ප්‍රබල ලෙස අඩු වීම.
- වැවිලි ක්ෂේත්‍රයේ අගය එකතු කළ නිෂ්පාදන හා ආදායම සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම.

- වැවිලි ක්ෂේත්‍රයේ නිෂ්පාදනයන් අපනයනය සඳහා සුවිශේෂී ජාත්‍යන්තර වෙළෙඳ පොළ (Wich market) අත්කර ගැනීමේදී හා ප්‍රවිෂ්ට වීමේදී දක්වන පසුගාමීත්වය සහ ඒ සඳහා නිසි යාන්ත්‍රණයක් නොමැති වීම.
- වැවිලි ක්ෂේත්‍රයේ ඵලදායී ඉඩම් බොහෝමයක් තවමත් ඌන උපයෝජිත තත්ත්වයේ පැවතිම.
- ප්‍රාදේශීය වැවිලි සමාගම් සම්පව අධීක්ෂණය කිරීම සඳහා ප්‍රමාණවත් යාන්ත්‍රණයක් නොමැති වීම හේතුවෙන් වැවිලි ක්ෂේත්‍රයේ නිෂ්පාදනයට හා ඵලදායීතාවයට යම් බලපෑම් එල්ල විය හැකි වීම.
- ඇතැම් වැවිලි සමාගම් දිගින් දිගටම පාඩු ලැබීම් හේතුවෙන් නිෂ්පාදනය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන සැපයීමේ අපහසුතා හේතුවෙන් නිෂ්පාදනය හා ඵලදායීතාවය අඩුවීම.
- වැවිලි ක්ෂේත්‍රයේ නිෂ්පාදන දේශීයව හා විදේශීය වෙළඳ පොළ තුළ අලෙවිකරණ යාන්ත්‍රීණයන්හි (Marketing mechanisms) පවතින දුර්වලතා හේතුවෙන් .

## 5.2.2 ප්‍රජා යටිතල පහසුකම් අංශය

ශ්‍රී ලංකාවේ වාසය කරන මිලියනයක පමණ වන වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම මෙම වතු නිවාස අංශයේ ප්‍රමුඛ කාර්යභාරයකි.

වැවිලි ප්‍රජාව යනු, ශ්‍රී ලංකාවේ අනෙකුත් ජන කොටස් හා සැසඳීමේදී, වඩාත් පහළ ජීවන තත්ත්වයකට උරුමකම් කියනු ලබන ජන කොට්ඨාසයකි. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්ත වලට අනුව ලංකාවේ අනෙකුත් ජන කොටස් හා සැසඳීමේදී ඔවුන් උපයන මාසික ආදායම පහළ මට්ටමක පවතින අතර, ප්‍රජාවගේ විශේෂයෙන් වයස අවුරුදු 05 ට අඩු දරුවන්ගේ මන්ද පෝෂණ තත්ත්වය ඉතා ඉහළ අගයක් ගනී. ජනගහණයෙන් වැඩි ප්‍රතිශතයක් සඳහා ආරක්ෂිත පානීය ජල සම්පාදනය ගැටළුවක් වී ඇත. එමෙන්ම ඉතා අවම පහසුකම් සහිත වර්ග අඩි 200 ට පමණ සීමාවූ ටකරන් සෙවිලිකල ලැයින් කාමර සිය වාසස්ථාන කර ජීවත් වේ. තිරසර ලෙස සංවර්ධිත වූ ශ්‍රී ලංකාවක් සඳහා වන තිරසර සංවර්ධන අරමුණු අතරට ගැනෙන දිළිඳුකම අවම කිරීම තහවුරු කිරීම ළමා මන්ද පෝෂණ තත්ත්ව දර්ශක වලට ළඟාවීම සහ ආරක්ෂිත හා වැඩිදියුණු කල වාසස්ථාන හිමිකර දීම, සැමට ප්‍රශස්ථ මට්ටමේ පානීය ජලය ලබා ගැනීමේ අවස්ථා හිමිකර දීම යන ඉලක්ක සාක්ෂාත් කිරීම සඳහා ක්‍රියා කිරීමේදී, එම පහසුකම් අවම මට්ටමේ පවතින වැවිලි ප්‍රජාව කෙරෙහි වඩාත් අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව තිබේ.

ඒ අනුව වැවිලි ප්‍රජාව සඳහා සිය ආරක්ෂිත වාසස්ථාන හිමිකර ගැනීමේ අයිතිය තහවුරු කිරීම උදෙසා ඔවුන් වෙත සින්නක්කරව හිමි වූ පර්චස් 7 ක භූමි භාගයක් හා පානීය ජල පහසුකම් සමඟ වැඩි දියුණු කරන ලද සනීපාරක්ෂක පහසුකම් වලින් යුක්ත තනි නිවහනක් ලබා දීමට හැකි වීම මෙම අංශය ලැබූ විශේෂ ජයග්‍රහණයක් ලෙස සැළකිය හැකිය. කෙසේ නමුත්, විවිධ පාරිසරික හේතු හා තාක්‍ෂණික හේතූන් මත අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීම අභියෝගයක් වී ඇත.

නිවාස ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොමැති වීමත්, නිවාස ඉදිකිරීම සඳහා සුදුසු ඉඩකඩම් සපයා ගැනීම අසීරු වීමත්, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දීර්ඝ

කාලයක් ගතවීමත්, විශේෂයෙන් නිවාස ඉදි කිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදයේ පවතින දුර්වලතාත් හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම අභියෝගයක් වී ඇත.

වැව්ලි ප්‍රජාවගෙන් හරි අඩකට පමණ ආරක්ෂිත පානීය ජල පහසුකම් නොමැති වීමත්, ශ්‍රී ලංකාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමේ කාර්යභාරයේදී එම ප්‍රජාවගේ පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ නොකර එම ඉලක්ක වෙත ලඟාවීම අභියෝගයක්ව ඇති අවස්ථාවක, වැව්ලි ප්‍රජාව ඉලක්ක කොට ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීම හා ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීමත් විශේෂයෙන්ම ආරක්ෂිත පානීය ජලය සපයා ගැනීම සඳහා සුදුසු ජල මූලාශ්‍ර අවශ්‍ය වීමත්, පවතින ජල මූලාශ්‍ර පාදක කර ගනිමින් ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විශාල මුදලක් ඒ සඳහා ප්‍රමාණවත් පරිදි ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමට අදාළ පාර්ශවයන් කටයුතු නොකිරීමත් හේතුවන් අපේක්ෂිත ඉලක්ක සුපරා ගැනීම ගැටළුක් වී ඇත.

වැව්ලි ප්‍රදේශ බොහොමයක් කඳුකරයට සීමාවී ඇති අතර, එහි භූමි විෂමතාව සැලකිල්ලට ගැනීමේදී ඉදිකිරීම් ව්‍යාපෘති සිදු කිරීමට අධික පිරිවැයක් දැරීමට සිදුවීමත්, එම ප්‍රදේශ බොහොමයක් අධි ආරක්ෂිත සංවේදී කලාප වශයෙන් හඳුන්වා දීම හේතුවෙන් ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් කල් ගත වීමත්, එසේ නොමැති අත්‍යවශ්‍ය ස්ථාන සඳහා නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පාරිසරික හේතු නිසා අනුමත නොකිරීම ගැටළුවක් වී ඇත.

# 06. පරිච්ඡේදය

## 6. මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

### 6.1.1 වැවිලි අංශය

| සේවක ගණය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය | අතිරික්ත / පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 59 | 48 | 11 |
| තෘතියික | 5 | 3 | 2 |
| ද්විතියික | 684 | 600 | 84 |
| ප්‍රාථමික | 80 | 59 | 21 |
| එකතුව | 828 | 710 | 118 |

**මානව සම්පත් හිඟය හා අතිරික්තය බලපානු ලබන ආකාරය**

ඇතැම් තනතුරුවල පුරප්පාඩු පැවතීම හේතුවෙන් ආයතනයේ අපේක්ෂිත ප්‍රතිඵල හා නිමැවුම් ලබා ගැනීමට අසීරු වී ඇත. සමස්ථයක් ලෙස පවත්නා කාර්ය මණ්ඩලයේ කළමනාකරණය මගින් අපේක්ෂිත අරමුණු කරා සාධනීය ලෙස ළඟා වී ඇත.

### 6.1.2 ප්‍රජා යටිතල පහසුකම් අංශය

| සේවක ගණය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය | අතිරික්ත / පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 21 | 17 | ඇබෑර්තු - 05* |
| තෘතියික | 04 | 01 | ඇබෑර්තු - 03 |
| ද්විතියික | 282 | 258 | ඇබෑර්තු - 26** |
| ප්‍රාථමික | 23 | 14 | ඇබෑර්තු - 09 |
| එකතුව | **330** | **290** | **43** |

* 2025.12.31 දිනට <u>ජ්‍යෙෂ්ඨ මට්ටමේ</u> අනුමත සේවක සංඛ්‍යාව 21 ක් වන අතර, පවතින සේවක සංඛ්‍යාව 17 කි. පවතින සේවක සංඛ්‍යාව තුළ අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන) තනතුර දරන ලද නිලධාරිනිය නිත්‍ය තනතුරට අමතරව වැඩ බැලීමේ පදනම මත සේවය කර ඇති අතර, අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) තනතුර දරන ලද නිලධාරියා කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇත. ඒ අනුව, මෙම තනතුරු 02 පුරප්පාඩු තනතුරු ලෙස සැලකේ.

එසේම, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) තනතුර දරන ලද නිලධාරිනිය වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ද්විතීයන පදනම මත තාවකාලිකව මුදාහැර ඇත. එබැවින්, නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩු වශයෙන් සලකා නොමැත. මේ අනුව, ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සංඛ්‍යාව 05 ක් වේ.

**<u>ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු (2025.12.31 දිනට)</u>**

අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන) - 01, අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) – 01 , අධ්‍යක්ෂ (ඉංජිනේරු) – 01, සහකාර ලේකම් (පාලන) - 01 ,අභ්‍යන්තර විගණක - 01

** පවතින ද්විතියික සේවක සංඛ්‍යාව 258 තුළ ස්ථිර නිලධාරීන් 256 ක් සිටින අතර, තාක්ෂණ නිලධාරි තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති නිලධාරියෙකු (01) සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුර සඳහා නිත්‍ය තනතුරට අමතරව රාජකාරි ඉටුකිරීම සඳහා පත් කළ නිලධාරියෙකු (01) ඇතුළත් වේ.

**ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය.**

ඉහත වගුවේ සඳහන් පරිදි ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 05 ක් ඇතුළුව පුරප්පාඩු 43 ක් පැවතුණ ද, සේවයේ නිරත නිලධාරීන් විසින් තම රාජකාරිවලට අමතරව පුරප්පාඩු තනතුරුවල රාජකාරි ද ආවරණය කරමින් කැපවීමෙන් හා සඵලදායි ලෙස රාජකාරිවල නිරත වෙමින් මෙම අංශයේ කාර්යයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා මනා සේවයක් ලබා දී ඇත. කෙසේ වෙතත්, පවතින පුරප්පාඩු ප්‍රමාණයත් සමග රාජකාරි පවත්වාගෙන යාමේදී විවිධ දුෂ්කරතාවලට මුහුණදීමට සිදුවී ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

### 6.3.1 වැවිලි අංශය

I. දේශීය පුහුණු අවස්ථා

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය රු (000') | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 1 | Certificate Course in Conveyancing | 1 | මාස 01 | 15,000.00 | | දේශීය | නීතිය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම |
| 2 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගැනීම සඳහා දෙමළ භාෂා පාඨමාලාව | 46 | පැය 150 | 37,500.00 | | දේශීය | රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම තුළින් රාජ්‍ය සේවයේ කටයුතු කාර්යක්ෂමව ඉටු කරලීම |
| 3 | රජයේ ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 1 | වසර 01 | 75,000.00 | | දේශීය | ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 4 | “තිරසර වැවිලි ආර්ථිකයක් සඳහා රාජ්‍ය ව්‍යවසායන් මෙහෙයවීම” පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන | 150 | දින 01 | 154,251.60 | | දේශීය | රාජ්‍ය ව්‍යවසායන් මෙහෙයවීම පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි සභාපතිවරුන්, ආයතන ප්‍රධානීන්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ අමාත්‍යාංශ නිලධාරීන් දැනුවත් කිරීම |
| 5 | “ආචාරධර්මානුකූල හා කාර්යක්ෂම කාර්යාල කාර්යසහයක සේවක මණ්ඩලයක් බිහි කිරීම” මැයෙන් පුහුණු වැඩසටහන | 35 | දින 02 | 267,448.00 | | දේශීය | කාර්යාල කාර්ය සහයකයින් සඳහා වගකීම් හා ආචාරධර්ම වලින් පිරිපුන් කාර්යාල කාර්ය සහයකයන් කණ්ඩායමක් ගොඩනැංවීම සඳහා ආකල්ප හා වෘත්තීය දැනුම ඉහල නැංවීම |
| 6 | “පුද්ගල හා රැකියා ජිවිතයේ සමතුලිත බව ඇති කිරීම සඳහා මනෝ උපදේශක වැඩසටහන - 2025 | 240 | දින 01 | 148,146.00 | | දේශීය | අමාත්‍යාංශයේ සියළු නිලධාරීන්ගේ පුද්ගල හා රැකියා ජිවිතයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම |
| 7 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සැලසුම් කිරීම සහ රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | දින 02 | 36,000.00 | | දේශීය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා රෙගුලාසි පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම |
| 8 | ඵලදායි කාර්යාල ක්‍රම තුලින් කාර්යක්ෂම වැඩ පරිසරයක් නිර්මාණය කිරීම පිළිබඳ ඵලදායිතා පුහුණු වැඩසටහන - 2025 | 175 | දින 01 (කණ්ඩායම් 03 සඳහා දින 03) | 108,890.00 | | දේශීය | ඵලදායිතා සංකල්පය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දීම තුලින් අමාත්‍යාංශයේ කාර්යාල කටයුතු වල ඵලදායිතාවය ඉහළ නැංවීම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 9 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය - 2024 පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන | 140 | දින 01 | 342,210.00 | | දේශීය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය - 2024 පිළිබඳ අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් හා විෂය නිලධාරීන් දැනුවත් කිරීම තුළින් ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයෙන් හා වගකීමෙන් ඉටු කිරීමට මඟපෙන්වීම් ලබා දීම |
| 10 | අනුකූලතාවය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව - නීති විෂය | 1 | දින 10 | 20,000.00 | | දේශීය | අනුකූලතාවය පිළිබඳ දැනුම ලබාදීම |
| 11 | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | 2 | දින 01 | 13,000.00 | | දේශීය | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ දැනුම ලබාදීම |
| 12 | Speech Speechcraft Training Program 2025 | 1 | සති 12 (පැය 2 බැගින්) | 35,000.00 | | දේශීය | ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා කථන හැකියාව වර්ධනය |
| 13 | නිවාඩු විෂය භාර නිලධාරියාගේ කාර්යභාරය පිළිබඳ පුහුණුව. | 1 | දින 01 | 6,500.00 | | දේශීය | නිවාඩු විෂය භාර නිලධාරී දැනුම හා අවබෝධය වැඩිදියුණු කිරීම |
| 14 | රජයේ ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 1 | වසර 01 | 80,000.00 | | දේශීය | ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම |
| 15 | ස්ථාවර වත්කම් ලේඛණය පවත්වා ගැනීම පිළිබඳ වැඩසටහන | 2 | දින 02 | 26,000.00 | | දේශීය | ස්ථාවර වත්කම් ලේඛණය සම්බන්ධයෙන් රාජකාරී කරනු ලබන නිලධාරීන්ගේ දැනුම හා අවබෝධය වැඩිදියුණු කිරීම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 16 | මනා කළමනාකරණයක් තුළින් ඵලදායී රාජ්‍ය සේවකයෙක් බිහිකිරීමේ පුහුණු වැඩසටහන (අදියර 01) | 61 | දින 02 | 663,240.00 | | දේශීය | සංවර්ධන නිලධාරීන්ගේ හා කළමනාකරණ සේවා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය, සාමූහිකත්වය හා කාර්ය සාධනය ඉහළ නැංවීම |
| 17 | මනා කළමනාකරණයක් තුළින් ඵලදායී රාජ්‍ය සේවකයෙක් බිහිකිරීමේ පුහුණු වැඩසටහන (අදියර 02) | 54 | දින 02 | 582,540.00 | | දේශීය | සංවර්ධන නිලධාරීන්ගේ හා කළමනාකරණ සේවා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය, සාමූහිකත්වය හා කාර්ය සාධනය ඉහළ නැංවීම |
| 18 | මූලික විමර්ශන පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | දින 01 | 13,000.00 | | දේශීය | මූලික විමර්ශන පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| 19 | දත්ත ආරක්ෂණය පිළිබඳ වැඩසටහන | 2 | දින 01 | 43,000.00 | | දේශීය | දත්ත ආරක්ෂණ නීතිය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| 20 | විද්‍යාත්මක හා පිරිමැසුම්දායී ආරක්ෂිත රිය පැදවීම පිළිබඳ රියදුරු පුහුණු වැඩසටහන | 9 | දින 01 | 54,000.00 | | දේශීය | රියදුරු සේවයේ කාර්ය මණ්ඩලයේ වෘත්තීය ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම |

## II 2025 සඳහා රජයේ වියදමින් විදේශීය පුහුණු ලබාදීම

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීව (ඇ.ඩො.) | විදේශීව (ඇ.ඩො.) | | |
| 1 | Inception and Expert Consultation Meeting: Developing Zero Carbon Strtegy for the Tea Sector | 1 | 23.04.2025-26.04.2025 | අනියම් දීමනා 100 | නැත | විදේශීය | තේ ක්ෂේත්‍රය සඳහා කාබන් ශුන්‍ය කිරීම පිළිබඳ උපාය මාර්ගයක් සංවර්ධන කිරීම. |
| 2 | Seminar on International Tea Trade and Industrialization for | 1 | 20.05.2025-12.06.2025 | අනියම් දීමනා 375 උණුසුම් ඇඳුම් 75 £ | නැත | විදේශීය | 'එක තීරයක් සහ මාවතක් රටවල් සඳහා ජාත්‍යාන්තර තේ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | "Belt and Road" Countries | | | | | | වෙළඳාම සහ කාර්මාන්තකරණය පිළිබඳ දැනුම. |
| 3 | Capacity Building Programme on Strategic Leadership and Governance II for the Civil Servants of Sri Lanka | 1 | 28.07.2025-08.08.2025 | අනියම් දීමනා 325 | | | උපායමාර්ගික නායකත්වය සහ පාලනය පිළිබඳ දැනුම. |
| 4 | Progress to Proficiency in English Interaction – IV India Technical and Economic Co-operation (ITEC) | 1 | 23.10.2025-03.12.2025 | අනියම් දීමනා - 375 $ | නැත | විදේශීය | ඉංග්‍රීසි ප්‍රවීණතාවය |
| 5 | 1st Notice of the 61st International Coconut Community (ICC) Session & Ministerial Meeting | | 18.11.2025-21.11.2025 | අනියම් දීමනා 240-$ | | | 61 වන ජාත්‍යාන්තර පොල් ප්‍රජා සැසිවාරයේ සහ අමාත්‍යාංශ රැස්වීමේ පළමු නිවේදනය |
| 7 | TA- 10558: Promoting Digital Technology for Sustainable, Inclusive, and Resilient Agriculture in Asia–Consultative Survey | 2 | 17.11.2025-22.11.2025 | අනියම් දීමනා 350 උණුසම් ඇඳුම් 140 £ | | | ආසියාවේ තිරසර කෘෂිකාර්මන්තය සඳහා ඩිජිටල් තාක්ෂණ ප්‍රවර්ධනය |

## 6.3.2 ප්‍රජා යටිතල පහසුකම් අංශය

අංක 01/2023 අයවැය චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සේවා ව්‍යවස්ථා, බඳවාගැනීම් පරිපාටි හා චක්‍රලේඛ විධිවිධාන පරිදි නිලධාරීන් අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු පුහුණු අවස්ථා පමණක් ලබාදිය යුතු බැවින්, අනෙකුත් පාඨමාලා තාවකාලිකව සම්පාදනය කිරීමට නොහැකි වී ඇත. ඒ අනුව මානව සම්පත් සංවර්ධනය උදෙසා පහත සඳහන් පරිදි ක්‍රියාකර ඇත.

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 01 | **"ආතති කළමනාකරණය"** (දැනුවත් කිරීමේ වැඩසටහනකි) | සියලුම මාණ්ඩලික නිලධාරීන් හා අනෙකුත් කාර්ය මණ්ඩලය | දින 01 | රු. 11,200/- | | දේශීය | කාර්ය මණ්ඩලයේ ආකල්ප වර්ධනය වීමෙන් ඵලදායි හා කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම. |

❖ මීට අමතරව නායකත්ව සහ ආකල්ප වර්ධන පුහුණු වැඩසටහන් 2025.11.29 දින කලටුවාව ප්‍රදේශයේ පිහිටි Serenity Village ආයතනයේදී පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කරන ලදී. එහෙත්, ඒ වන විට දිවයිනේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් එම පුහුණු වැඩසටහන කල්දැමීමට සිදුවිය. එහිදී, එම ආයතනය වෙත අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු. 113,880/- ක මුදල නැවත අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට කටයුතු කර ඇත.

# 07. පරිච්ඡේදය

## 7. අනුකූලතා වාර්තාව

### 7.1 වැව්ලි අංශය

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූලතා නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.6 | වෙනත් | - | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | පවත්වාගෙන යාම | | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ | - | - |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/1-2025 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | ඇතැම් විගණන වාර්තා සඳහා පිළිතුරු ලැබීමේදී මාස 03 කට ආසන්න | සෑම විගණන වාර්තාවක් සඳහාම මසක් ඇතුළත පිළිතුරු ලබාදෙන ලෙස |

| | | | | |
|---|---|---|---|---|
| | | | කාලයක් ගතවී ඇත. | අදාළ අංශ දැනුවත් කිරීම |
| 6.3 | 2019 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2025 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | - | - |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදුකිරීම | අනුකූල වේ | - | - |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | 2025 වර්ෂය සඳහා සකස්කර යවා ඇත. | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ. | 2025.07.08 දින ලංසු කැඳවා | |

| | | | | |
|---|---|---|---|---|
| | | | අපහරණය කර ඇත. | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | යාවත්කාලීන කර පවත්වාගෙන යාම | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ. | | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ. | වාහන 16ක ඉන්ධන පරීක්ෂා කිරීම සිදු කර ඇත. | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල නොවේ. | කල්බදු වාහන නැත. | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94(I) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | - | - |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූලවීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| **13** | **පොදු තැන්පතු ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ඉදිරිපත් කිරීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | - | - |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිරිපත් කිරීම. | | | |
| **18** | **පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | - | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | - | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම් 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල නොවේ. | වාර්ෂික කාර්ය සාධන වාර්තා අනුව ඇගයීම් සිදු කරනු ලැබේ | |
| 19.4 | ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමට නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ.<br><br>ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත් කර ඇත. | - | - |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | - | - |

## 7.2 ප්‍රජා යටිතල පහසුකම් අංශය

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | 2025 වර්ෂය සඳහා යොමු කරන ලද සියලු විගණන විමසුම් සඳහා පිළිතුරු යොමු කර ඇත. නමුත් පිළිතුරු ලබාගැනීමේදී මතුවන ප්‍රායෝගික ගැටළු හේතුවෙන් නියමිත දිනට යොමු කිරීමට නොහැකි විය. | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | යොමුකරන ලද විමසුම් 7න් 01ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇත. කඩිනමින් අදාල | |

| | | | | |
|---|---|---|---|---|
| | | | පිළිතුරු ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල නොවේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූ.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | ගර්හිත වාහන නොමැත | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | එවැනි ගිණුම් නොමැත | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | එවැනි ඇතැම් ශේෂ හඳුනාගැනීමේදී මතුවන ගැටළු හේතුවෙන් මාසයක කාලයක් තුළ නිරවුල් කිරීමට නොහැකි වී ඇත. | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | සේවය අත ඇර ගිය නිලධාරීන්ගේ හිඟ හිටි ණයශේෂ පැවතීම. | |

| | | | | |
|---|---|---|---|---|
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | සලසා තිබීම | | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල **වේ** | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2018 හා 05/2018(I) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ප්‍රජා යටිතල පහසුකම් විෂය පථයට අදාළ දැක්ම හා මෙහෙවර අනුව පුරවැසි ප්‍රඥප්තිය සකස් කරමින් පවතී. |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල **වේ** | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල **වේ** | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල **වේ** | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල **වේ** | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල **වේ** | | |

# ඇමුණුම
# இணைப்பு
# Annexure

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඒල්/ඊ/එම්පීසීඅයි/02/25/10 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2026 මැයි 26 දින

26 MAY 2026

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

**ශීර්ෂය 135 - වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 135 - වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2025 අංක 19 දරන ජාතික විගණන සංශෝධන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම්අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්කර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අත්තිකාරම් ගෙවීම්

(අ) වැඩ තහනම් කර ඇති නිලධාරීන් 04 දෙනෙකුගෙන් වසර 07ත් 23ත් අතර කාලයක සිට අයවිය යුතු එකතුව රු.487,603 ක ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනකුගෙන් අයවිය යුතු රු. 251,284 ක් මාස 02ත් මාස 03ත් දක්වා කාලයක් ගතවී තිබුණද, අයකරගෙන නොතිබුණි.

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

වැව්ලි අංශය විසින් භාවිතා කරනු ලබන හා ස්ථාවර වත්කම් ලේඛණයේ (cigas) ඇතුළත් රු. 75,375,000ක වාහන 12 ක්ද ප්‍රජා යටිතල පහසුකම් අංශය භාවිතා කරනු ලබන එක් වාහනයකද එම වාහනවල අයිතිය පවරා ගැනීමකින් තොරව ගිණුම්ගත කර තිබුණි.

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මු. රෙ. 1645(අ) හි නියම කර පරිදි ක්‍රමවත් හා විධිමත් ලෙස සම්පූර්ණ කර වාහන ලොග් සටහන් පොත් පවත්වාගෙන යා යුතු වුවත් වැව්ලි අංශය වාහනවලට අදාළ ලොග් සටහන් පොත් නිසි ආකාරයට පවත්වා නොතිබුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,
වැව්ලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ඉකුත් වර්ෂයේ ගිණුම් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගිණුම් සමඟ ඒකාබද්ධ කර සකස් කර ඇති බව ගිණුම් සටහන් 09 මගින් අනාවරණය කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ආදායම් කළමනාකරණය

(අ) 1992 වර්ෂයේදී රජයට අයත් එකතුව හෙක්ටයාර් 210,140.5 ක් වූ ඉඩම් ප්‍රාදේශීය වැව්ලි සමාගම් 20 ක් වෙත අවුරුදු 53 ක කාලයක් සඳහා බදු කුලී පදනම මත පවරා දී තිබුණු අතර ඉන් වටවල වැව්ලි සමාගම 2023 වර්ෂයේ සිට වටවල සහ හැටන් ලෙස වැව්ලි සමාගම් දෙකක් ලෙස කටයුතු කිරීමට ගිවිසුම් ගත වී තිබුණි. ඒ අනුව මෙම සමාගම් 21 අතුරින් සමාගම් 07 කින් රජයට අයවිය යුතු රු. 665,849,418 ක හිඟහිටි බදු ආදායම මු.රෙ176(2) හා (3) ප්‍රකාරව අප්‍රමාදව එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2025 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි බදු කුලියෙන් සියයට 59 ක් එනම් රු.393,515,997ක් කුරුණෑගල වැව්ලි සමාගමෙන් අයවිය යුතු කුලිය වන අතර, එයින්, සියයට 26 ක් එනම් රු. 103,294,255 ක් වසර 05 කට වැඩි කාලයක සිටද සියයට 26 ක් එනම් රු. 102,803,725 ක් වසර 10 කට වැඩි කාලයක සිට හිඟ හිටිව පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 2025 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි උප බදු කුලී ආදායම 61,326,303ක් විය.

## 3.2 වියදම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කලයුතු බව දක්වා ඇති අතර, එම ඇස්තමේන්තු පදනම් කරගත් වාර්ෂික ක්‍රියාකාරී සැලසුමකට අනුව නිසි වැඩපිළිවෙලක් යටතේ වියදම් කළ යුතු වුවත් වාර්ෂික ඇස්තමේන්තු සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය .

(ආ) වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තු මගින් හා මු.රෙ. 66 මගින් වෙනස් කර ගෙන තිබුණි. වැය විෂයයන් නවයක් සඳහා රු. 191,300,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර මෙම වැය විෂයයන් නවය සඳහා රු. 122,037,226 ක අමතර ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. මෙම අමතර ප්‍රතිපාදන අගය මූලික ප්‍රතිපාදන මෙන් සියයට 25 ත් සියයට 349 ත් අතර පරාසයක පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 04ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 4,500,000 ක ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබූ අතර තවත් පුනරාවර්තන වැය විෂයයන් 28 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.180,350,000ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.98,472,695ක් හෙවත් සියයට 36ත් සියයට 98ත් දක්වා සැළකිය යුතු ප්‍රමාණයකින් ඉතිරි වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයන් 05ක් සඳහා සලස තිබුණු එකතුව රු. 1,049,264,067 ක ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබූ අතර තවත් ප්‍රාග්ධන වැය විෂයයන් 21 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 2,872,500,000ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු. 1,721,419,784ක් හෙවත් සියයට 39 ත් සියයට 99ත් දක්වා සැළකිය යුතු ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 03 ක් සඳහා මු.රෙ.66 යටතේ මාරුකර තිබුණු එකතුව රු. 1,337,350,000 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.816,482,496 ක් උපයෝජනය කර නොතිබුණි. එය එම කාර්යයන් සඳහා මු.රෙ. 66 යටතේ මාරුකර තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 61 කි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයය 135-2-19-7-2202-0/11 සඳහා සලසා තිබුණු රු.112,087,792 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් රු 29,993,973 ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. එය එම කාර්යයන් සඳහා සළසා තිබුණු පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් සියයට 26 කි.

3.3 වියදම් අධිවැය

Sell – X Computer Pvt Ltd ආයතනයෙන් රු.760,816 කට මිලදීගෙන තිබුණු ලැප්ටොප් පරිගණක 01ක් 135-1-2-2102 වැය විෂය යටතේද එම ආයතනයෙන් රු.1,368,375 කට මිලදීගෙන තිබුණු ලැප්ටොප් පරිගණක 02ක් හා Desktop 02ක්,135-1-2-2103 වැය විෂයන් දෙකක් යටතේ ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂය වෙනුවෙන්135- 1-2- 2102 වැය විෂයට ලැබී තිබුණු ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු.මිලියන 2 වුයෙන් 135-1-2-2103 වැය විෂය යටතේ ගිණුම්ගත කළ මෙම රු.1,368,375ක මුදල135- 1-2- 2102 වැය විෂය යටතේ ගිණුම්ගත කළහොත් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ඉක්මවා රු. 509,914ක් වැය විය හැකි බව නිරීක්ෂණය විය.

3.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

රු. 28,089 ක බැරකම් 2025 මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම 03හි බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ, II වන පරිච්ඡේදයේ 11 වන වගන්තියේ 11.2.3 උප වගන්තිය | පරිවාස කාලයේ සිටින නිලධාරියෙකුගේ පරිවාස කාලය අවසන් වීමේදී ඔහු හෝ ඇය සේවයෙහි ස්ථිර කිරීමට හෝ ඔහුගේ / ඇයගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පරිවාස පත්වීම අවසන් කිරීමට හෝ ආයතනයේ ප්‍රධානියා වග බලා ගත යුතු වුවත් නිලධාරීන් 159ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මු.රෙ 139(3) | ගෙවීම් කිරිමේදී විශේෂයෙන් සලකා බලා සම්පූර්ණ කල යුතු කරුණු ඇතොත් ඒවා ද නිසි සැලකිල්ලටගෙන සම්පූර්ණ කල යුතු වුවද 2025 වර්ෂය තුළ ගෙවීම් අවස්ථා 11 කදී පරික්ෂා කිරිම් නොකල වවුචර් සඳහා රු. 51,479,702 ක් ගෙවා තිබුණි. |
| (ii) | මු.රෙ. 139(4) | වවුචර්වලට මුදල් ගෙවීමේදී විධිමත් කුවිතාන්සියක් ලබා නොගෙන මුදල් භාරගත් බවට අත්සන නොයොදා 2025 වර්ෂය තුළ ගෙවීම් අවස්ථා 44 කදී රු. 5,849,110 ක් ගෙවා තිබුණි. |
| (iii) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත 371(2)( ආ) ප්‍රකාරව | තත්කාර්ය අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යයන් අවසන් වූ වහාම පියවිය යුතු වුවද, අමාත්‍යාංශයේ වැවිලි අංශය විසින් 2025 වර්ෂයේදී ලබා දී තිබුණු එකතුව රු.604,895 ක් වටිනා තත්කාර්යය අතුරු අග්‍රිම 28 ක් පියවීම සඳහා දින 04 ත් , දින 24 ත් අතර කාලයක් ප්‍රමාද කර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති කාර්ය පටිපාටික රීති අංක 1589/30 දරන ගැසට් පත්‍රයේ 193 වගන්තිය ප්‍රකාරව | සෑම රජයේ නිළධාරියෙක්ම ස්ථාන මාරු කිරීම් වලට යටත් වන්නේය. එසේ වුවත් වැවිලි අංශයේ නිළධාරීන් 305 ක් ස්ථාන මාරුවීම් නොලබා අවුරුදු 05 ත් අවුරුදු 25 ත් අතර කාලයක් හා ප්‍රජා යටිතල පහසුකම් අංශයේ කාර්ය මණ්ඩලයේ 21 දෙනෙකු ස්ථාන මාරුවීම් නොලබා අවුරුදු 07 ත් අවුරුදු 11 ත් අතර කාලයක් සේවයේ යොදවාගෙන තිබුණි. |
| (ඈ) | 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2010/29 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති 87 හා 89 | 87 වන වගන්තියෙන් සඳහන් පරිදි බඳවා ගැනීම ලිඛිත විභාගයක සහ/හෝ ලකුණු ලබා දෙනු ලබන සම්මුඛ පරීක්ෂණයක සහ/ හෝ ලකුණු ලබා දෙනු ලබන වෙනත් පරීක්ෂණයක ප්‍රතිඵල මත පමණක් සිදු කරන්නේ නම් 89 වන වගන්තියෙහි සඳහන් පරිදි තෝරා ගැනීමෙන් පසුව මෙම |

| | | |
|---|---|---|
| | | කාර්ය පටිපාටික රීතිවලට අයත් 03 හෝ 04 පරිශිෂ්ටය ප්‍රකාරව විධිමත් පත්වීමේ ලිපියක් හැකිතාක් ඉක්මනින් නිකුත් කිරීමට පත්කිරීමේ බලධාරියා ක්‍රියා කළ යුතු වුවත් 2023 සහ 2024 වර්ෂවල වැවිලි අමාත්‍යාංශයේ ලේකම් විසින් තාවකාලික පත්වීම් ලබා දී බඳවාගත් බහුකාර්ය සංවර්ධන කාර්ය සහයක නිලධාරීන් 04 දෙනෙකුට පමණක් විධිමත් පත්වීම් ලිපි ප්‍රදානය කර ඇතත් ඉතිරි නිලධාරීන්ට විධිමත් පත්වීම් ලිපි ප්‍රදානය කර නොතිබුණි. |
| (ඉ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ DMA/SYS.AUD/check list/01 හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2020 අනුව | වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම් පිළිබඳව පැරණි තොරතුරු සොයා යාමේදී රාජ්‍ය නිලධරයන්ට මුහුණදීමට සිදුවී ඇති ගැටළු අවම කිරීම සඳහා වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමි පත්වීම් දරන සෑම නිලධාරියෙකුගේම පෞද්ගලික ලිපිගොනු වලට 2020.01.01 දින සිට වාර්ෂිකව එම දායක මුදල් අය වී ඇති බවට තොරතුරු ඇතුළත් කිරීම හා ඒ පරිදි වාර්ෂිකව පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වුවත් නමුත් වැවිලි අංශයේ නිලධාරි 12 කගේ පෞද්ගලික ලිපිගොනු සඳහා මෙතෙක් ඊට අනුගතව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. |
| (ඊ) | 2024 දෙසැම්බර් 18 දිනැති අංක 05/2024 දරන චක්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 04 වන ඡේදය | රජයේ ආදායම අහිමි වීම වැළැක්වීම පිනිස ධාවන තත්ත්වයේ නොපවතින වාහන අපහරණය කළ යුතු වුවත්, වැවිලි අංශය අයත් භාවිතා කළ නොහැකි යැයි හඳුනාගෙන තිබූ රු. 240,000ක් වටිනා වාහන 02ක් හා ප්‍රජා යටිතල පහසුකම් අංශය සතු වාහන 05 ක් මේ වන විටත් අපහරණය කර නොතිබුණි. |

### 3.6 තැන්පතු

මු.රෙ 571 ප්‍රකාරව වර්ෂ දෙකක් ඉකුත් වූ රු. 13,791,621ක තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් ප්‍රජා යටිතල පහසුකම් අංශයේ තැන්පත් සම්බන්ධයන් එසේ කටයුතුකර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

1992 වර්ෂයේදී රජයට අයත් ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබාදීමේදී එකතුව හෙක්ටයාර් 19,792.23 ක් ආගරපතන, උඩුපුස්සැල්ලාව හා ඇල්කඩුව වැවිලි සමාගම් වෙත බදු කුලී රහිතව ලබා පසුගිය වසර 05ක කාලය තුළ එක් එක් වර්ෂවල වගා කර ඇති බිම් ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවේදී ලබා දී ඇති ඉඩම් ප්‍රමාණයෙන් පිළිවෙලින් සියයට 55, 59 හා 64 ක ප්‍රමාණයක් පමණක් වගා කර තිබුණි. අදාල සමාගම් 03 වසර 32ක කාලයක් බදු කුලී රහිත පදනමක් මත ඉඩම් උපයෝජනය සිදු කිරීම මෙන්ම 2015 සිට 2025 වර්ෂය දක්වා වෙනත් සමාගම්වලට ඉඩම් උප බදුදීම් කර තිබුණි. මෙම ඉඩම් පවත්වාගෙනයාම සම්බන්ධයෙන් අදාල බදු සමාගම් සතුව පවත්නා හැකියාව හා ධාරිතාවය පිළිබඳව නැවත සමාලෝචනයක් සිදුකර වෙනත් සමාගම් සඳහා එම ඉඩම් බදු දීමේ හැකියාව සොයාබලා නොතිබුණි.

### 4.2 වත්කම් කළමනාකරණය

(අ) වැවිලි අංශයෙන් පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත ලබා දී ඇති කැබ් රථ 04 ක් වසර 29කට ආසන්න කාලයක් ද කැබ් රථ 01 ක් වසර 25කට ආසන්න කාලයක් ද ප්‍රජා යටිතල පහසුකම් අංශය සතුව 01 ක් වාහනයක් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට 2022 ජූනි මස 15 දින ලබා දී තිබූ බව නිරීක්ෂණය වූ අතර එම වාහනය එම ආයතන වෙත පැවරීමක් කර නොතිබුණි. තවද ප්‍රජා යටිතල පහසුකම් අංශය සතු වාහන 02 ක් අමාත්‍යාංශය යටතේ වූ වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියට පිළිවෙලින් 2021 සහ 2024 වර්ෂයන් වලදී ද, පූනාගල නිවාස ව්‍යාපෘතිය සහ බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට එක් වාහනය බැගින් 2025 වර්ෂයේ දී ද තාවකාලිකව අනුයුක්ත කර තිබූ බව නිරීක්ෂණය විය. තවද හැටන් තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට අංක LC – 8512 දරණ වාහනය අනුයුක්ත කල දිනය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) CAB - 3288 දරන Toyota V8 රථය 2021 වර්ෂයේ සිදු වූ අනතුරක් හේතුවෙන් ධාවනයෙන් ඉවත් කර තිබූ අතර රු 16,000,000 ක වියදමක් දරා අලුත්වැඩියා කර ඇතත් 2025.10.02 දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවේ දී රථයේ අංක තහඩු සවිකර නොමැතිවීම,දොර අගුලු සවිනොකිරීම සහ පිටුපස බඟරය අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් තවදුරටත් ධාවනයට යොදාගත නොහැකිව වසර 5 කට ආසන්න කාලයක් ආයතනයේ රථ ගාල තුල ගාල්කර ඇති බව නිරීක්ෂණය විය.

### 4.3 පාඩු හා හානි

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රජා යටිතල පහසුකම් අංශයේ වාහන 4 ක පාඩු හා හානි වටිනාකම වූ රු.3,912,930 ක් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. මෙම වාහන 4 2018 සිට 2024 කාල සීමාව තුළ අනතුරු වලට භාජනය වීම තුළින් රු.5,188,611 ක අලාභ සිදුවී තිබූ අතර 2025 දෙසැම්බර් 31 දිනට තවදුරටත් වාහන 04 සඳහා එකතුව රු.3,912,930 ක අලාභ අය කර ගැනීමට අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභ හානි සිදු වී වර්ෂ 03 ත් වර්ෂ 14 ත් අතර කාලයක් ගත වී ඇති සිද්ධීන් 05 ක් සම්බන්ධයෙන් එකතුව රු. 10,628,417 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

### 4.4 කළමනාකරණ දුර්වලතා

(අ) අමාත්‍යාංශයේ වැව්ලි කළමනාකරණ අංශයේ තොරතුරු අනුව 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ආසන්න වසර පහක කාලයක් තුල වැවිලි සමාගම් 22කින් මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 401.74 ක් අනවසර ඉඩම් අත්කර ගැනීම් අවස්ථා 1,709ක් නිරීක්ෂණය වුවද ඒ තුල මතුරට, බලංගොඩ, නමුණුකුල, සහ අගලවත්ත යන වැවිලි සමාගම් වල අනවසර ඉඩම් අත්කර ගැනීම් 100 ඉක්මවා තිබුණු අතර හපුගස්තැන්න සහ කහවත්ත වැවිලි සමාගම් වල එම අගය 300 ඉක්මවා තිබුණි. එසේම වැවිලි සමාගම් 22ක් යටතේ පවතින නිල නිවාස අනවසරයෙන් අත්කර ගැනීම් 380 ක් වාර්තා වී ඇතත් ඉඩම් බදු ලබාගත් වතු කළමණාකාරිත්වයේ දුර්වලතා සහ අමාත්‍යාංශයේ දුර්වලතා හේතුවෙන් ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩල, තථ්‍ය කාර්ය මණ්ඩල

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට අනුමත සේවක සංඛ්‍යාව 828 ක් වූ අතර එයින් 118 ක් පුරප්පාඩුව පැවතුණි.

පී.කේ.එම්.පී.නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පී.කේ.එම්.පී. නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත :-

01. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

**Ministry of Plantation and Community Infrastructure**
**11th Floor, Sethsiripaya Stage II,**
**Baththaramulla.**